# බෞද්ධාලෝකය

QD/NEWS/21/2022

ISSN 2613-8743

18 වැනි කාණ්ඩය 5 වැනි කලාපය | ශ්‍රී බුද්ධ වර්ෂ 2565/66 බක් - වෙසක් (2022 අප්‍රේල් - මැයි) | සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ප්‍රකාශනයකි





බෙල්ලන්විල රජ මහා විහාරයේ සෝමබන්දු විද්‍යාපති චිත්‍ර ශිල්පියා විසින් අඳින බිතු සිතුවමකි.

# මහාචාර්ය ගුණපාල පී මලලසේකර මැතිඳුන්ගේ 49 වන ගුණානුස්මරණ වැඩසටහන

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය සහ මලලසේකර පදනම විසින් සංවිධානය කරනු ලැබූ බෞද්ධ මහා සම්මේලනයේ හිටපු කීර්තිමත්ම ගරු සභාපතිවරයෙකු සහ ලෝක බෞද්ධ මහා සම්මේලනයේ නිර්මාතෘ මහාචාර්ය ගුණපාල මලලසේකර මැතිතුමාගේ 49 වන ගුණානුස්මරණ වැඩසටහන අප්‍රේල් 23 දින බෞද්ධ මහා සම්මේලනයේදී පැවැත්විය. මෙහිදී මහාචාර්ය ගුණපාල මලලසේකර පිළිරුවට පුෂ්පෝපහාර දැක්වීමෙන් අනතුරුව ගුණ සමරු වැඩසටහන ආරම්භ වූ අතර පූජ්‍ය වෑතර මහින්ද ස්වාමීන් වහන්සේද, බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතාද, මහාචාර්ය ආරියපාල පෙරේරා මහතා විසින්ද ගුණසමරු දේශන පවත්වන ලදී.













# බෞද්ධාලෝකය

ශ්‍රී බුද්ධ වර්ෂ 2565/66 බක් - වෙසක් | 2022 අප්‍රේල් - මැයි


## ලිපි සරණිය


| | | |
|---|---|---|
| ■ **ධම්ම පදය - Dhamma Padaya** | - පාඨශාලාචාර්ය පණ්ඩිත, රන්ජිත් වනරතන මහතා ධම්මපද වනරත්න ව්‍යාඛ්‍යා පොත ඇසුරෙන් | 02 |
| ■ **බුදුදහමින් පෝෂිත ශ්‍රී ලාංකික සහෘත්වයේ ගති ලක්ෂණ කිහිපයක්** | - සාහිත්‍යශූරී, සම්මානිත මහාචාර්ය මාලනි ඇඳගම | 03 |
| ■ **Arising of Wisdom - Panna Udapadi** | - Das Miriyagalla | 12 |
| ■ **අවුරුද්දයි බුදු දහමයි** | - නාලක ජයසේන | 14 |
| ■ **බෝසත් උපත පුරාණය බෞද්ධ සාහිත්‍යයෙන්** | - බුදුන් වදාළ බුද්ධ චරිතය - පූජ්‍යපාද කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත ස්වාමින් වහන්සේ සහ කීර්ති නාරම්පනාව | 18 |
| ■ **අකුසලය විපාක දෙයි** | - ශාස්ත්‍රපති ලොකුබණ්ඩාර මුණසිංහ | 21 |
| ■ **සමනොළ සිරිපා කඳු පරිසරය** | - රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති දිසානායක හේරත් | 24 |
| ■ **සෝතාපත්ති - 2** | - පූජ්‍ය තලල්ලේ චන්දකිත්ති ස්ථවිරයන් වහන්සේ | 27 |
| ■ **සමචිත්ත පරියාය සූත්‍රය** | - ශාස්ත්‍රපති පූජ්‍ය නාගදීපේ විමලබුද්ධ හිමි | 35 |
| ■ **ආස්ථික සංඥාව** | - කායික රෝග විශේෂඥ වෛද්‍ය චම්පා ජයසුන්දර | 38 |
| ■ **තුන් දොර සංවර කර ගැනීම** | - සිරිසුමන ගොඩගේ | 41 |
| ■ **අන්තර් කාලීන පාලක මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුතු යයි ඉදිරිපත් කරන ලද යෝජනා මාලාව** | - ගරු සමලේකම්වරු සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය | 44 |



**කළමණාකරන උපදේශක මණ්ඩලය**
මහාචාර්ය මාලිනි ඇඳගම
මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ

**ප්‍රකාශනය**
ප්‍රචාරක කටයුතු පිළිබඳ ජාතික මණ්ඩලය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

**කවරයේ ඡායාරූප ලබාදීම**
මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ

**ඡායාරූප සැකසීම**
කාවින්ද දිල්ෂාන් විජේසිංහ

**පිටු සැලසුම**
ස්මාර්ට් ප්‍රින්ට්ස් සොලියුෂන් සෙන්ටර්

**මුද්‍රණය**
රජයේ මුද්‍රණාලය

**සංස්කරණ කලමනාකරණ**
වෛද්‍ය රාණි ප්‍රනාන්දු

**සංස්කාරක මණ්ඩලය**
ප්‍රවීණ ලේඛක චන්ද්‍රසිරි වැලිගමගේ
ශ්‍යාමි නුවන් ගනේවත්ත
නාලක ජයසේන

**චිත්‍රය**
සෝමබන්දු විද්‍යාපති චිත්‍ර ශිල්පියා විසින් සිතුවම් කරන ලද බෙල්ලන්විල රජ මහා විහාරයේ බිතු සිතුවමින් උපුටා ගන්නා ලදි.

**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
380, බෞද්ධාලෝක මාවත, කොළඹ - 07
දුරකථන : 011-2691695 / 011-2688517
ෆැක්ස් : 011-2688517 **web : www.acbc.lk**
විද්‍යුත් ලිපිනය : acbc380@gmail.com
buddhistinfo380@gmail.com

# ධම්ම පදය
## ජීවිතයට සම්බන්ධ කර ගනිමු

ධම්මපද වනරතන ව්‍යාඛ්‍යා පොත ඇසුරෙනි

**15. ඉධ සොචති පෙච්ච සොචති**
**පාපකාරී උභයත්ථ සොචති**
**සෝ සොචති සෝ විහඤ්ඤති**
**දිසවා කමම කිලිටඨ මතතනො**

පාපකාරී, පව්කම් කරන පුද්ගලතෙම මෙලොව ශෝක කරයි හෙතෙමේ තමාගේ කිලිටි කර්මය දැක ශෝක කරයි. හෙතෙම වෙසෙසින් නැසෙයි.

රජගහ නුවර වේළුවනාරාමය අසල චුන්ද නම් ඌරන් මරන්නෙක් විසීය. හේ ඌරන් මරා විකුණා මුදල් උපයාගෙන තම ජීවිකාව ගෙන ගියේය. මෙසේ පනස් පස් වසරක් ඌරන් මරමින් ජීවිකාව ගෙන ගිය ඔහු ළඟ විහාරයෙහි වැඩ වෙසෙන සර්වඥයන් වහන්සේට දන් දීම් ආදී කිසි පින්කමක් නොකොට කාළය ගත කළේය.

මේ අතර චුන්ද සූකරයාගේ ශරීරයෙහි බලවත් රෝගයක් හට ගැනිණ. මරණයට පෙරම අවිචි මහා නරකයෙහි ගින්නෙන් දැවි දැවී ඌරකු මෙන් හඬ හඬා දණින් ගෙයි ඔබ මොබ හැසිරෙයි. අවට ගෙවල්හි අයටද එය මහා කරදරයක් විය.

ඒ ගෙය අසලින් ගිය භික්ෂූහු බුදුන් වෙත ගොස් මෙසේ සැළ කළහ. ස්වාමීනි! චුන්ද සූකරිකයා ගෙයි දොර වසා ඌරන් මරන්ට පටන් ගෙන අදට දවස් හතකි. එහි යම්කිසි මංගල උත්සවයක් ඇතැයි සිතමු. මේ වගේ රළු පරුෂ මිනිසෙකු කිසිකළකත් අපි නො දුටුවෙමුයි කීහ.

මහණෙනි, සත්දිනක් තුළ හෙතෙම ඌරන් නොමැරූවේය. පනස්පස් වසරක් මුළුල්ලෙහි කළ දරුණු පාපකර්මයාගේ විපාක වශයෙන් එතෙක් දිනක් රළු වේදනාවෙන් වදයට පැමිණ, ඌරකු මෙන් හඬ හඬා සිට අද මැරී අවීචි මහා නරකයෙහි උපන්නේය.

"යම් ගිහියෙකු හෝ පැවිද්දෙකු හෝ පව්කම් කරමින් කාළය ගත කළහොත් හේ මෙලොවත් ශෝක කොට පරලොවද ශෝක ස්ථානයකම උපදී" යයි වදාළ සේක.

## The Evil-Doer Grieves in Both Worlds

***Idha socati pecca socati, pāpakārī ubhayattha socati;***

***so socati so vihaññati, disvā kammakiliṭṭham attano***

*"The evil-doer grieves here, he grieves hereafter; he grieves in both worlds. He laments and is afflicted, recollecting his own impure deeds".*


Once there lived a butcher by the name of Chunda, near the Veluwanaramaya in the city of Rajagaha. He slaughtered pigs and made his living as a pork butcher. For fifty five years he lived in this manner as a pork butcher, but never did he offer alms to Lord Buddha who lived in the Veluwana monastery nearby, or carry out a single meritorious deed during this time.

Eventually Chunda Sukara was afflicted by a serious ailment. He was in great pain and agony. Before he died he was grunting and squealing like the pigs that he slaughtered, moving about on his hands and knees within closed doors, being consumed by the fires of the Avici Niraya, even before death and was suffering for seven whole days.

There was none as cruel and as hard hearted as him.

The Buddha said, "Monks, he never slaughtered pigs during these seven days.

As a result of his evil and impure actions during the past fifty five years he suffered in this manner, in unbearable agony and pain, making loud noises like a pig, and today he was reborn in the Avici Niraya. Thus, the evil-doer will always suffer for the evil deeds done by him, he grieves in this birth as well as in the next."



# බුදු දහමින් පෝෂිත ශ්‍රී ලාංකික සභ්‍යත්වයේ විශේෂ ගති ලක්‍ෂණ කිහිපයක්...

සභ්‍යත්වය යනු සිය ජීවන රටාව හැඩ ගැසීමේදී මනුෂ්‍යයන් විසින් අනුගමනය කරනු ලබන ක්‍රියා දාමයේ ප්‍රතිඵල වශයෙන් දේශපාලන, සමාජ, ආර්ථික සංස්කෘතික ආදි ක්ෂේත්‍රවල ගොඩනැගෙන ගති ලක්‍ෂණවල එකමුතුවකි. ඕනෑම රටක දේශීය සභ්‍යත්වය හැඩ ගැසීමේ දී බලපානු ලබන ප්‍රධාන සාධක දෙක වනුයේ අදාළ රටේ හෙවත් දේශයේ පරිසරය සහ එහි ජනතාව විසින් අදහනු ලබන ආගම දහමයි.

පරිසරය වශයෙන් දේශීය භෞතික සම්පත් යනාදිය ගැනෙන අතර ආගම දහම වශයෙන් ජනතාවගේ ඇදහිලි, විශ්වාස ඇතුළත් වේ. ඒ අනුව සමසීතෝෂ්ණ දේශගුණයකින් යුක්ත ශ්‍රී ලංකාව ඇළ, දොළ, ගංගාවලින් ගලා බසින පිරිසිදු ජලධාරාව, සරුසාර පස, වනාන්තර, හිරු රැස් ආදි ස්වභාවික සම්පත් බහුලව ඇති අතර ජීවන රටාව ගොඩනගා ගැනීමේදී අවශ්‍ය කරන ඇඳුම්, පැළඳුම්, කෑම්, බීම්, ගේ, දොර, ආදි සියල්ල හැඩගැසී ඇත්තේ මෙම සම්පත්වලට සහ පරිසරයට ගැළපෙන ආකාරයටයි. ඒ අනුව සරල චාම් කපු ඇඳුම්, වාතාශ්‍රය නොමඳව සහ සීතෝෂ්ණ සමබරව රැකෙන පරිදි ඉදිකළ නිවාස, කළට වසින වැසි ජලයෙන් ප්‍රයෝජන ලබා ගැනීම සඳහා ඉදිකළ වැව් අමුණු, ඒවායින් පෝෂණය වූ ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයට පදනම්වූ ගොවිතැන් ක්‍රම යනාදිය මෙරට පරිසරයට උචිත ලෙස හැඩ ගැසුණ සභ්‍යත්වය හරහා වේ. ශ්‍රී ලංකාවේ අනන්‍යතාව හුවා දැක්වූ මෙම සභ්‍යත්වය වසර 2500 කටත් වැඩි කාළයක් තිස්සේ ක්‍රමයෙන් වර්ධනය වීම, හේතුකොට අඳුරේ සිටි යුරෝපා ජාතීන් කලඑළි බැස පෙරදිග රටවල් දෙස එබී බලද්දී සංවර්ධන මාවතේ ශ්‍රී ලාංකීක අප සිටියේ ඔවුන්ට වඩා ගව් ගණනක් ඉදිරියෙනි.

ආගම දහම වශයෙන් ගත්කළ ශ්‍රී ලාංකීය සභ්‍යත්වයේ පදනම වනුයේ බුදු දහමයි. ආගමික දර්ශනයක් පමණක් නොව ජීවන දර්ශනයක්ද වන එහි ඉගැන්වීම් ශ්‍රී ලාංකික සමාජයේ දේශපාලන, සමාජ, ආර්ථික සංස්කෘතික ආදි සියළු ක්ෂේත්‍ර හැඩ ගැසීමෙහිලා බලපා ඇත. ඒ අනුව ශ්‍රී ලාංකික සභ්‍යත්වය ප්‍රධාන වශයෙන් "වැවයි, දාගැබයි - ගමයි, පන්සලයි" සංකල්පය පදනම්කොට ගෙන ග්‍රාමීය කෘෂිකාර්මික ආර්ථික ක්‍රමයකින් පෝෂණය වී ඇත.

ජනතාව සරල, චාම් ජීවිත ගත කළ සමාජයේ අන්‍යෝන්‍ය සහජීවනය මූලික ලක්‍ෂණය වූ අතර ඔවුන් සතුව පැවැති සියුම් කලා රස වින්දනය චිත්‍ර, කැටයම්, මූර්ති ගෘහ නිර්මාණ ආදි සියළු ක්ෂේත්‍රවලින් පිළිබිඹු වේ. දසරාජ ධර්මය තම ප්‍රතිපත්තිය බවට පත්කොට ගත් රජවරුන් විසින් මෙහෙයවන ලද රාජාණ්ඩු ක්‍රමය මගින් එක්සේසත් රාජ්‍යය පාලනය කරනු ලැබීය.

බුදු දහමේ ඉගැන්වීම් පදනම් කොට ගත්තා පමණක් නොව අසල්වැසි ඉන්දියාවේ සභ්‍යත්වයේ විශ්වාසවලින්ද ආභාසය ලබා ඇති ශ්‍රී ලාංකික සභ්‍යත්වය විදහා දක්වන



ආසියාතික මුද්‍රාව මගින් එය කිතු දහම පදනම් කොට ගෙන හැදී වැඩුණ අපරදිග රටවල සභ්‍යත්වයට හාත්පසින් වෙනස් මුහුණුවරක් දරනු ලැබේ.

16 වැනි සියවසේ සිට වසර 450 ක් පමණ තිස්සේ අපරදිග අධිරාජ්‍යවාදීන්ගේ ආධිපත්‍යයට යටත් වී සිටීමත් ඊනියා නිදහස ලැබීමෙන් පසුව ගතවූ දශක හතකට වැඩි කාළයක් තිස්සේ ඔවුන්ගේ නව යටත්විජිතවාදි ග්‍රහණයට ගොදුරු වී සිටීමත් නිසා බුදු දහමින් පෝෂණය වෙමින් මෙරට පරිසරයට උචිත පරිදි හැඩ ගැසී තිබූ ශ්‍රී ලාංකික සභ්‍යත්වය විකෘති වී වර්තමානය වනවිට විනාශයේ ප්‍රපාතය කරා ඇදී යමින් පවතී. අධිරාජ්‍යවාදයේ දායාදයක් වූ බෙදුම්වාදී ත්‍රස්ත්‍රවාදයෙන් හෙම්බත්ව සිටි ශ්‍රී ලංකාව එම තත්ත්වය පරාජය කිරීමෙන් පසුව ජාතික සංවර්ධන ක්‍රියාවලියට අවතීර්ණ වී සිටින මේ අවධියේ එම අරමුණ සාක්ෂාත් කොට ගැනීමේ දී සහ උදාකර ගනු ලබන සංවර්ධනය වැඩි දියුණු කොට ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳ සමස්ත ජනතාව විසින්ම යථාවබෝධයක් ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ. එහිදී ඉතාම සාර්ථක ක්‍රියාමාර්ගය වනුයේ දේශයට උචිත ලෙස ඉතිහාසය පුරාම ගොඩනැගී තිබූ දේශීය සභ්‍යත්වය කාලෝචිත පරිදි හැඩගසා ගනිමින් ඉදිරියට ගෙන යාමයි. ලොව වෙනත් කිසිදු සභ්‍යත්වයක දැකිය නොහැකි උදාර ගති ලක්‍ෂණවලින් ශ්‍රී ලාංකීය සභ්‍යත්වය සමන්විත වි ඇත්තේ එය වසර 2500 ක් තිස්සේ බුදු දහමේ ඉගැන්වීම්වලින් පෝෂණය ලබා ඇති බැවිනි.

මහජන පරමාධිකාරි බලය, ප්‍රජාතන්ත්‍රවාදය නීතියේ ආධිපත්‍ය, ශූභ සාධන රාජ්‍ය සංකල්පය යනාදි මහා දාර්ශනික දේශපාලන මතවාදවල නිර්මාතෘවරු වන්නේ ප්ලේටෝ, ඇරිස්ටෝටල්, ජෝන් ලොක්, රූසෝ වැනි අපරදිග දාර්ශනිකයන් බව වර්තමානයේ අප හිස්මුදුනින් පිළිගන්නා අතර බාල පරම්පරාවට ද එලෙස උගන්වනු ලැබේ. එහෙත් සත්‍ය තත්ත්වය එය නොවන බවත් එම මහා දාර්ශනික මතවාද මුල්වරට ලොවට දේශනාකොට ඇත්තේ බුදුරජාණන් වහන්සේ බවත් ශ්‍රී ලාංකික සභ්‍යත්වයේ පදනම බවට පත් වී ඇත්තේ එම ඉගැන්වීම් බවත් ඉතිහාසය සහ බෞද්ධ ශිෂ්ටාචාරය හැදෑරීමේ දී පැහැදිලි වේ.

මහජනතාව ඔවුනොවුන් අතර ඇතිකොටගත් ගිවිසුමක ප්‍රතිඵල වශයෙන් දේශපාලන බල අධිකාරියේ ප්‍රභවය සිදු වූ බව පැහැදිලි කොට දේශපාලන ක්ෂේත්‍රයේ මහජන පරමාධිකාරි බලය පිළිබඳ න්‍යාය ප්‍රථම වරට ඉදිරිපත් කළ මහා දේශපාලන දාර්ශනිකයා බුදුරජාණන් වහන්සේ බව අග්ගඤ්ඤ  සූත්‍රයෙන් පැහැදිලි වේ. එපරිද්දෙන් ජනතාව

රජු හෙවත් පාලකයාට බලය පවරනු ලැබුවේ ජනතාවට සහ දේශයට ආරක්ෂාව සැලසීම සඳහා බව තවදුරටත් එම දේශනයෙන් පැහැදිලි කොට ඇත. අපරදිග රටවල සභ්‍යත්වය උපත ලැබීමටත් පෙර එනම් ක්‍රි.පූ. 6 වැනි සියවසේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කළ මෙම මතවාද ශ්‍රී ලාංකික සභ්‍යත්වයේ දේශපාලන රටාවේ පදනම විය.

දසරාජධර්මය සහ සප්ත අපරිහානි ධර්ම සිය දේශපාලන චින්තනය බවට පත්කොට ගත් ශ්‍රී ලාංකික ජනතාව පරම්පරාගතව ආරක්ෂාකොට පවත්වාගෙන එනු ලැබූ සම්ප්‍රදායන් සුරැකීමටත් තමාවෙත පැවරී ඇති යුතුකම් සහ වගකීම් නොපිරිහෙළා ඉටුකරමින් ජනතාවගේ අපේක්ෂාවන් සපුරාලීමටත් පොරොන්දු වූහ. එම පොරොන්දුව කඩ කළහොත් තමාගේ හිස හත්කඩකට පැළෙන බව තමා දන්නා බවද භික්ෂූන් වහන්සේලා, උපදේශකයන්, මැති ඇමතිවරුන් සහ ජනතාව ඉදිරියේ ප්‍රසිද්ධ ප්‍රකාශයක් කිරීම සාමාන්‍ය චාරිත්‍රය විය.

රට පාලනය කිරීමේදී රජවරුන් විසින් අනුගමනය කළා වූද බුදු දහමේ ඉගැන්වීම්වලින් පෝෂිතව වර්ධනය වූවා වූද එම පෙර සිරිත ශ්‍රී ලාංකික සභ්‍යත්වයේ කැපී පෙනෙන ලක්ෂණ වේ. නීතිගරුක බව, නීතියේ ආධිපත්‍ය සුරැකීම, යුතුකම් සහ වගකීම් ඉටුකිරීම, පරිසර හිතකාමී බව, සරල, චාම් ජීවිත ගත කිරීම, ශුභ සාධන රාජ්‍ය සංකල්පය, සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම, කාළ කළමනාකරණය, ශ්‍රම කළමනාකරණය, පාලන කටයුතුවලට ජනතාව සහභාගිකරවා ගැනීම යනාදිය ඒ අතර කැපී පෙනේ. ලැබී ඇති ඉඩකඩ ප්‍රමාණය අනුව මෙම ලක්ෂණවලින් කිහිපයක් පමණක් මෙහිදී සාකච්ඡා කෙරෙනු ඇත.

**නීතිගරුක බව**

වර්තමානයේ මෙන් එකළ ලිඛිත නීති රීති නොවිය. රාජ්‍ය උරුමය තීරණය කිරීමේ සිට ග්‍රාම පාලනය දක්වා දේශපාලන, සමාජ, ආර්ථික, ආදි සියළු ක්ෂේත්‍රවල නීති ලෙස ක්‍රියාත්මක වූයේ පෙර සිරිතයි. එහෙත් රජු ඇතළු සියළු දෙනා මෙම නීතියට ගරු කළ අතර ඒවා නිසි පරිදි අනුගමනය කළහ. ඔටුනු පළඳින උත්සවයේ දී පවා සිහිපත් කළ පරිදි රජු නීති ගරුක නොවුණහොත් ඔහුට එරෙහිව ජනතාව නැගී සිටින බව ඔහු හොඳින් දැන සිටි අතර ජනතාව නීතිගරුක නොවුයේ නම් පෙර සිරිත පරිදි දඬුවම් විඳීමට සිදුවන බව ජනතාව දැන සිටියහ. ශ්‍රී ලාංකික සභ්‍යත්වයේ මෙම නීති ගරුක බව භික්ෂූන් වහන්සේලා සඳහා බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ විනය පිටකයේ අන්තර්ගත ඉගැන්වීම්වල ආභාසයෙන් පුරුදු පුහුණු වූවක් බව නිසැකය.

බුදුන් වහන්සේ ජීවමානව සිටි අවධියේ ඉන්දියාවේ ක්‍රියාත්මක වු දරුණු රාජ දණ්ඩන හෙවත් දඬුවම් ක්‍රම 26 ක් ගැන සඳහන් වන අතර සමාජයේ පුද්ගලයන් වැරදි කිරීමෙන් වැළැක්වීම සඳහා මෙම දඬුවම් ක්‍රියාත්මක කළ බවද ප්‍රකට විය. එහෙත් එම දඬුවම් ක්‍රම බුදුන් වහන්සේගේ ප්‍රශංසාවට භාජනය නොවූ බව චක්කවත්ති සිහනාද සූත්‍රයේත්, කූට දන්ත සූත්‍රයේත් දැක්වේ.

රටේ අපරාධ සිඳලිය හැකිවන්නේ දඬුවම් මගින් පමණක් නොවන බවද වැරදි කිරීමට මිනිසුන් පොළඹවන ප්‍රධාන සාධකය දුප්පත්කම බවද පෙන්වාදුන් උන්වහන්සේ අපරාධ වැළැක්වීමට තිබෙන එකම මාර්ගය රටේ රැකී රක්ෂා සුලභ කොට සෑම පුද්ගලයෙකුටම ජීවනෝපායක් සලසාදීම බව





පෙන්වා දී ඇත. යම් කෙනෙක් ගොවිතැන් කිරීමට ඉදිරිපත් වන්නේ ද රජු ඔහුට ඉඩම්, ජලය සහ බීජ සැපයිය යුතු බවද වෙළෙඳාම පිණිස ඉදිරිපත්වන අයට අවශ්‍ය මූලධනය ලබා ගැනීමට පහසුකම් සැලසිය යුතු බවද රාජ්‍ය සේවයේ නියුතු අයට ආහාර, නිවාස සහ වැටුප් ලබාදිය යුතු බවද දීඝ නිකායේ කූට දන්ත සූත්‍රයේ දැක්වේ. මෙම ඉගැන්වීම් අනුව හැඩගැසුණු පැරණි දේශීය සභ්‍යත්වය තුළ රැකියා වියුක්තිය හෝ රාජ්‍ය සේවයේ නියුතු අයතුළ හොර මැරකම් සහ දූෂණ නොමැති වූ බවද පැහැදිලිය.

කෙසේ වුවද ඕනෑම සමාජයක මිනිසුන් විසින් අපරාධ සිදුකරනු ලැබීමට ඉඩකඩ ඇති බව පිළිගත් බුදුන් වහන්සේ එබඳු අවස්ථාවලදී ජනතාවට දඬුවම් දීමේ බලය පාලකයා සතුව ඇති බවද පිළිගත්හ. එහෙත් එසේ දඬුවම් පැමිණවීමේදී රජු ඉතා ප්‍රවේශමෙන් ක්‍රියා කළ යුතු බවද කිසියම් පුද්ගලයකු වරදකරු බව තමාට ඔප්පුවීමෙන් පසුව පමණක් දඬුවම් පැමිණවිය යුතු බවද එසේ නොමැතිව කරුණු නොවිමසා හෝ නියම වරදකරු නොවන අයෙකුට හෝ දඬුවම් පමුණුවන රජු විනාශයට පත්වන බවද උන්වහන්සේ පෙන්වා දී ඇත. එපරිද්දෙන් රටක නීතිගරුක බව රැක ගැනීමට අත්‍යවශ්‍ය පරිසරය ගොඩනගා ගැනීමට මග පෙන්වා දී ඇති බුදු දහම පදනම්කොට ගොඩ නැගුන ශ්‍රී ලාංකික සභ්‍යත්වය තුළ ලිඛිත නීති නොමැති තත්ත්වයක් යටතේ වුවද පෙර සිරිත රකිමින් පාලකයා මෙන්ම ජනතාවද නීතිගරුක වීම විශේෂ ලක්ෂණයක් විය.

නීති කඩකරන අය ඇල්ලීමට සහ උසාවිය ඉදිරියට පැමිණවීමට පොලිස් සේවයක් හෝ උසාවි හෝ එකලු නොතිබුණ නමුත් ගමේ ජ්‍යෙෂ්ඨයන්ගෙන් සමන්විත ගම්සභා මගින් ගමේ නීති කඩ කරන අයට එරෙහි නඩු විනිශ්චය කිරීම, සමාදාන කිරීම, දඬුවම් කිරීම, සිදු කෙරිණි. රජුගේ සිට ගම් ප්‍රධානීන් දක්වා සියළු තරාතිරමේ නිලධාරින් විනිශ්චයකරුවන්ද වූ අතර ඔවුන්ගේ බල ප්‍රදේශ තුළ නීතිය සහ සාමය ආරක්ෂා කිරීම සහ යුක්තිය විසඳාලීම එම නිලධාරින්ට භාර විය. ප්‍රධානීන් නීතිගරුක වූ බැවින් ඔවුන් ඉදිරියේ නීති කඩකිරීමට බිය වූ ජනතාවද නීතිග රුක වූහ. මේ රටේ උසාවි ඉදිරියට ගෙනගොස් නඩුහබ විසඳිය යුතු තරමට නීති කඩකිරීම් දක්නට ලැබෙන්නේ අපරදිග ජාතීන්ගේ ආභාසයෙන් පසුවය. එතෙක් රටේ රජු, ප්‍රධාන නායකයන්ද ජනතාවද නීතිගරුක වීමත් එමගින් සියළු පරිපාලන කටයුතු විධිමත්ව සහ නිත්‍යනුකූලව සිදුවීමක් ශ්‍රී ලාංකික සභ්‍යත්වයේ විශිෂ්ඨ ලක්ෂණ විය. වර්තමානයේ උදාකොට ගත යුතු ජාතික සංවර්ධනය සාර්ථක ලෙස ඉටුකර ගැනීම සඳහා දේශීය සභ්‍යත්වයේ මුල්බැස තිබු මෙම උදාර ගති ලක්ෂණයට යළි පණගන්වා එය ආදර්ශයට ගැනීම සහ එහි පිහිටා කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

**යුතුකම් සහ වගකීම් ඉටුකිරීම.**

සූත්‍ර පිටකයේ එන තොරතුරු අනුව බුදුන්වහන්සේ අනුදැන වදාළ පරිදි රජ කෙනෙකු (පාලකයකු) වෙත පැවරෙන වගකීම් සමුදාය මෙසේ කැටිකොට දැක්විය හැකිය.

1. ආර්ථික වශයෙන් රට සංවර්ධනය කිරීම
2. සමාජයීය වශයෙන් දුප්පත්කම නැති කිරීම.
3. දේශපාලන වශයෙන් රටේ සාමය සහ ස්ථාවරත්වය ඇති කිරීම.
4. රටවැසි ජනතාවගේ සදාචාරාත්මක සහ අධ්‍යාත්මික වර්ධනය ඇති කිරීම.

මෙම කරුණු අනුව බුදුන්වහන්සේ අනුදැන වදාළ ආණ්ඩු ක්‍රමය ශුභ සාධන රාජ්‍යයක් ගොඩනැගීම බවත් එහි වගකීම රජු හෙවත් පාලකයා වෙත පැවරෙන බවත් පැහැදිලිය. තවද මහා මංගල සූත්‍රය, සිඟාලෝවාද සූත්‍රය සහ පරාභව සූත්‍රයෙන් බුදුන් වහන්සේ පෙන්වා දී ඇත්තේ පාලකයන් මෙන්ම රටේ ජනතාව තම යුතුකම් සහ වගකීම් ඉටුකළ යුතු බව සහ ඒවා තම තමන්ගේද ඒවා කඩ කිරීමෙන් තමාද තම ජාතියද පරිහානියට පත්වන බවයි.

බුදු දහමේ මෙම ඉගැන්වීම්වලින් පෝෂිත ශ්‍රී ලංකාවේ පැරණි අවධියේ වර්තමානයේ මෙන් අයිතිවාසිකම් කඩ කිරීම් හෝ අයිතිවාසිකම් ඉල්ලා උද්ඝෝෂණ කිරීම් හෝ දක්නට නොතිබිණි. ඒ වෙනුවට තිබුණේ සියළු දෙනා විසින් තම යුතුකම් සහ වගකීම් ඉටු කිරීමයි. රටේ නායකයාට (රජුට) ප්‍රාදේශීය නායකයන්ට, ග්‍රාම නායකයන්ට මෙන්ම පවුලේ නායකයාටද වගකීම් සම්භාරයක් පැවරී තිබිණ. විශේෂයෙන් තම රට, දිසාව, ගම, පවුල ආරක්ෂා කිරීම ගොවිතැන් කටයුතුවලට අවශ්‍ය භූමිය, ජලය, බීජ සැපයීම, පවුල ප්‍රධානකොට ගත් සමාජය ගුණ ගරුක ලෙස පවත්වා ගැනීම යනාදිය රජු ප්‍රධාන මෙම ප්‍රාදේශීය සහ ග්‍රාම නායකයන් සතු වගකීම් විය. ඔවුන් ගේ වගකීම් ඉටුකිරීමට අවශ්‍ය සම්පත් සපයාදීම ජනතාවගේ යුතුකම විය. කළට, වේලාවට, නියමිත බදු ගෙවීම්, වැව් අමුණු ඇළවේලි, පාරවල්, පන්සල්, පාසල් ඉදිකිරීමට අවශ්‍ය ශ්‍රමය සපයාදීම නායකයන්ගේ ආගමික වැඩ කටයුතුවලට සහය දීම සහ ඒවාට සහභාගිවීම, දරුවන් විසින් තම දෙමව්පියන් වැඩිහිටියන් රැකබලා ගැනීම වැනි යුතුකම් රාශියක් ජනතාවට පැවරී තිබිණ. පාලක සහ පාලිත යන මෙම ද්වෙපාර්ශ්වයම තම වගකීම් සහ යුතුකම් හරියාකාරව ඉටුකිරීම මෙරට දේශීය සභ්‍යත්වයේ ශ්‍රේෂ්ඨත්වයට හේතු වූ කැපී පෙනෙන ලක්ෂණය විය. ජාතියේ ඉදිරි ගමනට එය මහඟු රුකුලක් විය. තම තමන්වෙත පැවරී ඇති යුතුකම් සහ වගකීම් ඉටු කිරීමෙන් සියලු දෙනාගේ අයිතිවාසිකම් නිරායාසයෙන් ආරක්ෂා වන බවත් අයිතිවාසිකම් දිනා ගැනීමට කිසිවෙකු හෝ උද්ඝෝෂණ කිරීම අවශ්‍ය නොවන බවත් අවබෝධ කොට ගෙන ඒ අනුව ක්‍රියා කිරීමෙන් ජාතික



අනන්‍යතාව ආරක්ෂා කොට ගෙන ජාතික සංවර්ධනය ද උදාකොට ගත හැකිවනු ඇත.

**පරිසර හිතකාමී බව**

බුදු දහමින් පෝෂිත ශ්‍රී ලංකාවේ දේශීය සභ්‍යත්වය තුළ රජු ප්‍රධාන සියළු ජනකොටස් අතර කැපී පෙනෙන ගුණාංග යක් වූයේ පරිසර හිතකාමී බවයි. "මහරජ මෙම මිහිතලය ඔබට මෙන්ම වනයේ සැරිසරණ සතා සිව්පාවුන්ටත් ගහන තලයේ සැරිසරණ පක්ෂීන්ටත් අයිතිය. ඔබ මේ මහ පොළවේ භාරකරුවා මිස අයිතිකාරයා නොවේ" යනුවෙන් මිහිඳු මහ රහතන් වහන්සේ බුදුන් වදාළ ධර්මය කැටිකොට දේවානම් පියතිස්ස රජුට දේශනා කිරීම සමග මෙරට නායකයෝ ඒ ධර්මය පිළිපැදීම නිසා පරිසර හිතකාමී වූහ.

පරිසරය යනු වනාන්තර සහ සතා සිව්පාවුන්, ගංගා ඇළ දොළ, ගස් වැල්, මල් යනාදිය බවද එය මිනිසා රුචි පරිදි පරිහරණය කිරීම සඳහා නිර්මාණය වී ඇති බවද වර්තමානයේ බොහෝ දෙනාගේ පිළිගැනීම වේ. එහෙත් එය එසේ නොවන බවද මිනිසා මෙම පරිසරයේ කොටසක් පමණක් බවද මිනිසාට ද ඇත්තේ සෙසු කොටස්වලට ඇති අයිතිය බඳු අයිතියක් පමණක් බවත් එම සෙසු කොටස් ආරක්ෂා කෙරෙමින් ඒවා සමග සහජීවනයෙන් ඒවායින් ලබාගත හැකි ප්‍රයෝජන ලබාගැනීමට මිනිසා බැඳී සිටින බවත් බුදුන් වහන්සේ අනුදැන වදාළ දහම වේ. අපේ මුතුන් මිත්තන් විසින් මෙම දහම අවබෝධ කොට ගෙන ඒ අනුව ජීවිත හැඩගසාගෙන තිබූ බව දේශීය සභ්‍යත්වයෙන් හෙළි කෙරෙන ප්‍රධාන ලක්ෂණයකි.

පරිසරය යනු මිනිසා, ගහකොළ, ඇළ දොළ, සතා සිව්පාවා ආදී අන්‍යෝන්‍ය සහජීවනයෙන් ජීවත්විය යුතු විවිධ කොටස් ඇතුළත් ඒකකයක් බව පිළිගැනීමට පැකිළෙන වර්තමාන සමාජයේ වැඩි දෙනා කිසිදු පැකිලීමකින් තොරව කැලෑ කැපීම, සතුන් සිව්පාවුන් මරා දැමීම, ඔවුන්ගේ අයිතිවාසිකම් නොසලකා මිනිස් ජනාවාස පිහිටුවීමෙන් අනතුරුව ඔවුන්ගෙන් හානි සිදුවෙන බව හුවා දක්වමින් ඔවුන් විනාශ කිරීම - අලි මිනිස් ගැටුමට මග පෑදීම වැනි පරිසර හිතකාමී නොවන ක්‍රියා මාර්ගවලට අවතීර්ණ වී ඇත. එහෙත් දේශීය සභ්‍යත්වයට අනුකූලව සිදු වූයේ ඊට හාත්පසින් වෙනස් ක්‍රියාමාර්ග අනුගමනය කිරීමය. එකළ ප්‍රධාන ජීවනෝපාය වූ ගොවිතැන් කටයුතුවලදී විවිධ උපක්‍රම සහ කෙටි ක්‍රම මගින් වගාවට හිංසාකාරී සතුන් පමණක් විනාශ කොට දමනු ලැබීය. ගොයමට හානිකරන වල් පැළෑටි විනාශ කිරීමට වර්තමානයේ වල් නාශක බෙහෙත් වර්ග ඉසින නමුත් එදා ගෙවිලියන් විසින් වල්පැල නෙළීමෙන් ගොයම ආරක්ෂාකොට ගැනීම අපූරු දර්ශනයක් විය. ගොවිතැන් කටයුතුවලදී අද අප භාවිත කරනු ලබන විවිධ රසායනික බෙහෙත් සහ පොහොර වර්ග නිසා වගාවට හිතකර සේවා සලසනු ලබන කෘමීන් පවා විනාශවීම් මෙන්ම පස නිසරුවීමද සිදුවේ.

වර්තමානයේ අප විසින් අනුගමනය කරනු ලබන මෙම ක්‍රියාදාමයන් ජාතික සංවර්ධනයට බාධාවක් මිස ප්‍රයෝජනවත් නොවන බව දැනටමත් ප්‍රත්‍යක්ෂ වී බොහෝ කල් ගත වී ඇත. පරිසරයේ එක් අංශයක් පමණක් නොව වනාන්තර, ඇළ දොළ, මෙන්ම සතා සිව්පාවුන් ද අවශ්‍ය බවත් ඔවුන්ටද මිනිසුන්ට මෙන්ම පැවැත්මක් අවශ්‍ය බවත් ඒවා විනාශ කිරීමට මිනිසුන්ට අයිතියක් නැති බවත් උගන්වා ඇති බුදු දහම අනුගමනය කළ පරිදි මුතුන් මිත්තන් ගොඩනැගූ සභ්‍යත්වය ආදර්ශයට ගෙන කාලෝචිත පරිදි පරිසරය සුරැකීමත් ජාතික සංවර්ධනය උදාකොට ගත යුතු බව වර්තමාන නායකයන් මෙන්ම මහජනතාව ද අවබෝධ කොට ගත යුතුව ඇත. දේශීයත්වය විනාශ කෙරෙන තැන ජාතික සංවර්ධනයක් උදා නොවන බව අමතක කළ යුතු නොවේ.

**සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම**

බුදුරජාණන් වහන්සේ බොහෝ අවස්ථාවලදී ප්‍රයෝජන ලබාගත හැකි සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීම පිළිබඳව භික්ෂූන් වහන්සේලා දැනුවත් කළ ආකාරය විනය පිටකයේ දැක්වේ. තමන් වහන්සේ විසින් ඇඳීමට පාවිච්චි කරනු ලබන සිවුර විවිධාකාරයෙන් ප්‍රයෝජනයට ගත හැකි බව භික්ෂූන් වහන්සේලාට පෙන්වා දී ඇත. භික්ෂූන් වහන්සේ කෙනෙකුට ඇඳීම සඳහා ලැබෙන සිවුර සෝදා පිරිසිදු කොට හැකිතරම් කාලයක් එය පාවිච්චි කළ යුතු බවද එසේ ඇඳීමට භාවිත කළ නොහැකි තත්ත්වයට පත් වූ පසුව එය ඇඳ ඇතිරිල්ලක් ලෙසද එම කාර්ය සඳහා වුවද යොදා ගත නොහැකි තත්ත්වයට පත් වූ පසුව එය කපා පා පිස්නා ලෙස සකසා ගත හැකි බවද අවසානයේ කුඩා කැබලි බවට පත්කොට මැටි සමග අනා බිත්ති මැටි ගැසීමට යොදාගත හැකි බව ද දක්වා ඇත.

බුදුන් වහන්සේගේ මෙම ඉගැන්වීම්වලින් ආභාසය ලැබූ මෙරට පැරැණ්නෝ රටේ ඇති සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම රජයේ ප්‍රගමනයට අතිශය වැදගත් බව අවබෝධකොට ගෙන සිටියහ. ඒ නිසා සම්පත් නාස්ති නොකොට ඒවායින් හැකිතරම් ප්‍රයෝජන ලබා ගැනීමට ක්‍රියාකිරීම රජවරුන් මෙන්ම පොදු මහජනතාව අතරද ප්‍රචලිතව පැවැති මෙරට සභ්‍යත්වයේ කැපී පෙනෙනස ලක්ෂණයක් විය.

"අහසින් වැටෙන දිය බිඳුවක් හෝ ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යාමට ඉඩ නොදිය යුතුය" යන ප්‍රකාශයෙන් මහ



පරාක්‍රමබාහු රජතුමා ඉදිරිපත් කළේ ලැබෙන සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම පිළිබඳ දර්ශනයයි. ශ්‍රී ලංකාවේ තිබුණ ප්‍රධාන සම්පත ජලය බව එදා පිළිගත් අතර රජුගේ ප්‍රධාන වගකීම වූයේ ජනතාවගේ ප්‍රයෝජනයට ගත හැකි පරිදි මෙම ජලය උපරිම මට්ටමින් කළමනාකරණය කොට ආරක්ෂා කර ගැනීමය.

වර්ෂාවෙන් ලැබෙන ජලය අවශ්‍ය කාලයේදී ප්‍රයෝජනයට ගැනීම සඳහා වැව් අමුණු බැඳ ආරක්ෂාකොට තබා ගැනීමට විධි විධාන යෙදීම ජාතික සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා අනුගමනය කළ ප්‍රධාන ක්‍රියාමාර්ගයක් විය. රජවරුන්, ප්‍රාදේශීය නායකයන් සහ ගම් ප්‍රධානීන් සිය බල ප්‍රදේශවල වැව් අමුණු ඉදිකොට නිසි කළට වේලාවට ජලය රැස්කොට වගාවට අවශ්‍ය අවස්ථාවලදී අවශ්‍ය තරම් ජලය නිකුත් කිරීමට විධි විධාන යොදා තිබුණේ ඒ අනුවය.

මේ ගසේ බොහෝ - පැණි දොඩම් තිබේ

පැහිල ඉදිල බිමට නැමිල - බරවෙලා අතු


මල්ලිටයි, මටයි ගෙඩි දෙකක් ඇති

වැඩිය කඩන නරක ළමයි එහෙම නොවේ අපි

මෙම කවියෙන්ද සනාථ කෙරෙන්නේ ලබාගත හැකි සම්පත් නාස්ති නොකොට උපරිම ප්‍රයෝජන ලබා ගැනීමේ දර්ශනය බාල, තරුණ, මහලු සියළු දෙනාට පුගුණ කොට තිබූ ආකාරයයි.

වර්තමානයේ අප පෙරදිගින් ඉගෙන ගත් නූතන තාක්ෂණයක් ලෙස වර්ණනා කරනු ලබන ආහාර කල් තබා ගැනීමේ තාක්ෂණය මෙරට සභ්‍යත්වයේ ප්‍රධාන ලක්ෂණය ලෙස මුල් බැස තිබිණි. කොස්, දෙල් වැනි ආහාර වර්ග විවිධ ක්‍රමවලට කල් තබාගැනීමට හැකි පරිදි සකසා ගනු ලැබිය. බත්ගස ලෙසද හඳුන්වනු ලබන කොස් ගසේ පලදාව ලැබෙන කාළයට ඉන් කිසිවක් අපතේ නොයවා පලදාව නැති කාළයේදී ප්‍රයෝජනයට ගැනීමට කල්තබාගත හැකි ක්‍රමවලට සකස්කොට සුරක්ෂිත කොට ගැනිණ. දෙල්, මඤ්ඤොක්කා, කරවිල, බටු, බිම්මල් ආදි විවිධ එළවළු වර්ග සහ අඹ, ඇඹරැල්ලා, ජම්බු, දිවුල්, කජු, දෙහි ආදි විවිධ පළතුරු වර්ගද බහුලව තිබෙන කාළයට අපතේ යාමට ඉඩ නොදී අච්චේ වේලා හෝ දෝසි, අච්චාරු, ලුණු දෙහි ආදි වශයෙන් සකසා හෝ සුරක්ෂිතව තබා ගත්හ.

මේ අනුව ආහාර කල්තබා ගැනීමේ තාක්ෂණය මෙරට සභ්‍යත්වයේ මුල් බැසගත් ලක්ෂණයක් වන අතර එය ලබා ගත හැකි සම්පත් අපතේ යාමට ඉඩ නොදී ඒවායින් උපරිම ප්‍රයෝජන ගැනීමේ අවශ්‍යතාව පිළිබඳව වූ බුදු වදනින් ආභාසය ලැබූ අපේ මුතුන් මිත්තෝ එම දහම පුගුණ කොට



ජාතික සංවර්ධනය උදාකොට ගත් ආකාරය හෙළි කරනු ලැබේ. එදා ඉන්දීය සාගරයේ මුතු ඇටය ලෙස බැබළුණ ශ්‍රී ලංකාව වර්තමානයේ ආසියාවේ ආශ්චර්ය බට පත් කිරීම අරමුණු කොට සිටින ජාතික සංවර්ධන ක්‍රියාදාමයේ දී මෙම ඉපැරණි තාක්ෂණය කාලෝචිත පරිදි වැඩි දියුණු කොට කල් තබාගත හැකි ආහාර වර්ග විශාල ප්‍රමාණයෙන් සකසා අපනයනය කිරීමෙන් ජාතික සංවර්ධනයට උරදීම සඳහා ආදායම් ඉපැයීමට දේශීය සභ්‍යත්වයේ පිටුබලය ලබාගත හැකි වනු ඇත.

**අරපිරිමැස්ම සහ ඉතිරි කිරීම**

බුදුන් වහන්සේගේ ඉගැන්වීම වූයේ හරිහම්බ කරනු ලබන දෙය කොටස් හතරකට බෙදා ඉන් එක් කොටසක් අනාගතයේ ලෙඩ දුක් ආපදා සහ වෙනත් අවශ්‍යතා සඳහා ඉතිරිකොට තැබිය යුතු බවයි. ඕනෑම පුද්ගලයකුගේ හෝ පවුලක හෝ රටක හෝ සංවර්ධනයට අරමුදල් සපයා ගැනීම සඳහා ආදායමෙන් කොටසක් ඉතිරිකොට ගැනීම අත්‍යවශ්‍ය වේ. අපේ දේශීය සභ්‍යත්වය තුළ ජනතාව ඒ සඳහා මනා පළපුරුද්දක් ලබා තිබිණි. වර්තමානයේ මෙන් පුළුල් බැංකු ක්‍රම නොතිබුණ නමුත් එකළ ගම් සභාව ග්‍රාමීය බැංකුවක් ලෙස ජනතාවට ඉතිරි කිරීමට ඉඩ ප්‍රස්තා සලසා තිබිය. ඊට අමතරව සීට්ටු දැමීම, මිටි හාල් එකතු කිරීම වැනි ක්‍රම යොදා ගනිමින් මුදල් හෝ භාණ්ඩ වශයෙන් හෝ ඉතිරි කිරීමේ පුරුද්ද ප්‍රචලිතව පැවතිණි.

ජාතිකාභිමානය පළුදුකොට ගැනීමටද හේතුවන පරිදි විදේශිකයනට ණය වීමට සිදුවී ඇත්තේ සංවර්ධන කටයුතු සඳහා ආයෝජනය කිරීමට අවශ්‍ය සම්පත් විදේශ ණය වශයෙන් ලබාගැනීම නිදහස් ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්තිය වන බැවිනි. එහෙත් අපේ පැරැණ්නෝ ණය ගැනීම ගැන දැන නොසිටියහ. සාමාන්‍ය ජීවිතය අන්‍යෝන්‍ය සහයෝගයෙන් ජීවත් වූ අතර සිය ආදායමෙන් කොටසක් ඉතිරි කිරීමෙන්ද භෞතික සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගනිමින්ද ගොඩ නගා ගෙන තිබූ අර පිරිමැස්ම පවුලේ මෙන්ම ජාතියේ ඉදිරි ගමනට මහත් පිටුබලයක් විය. අපරදිග ජාතීන් යටතේ දේශීය සභ්‍යත්වය විනාශ වෙද්දී මෙම පුරුදු යටපත් වීම සහ ආයෝජන සඳහා මහා පරිමාණ සම්පත් අවශ්‍ය වෙද්දී ඒ සඳහා විදේශීය ආයෝජකයන් වෙත බලාපොරොත්තු රැඳවීමට සිදුවිය.

කුමන ආකාරයේ දූෂණ කාර්යයකදී වුවද ජයග්‍රාහී මාවත වනුයේ අත්තකිලමතානුයෝගය හෝ කාමසුඛල්ලිකානු යෝගය නොව මධ්‍යම ප්‍රතිපදාව බව බුදුරජාණන්

වහන්සේ විසින් ප්‍රායෝගිකව පෙන්වා දීමෙන් ලෝකයට හෙළි කළ සනාථන ධර්මය වූයේ සරල චාම් දිවි පෙවෙත ජයග්‍රහණයේ මාවත බවය. මෙම දහමින් පෝෂිත දේශීය සභ්‍යත්වය අනුව රජවරුන් පවා බෙහෙවින් සරල, චාම් ජීවිත ගත කිරීමට පුරුදුව සිටියහ. රටවැසි සියළු දෙනාම දේශගුණයට ඔරොත්තු දෙන ඇඳුම් පැළඳුම් ද පරිසරයට උචිත ගෙවල් දොරවල් සහ ආහාර පානාදියද පුරුදුව සිටි බැවින් වර්තමානයේ මෙන් බහු භාණ්ඩ ජීවිතය වෙනුවෙන් වැය කිරීමට සිදු නොවීය.

ජාතික සංවර්ධනය සඳහා වැය කිරීමට සම්පත් අවශ්‍යනම් උපයන සම්පත් මෙන්ම ස්වභාවික සම්පත්ද අපතේ නොයවා ආරක්ෂා කොට ගත යුතුව ඇත. ඒ සඳහා අනවශ්‍ය වියදම්වලින් වැළකී ඉතිරි කිරීමට යොමු විය යුතුය. වර්තමානයේ අප පුරුදුව සිටින බහු භාණ්ඩ පරිහරණය කිරීමේ පුරුද්ද නිසා අපට කොතරම් වැටුප් ලැබුණත් කොතරම් හරි හම්බ කළත් ප්‍රමාණවත් නැත. දකින දකින දේ මිළදී ගෙන ගොඩ ගසා ගැනීමට පුරුදුව සිටින අපගේ ඕනෑම නිවසකට ගොඩ වැදී බැලුවහොත් කිසිම දිනක ප්‍රයෝජනයට නොගත් පිඟන් කෝප්ප, ඇඳුම් පැළඳුම් පමණක් නොව අතිශය මිළ අධික ගෘහ භාණ්ඩ පවා කොතරම් තිබේ දැයි බලාගත හැකිය. මේ රටට ඔරොත්තු නොදෙන විවිධ මාදිලියේ මිළ අධික වාහන මිළදී ගැනීම, සුවිසල් මන්දිර ඉදිකිරීම, දරුවන් පවා ලෙඩ රෝගවලට ගොදුරු කරනු ලබන විවිධ ආහාර වර්ගවලට පුරුදු කිරීම වැනි කාමසුඛල්ලික යයි කිව හැකි ජීවිත ගත කිරීමටත් අන්‍යයන් පරයා තම තමන් ඒ මගට යොමු වීමේ තරඟයක යෙදීමටත් බොහෝ දෙනා පුරුදුව සිටිති.


මේ සියළු අන්තවාදී පුරුදු අත්හැර සරල චාම් ජීවන ක්‍රමයකට ඇබ්බැහි විය යුතු වන්නේ සාමාන්‍ය ජනතාව පමණක් නොව ජාතික සංවර්ධන මෙහෙයුම් කළමනාකරණය කරනු ලබන මැති ඇමතිවරුන්, නිලධාරීන් සහ වෙනත් නායකයන් පවා සෙසු මහජනතාවට ආදර්ශයක් සපයමින් කාමසුඛල්ලිකානුයෝගී ජීවිත ගත කිරීම සඳහා ජාතික සම්පත් නාස්ති නොකොට දේශීය සභ්‍යත්වය හැඩ ගැසු බුදු වදන් අනුව මධ්‍යම ප්‍රතිපදාවේ පිහිටා සරල චාම් ජීවිතයකට පුරුදු විය යුතුය.

දේශීය සභ්‍යත්වයේ මෙම කැපී පෙනෙන අංග ලක්ෂණ පමණක් නොව දේශපාලන, සමාජ, ආර්ථික, සංස්කෘතීන් ආදි සියළු ක්ෂේත්‍රවල පැරණි සම්ප්‍රදායන් හා වෙලී පවතින විශේෂ ලක්ෂණ සියල්ල බුදු දහමේ ඉගැන්වීම්වලින් පෝෂිතව දේශයට උචිත පරිදි හැඩ ගැසී ඇත. ඒ අනුව ශ්‍රී ලාංකික දේශීය සභ්‍යත්වය සහ බුදු දහමේ ඉගැන්වීම් ගසට පොත්ත මෙන් එකට වෙලී පවතින බැවින් බුද දහමේ ආභාසයෙන් තොර සභ්‍යත්වයක් මෙරටට උචිත නොවන බව ඉතා පැහැදිලිය. කිසියම් රටක කිසියම් සභ්‍යත්වයක් කොතරම් දියුණු බව පෙන්නුම් කරන්නේ වුවද එය එලෙසින්ම වෙනත් රටක රෝපණය කළ නොහැකිය. ඒ මන්දැයි කිවහොත් එය වර්ධනය වූ රටේ පරිසරයට සහ එහි ජනතාවගේ ඕනෑ එපාකම් අනුව හැඩගැසී වර්ධනය වී ඇති බැවින් වෙනත් රටකට ගෙනගියහොත් එය එම රටට ආගන්තුක වන බැවිනි.

බුදු දහමින් පෝෂිතව හැඩ ගැසුණ දේශීය සභ්‍යත්වය විසින් මෙහෙයවන ලද ශ්‍රී ලංකාව විදේශිකයන්ගේ ග්‍රහණයට හසුවීමත් සමග ඔවුන්ගේ සභ්‍යත්වය මෙරට පැළ පැදියම් කිරීමට ඔවුහු මහත් වෙහෙසක් දැරූහ. එහෙත් වසර 2560 ක් පමණ තිස්සේ බුදු දහමේ ඉගැන්වීම් ආශ්‍රයෙන් හැදී වැඩුණ සභ්‍යත්වය වෙනුවට ඊට හාත්පසින් වෙනස් කිතු දහමින් පෝෂිත යුරෝපීය සභ්‍යත්වය මෙරට රෝපණය කිරීමට අසමත්වීම පුදුමයට කරුණක් නොවේ. කෙසේ වුවද වසර 500 කට ආසන්න කාළයක් තිස්සේ අපරදිග සභ්‍යත්වය සමග ගැටුන ශ්‍රී ලාංකීය සභ්‍යත්වය බෙහෙවින් විකෘති තත්ත්වයට පත් වීම පිළිබඳවද පුදුම විය යුතු නැත.

නිදහස ලැබීමෙන් පසුව ජයග්‍රාහී මාවතකට අවතීර්ණ වීමට බලාපොරොත්තු වූයේ නම් අප යළිත් දේශීය සභ්‍යත්වය වැළඳගත යුතුව තිබිණි. එහෙත් පසුගිය දශක හතක් තිස්සේ අපරදිග ජාතීන්ගේ නව යටත්විජිතවාදී ග්‍රහණයට හසුවී බෙදුම්වාදි සාපයේ ගැලී සිටි අපට දේශීයත්වය යළි පණගැන්වීම අසීරු විය. එසේ වුවද වර්තමානයේ ත්‍රස්ත්‍රවාදය පරාජය කොට නව යටත්විජිතවාදි බාධක හොඳින් හඳුනාගෙන සිටින අපට දේශීය සභ්‍යත්වයට අනුකූලව සංවර්ධන මග මෙහෙයවීම අසීරු නොවනු ඇත. ශ්‍රී ලංකාවේ සභ්‍යත්වයේ පදනම සැකසී ඇත්තේ බුදු දහමේ ඉගැන්වීම් අනුව බව අවබෝධ කොට ගැනීමෙන්ද බුදු දහම පෝෂණය කොට වැඩි දියුණු කිරීමෙන්ද එයින් ආදර්ශ ලබා ගනිමින් ද දේශීය සභ්‍යත්වයේ ගති ලක්ෂණ යළි පණගන්වමින්ද ජාතික සංවර්ධනය මෙහෙයවීමෙන් නිදහස් ශ්‍රී ලංකාවේ නියත ජය මාවත විවෘත කොට ගත හැකිවනු ඇත.

**සාහිත්‍යශූරී, සම්මානිත මහාචාර්ය**
**මාලනී ඇඳගම**



# Arising of Wisdom – Panna Udapadi

*By Das Miriyagalla*

It was 2611 years ago, on the Wesak Full Moon Poya day that Prince Siddhartha who was deeply engrossed in searching for the True nature of Human Existence, crossed the river Neranjana and sat under the Bodhi Tree with a strong determination of achieving his goal. Finally, in His own words the achievement of the realization of the goal, as per Dhamma Chakka Pavattana Sutta, was:-

***"Vision arose, illumination arose, intellect arose, knowledge arose, and WISDOM arose".***

To quote from Dhammapada:-

> *"Many a birth have I wandered in this round of lives and deaths vainly seeking the builder of this dwelling. Oh, house builder you are seen. Never again you will build the house. Your ridge-pole is destroyed. The mind is dissolved and the extinction of desire has been achieved*."

Here, we refer to the most profound event in the history of mankind as the "Enlightenment of the Thathagata Gautama Buddha" who achieved perfection in wisdom and compassion. What was achieved through His wisdom was to be conveyed through compassion towards the rest of mankind. In the above quotation The Buddha refers to craving ( *Thanha)* as the house- builder , re-birth*( Bhava*) as the house and delusion ( *Avijja)* as the ridge-pole.

The above quotation given from Dhammapada is a part of the first ***'Udana Vakya'*** or spontaneous 'utterance of rapture' made by The Buddha himself which contains deeper meanings to the realization of the true nature of existence. Starting with '*Aneka jati samsaram* ….' meaning 'I travelled through an innumerable number of lives …' He refers to '*Visankhara gatan cittam*…' to mean 'all mental formations were removed from the mind ……' and finally '*Tanhanan khaya majjhagati*.' To mean 'all craving was eliminated'.

The methodology of mental development practiced during that momentous night was so analytical and

scientific that the resulting Cause and Effect process became known as the **"Doctrine of Dependent Origination" *or Paticca samuppada.***

There are twelve (12) factors which cause the unending cycle of births and deaths, known as Samsara and are listed here. Each of the factors beginning with Delusion (*Avijja)* become the cause for the next factor until the last factor Aging & Death( *Jara marana*). These 12 factors not only show how human beings are caught up in the cycle of Samsara but also, **more importantly, how human beings can make serious efforts to get liberated from the cycle of births and deaths, the Samsara.**

Delusion(*Avijja)* →Mental formations(*Sankhara*)→Consciousness(*Vinnana*)→

Name & form (*Namarupa*)→Six senses(*Salayatana)*→Contact(*Phassa)* →

Feelings(*Vedana*)→Craving(*Tanha*) →Clinging(*Upadana*)→

Becoming *( Bhava*)→Rebirth*( Jati*)→Aging & death( *Jara marana*)

The most decisive and crucial ingredients of this doctrine which form some of the fundamental principles in Buddhism are considered appropriate for discussion here.

Delusion, also referred to as ignorance *(Avijja),* is really a misbelief in a non-existent personality, which results in causing mental formations *( Sankhara*). They include volitional activities, mental concepts of a false and unreal nature with no substance or essence, as well as all things that are made for living a life in this world. The doctrine emphasizes the delusion of a personality as a serious misconception. Mental formations are like a mirage of unreal nature and have only a superficial validity. But they can cause consciousness capable of cognition or the act of knowing. A practitioner who realizes the absence of a personality, the futility of using mental formations and the obstacle caused by delusion can reach **Deliverance through Wisdom (*Panna vimutti*)** which is a stage on the way to *Sotapanna* or stream winning level of liberation. Such a person is referred to as a wisdom-liberated or *Panna vimutta*.

Another significant link in the Doctrine of Dependent Origination is 'the six sense doors' which come in 'contact' with outside sense messages causing 'feelings' which can be pleasant, unpleasant or neutral. It is also seen that that contact with external sense messages generally result in attachment to 'feelings' of 'craving'. Craving (*Tanha*) along with Clinging (*Upadana)* form the most contributory factor which result in continuous birth and death. However at this stage a practitioner can make all attempts to prevent 'craving' from developing into 'clinging'. It is also noteworthy that, as a precaution, effort should be made to prevent craving altogether. The result of preventing the arising of clinging would be significantly beneficial in that no development into further 'becoming' or 'rebirth' is possible with no clinging. By prevention of all clinging a practitioner is able to achieve the important stage of *Ceto Vimutti* of spiritual progress referred to as **Deliverance of Mind *(Ceto vimutti*)**. The two forms of deliverance taken together form a higher and a more important level of spiritual development. A serious practitioner who can get 'liberated both ways' is referred to as '*Ubhato Bhaga Vimutta'.* Deliverance through wisdom and Deliverance of mind are both considered as stages reached by noble spiritual disciples who are on the way to stream entry or Sotapanna level.

May all attain the supreme Liberation from Samsara !

**For further reading** :-

Samatha Vidharshana Bhavana Marga by Most Ven Matara Nyanarama Maha Thera

Dhamma Padattha Katha – Vol II, Buddhist Cultural Centre

What the Buddha Taught – Ven. Walpola Rahula

# අවුරුද්දයි බුදු දහමයි...

**නාලක ජයසේන**



මෙරට සිංහල බෞද්ධ ජනයාගේ මහා සංස්කෘතික මංගල්‍යය වන අළුත් අවුරුදු උළෙල වාර්ෂිකව ව්‍යවහාර මාස ක්‍රමය අනුව අප්‍රේල් මස යෙදෙයි. ඒ සිංහල මාස ක්‍රමය තැනී ඇති චන්ද්‍ර වර්ෂයට අනුව එම වර්ෂයක ආරම්භක මාසය වන බක් මාසයය. සූර්ය මාස හෙවත් ශක වර්ෂ අනුව හිරු මීන රාශියේ සිට මේෂ රාශියට ගමන් ගැනීම සිදු වන්නේ මෙම බක් මාසයේදීය. එම ගණනය ජ්‍යොතිර් විද්‍යාත්මක සිද්ධාන්ත මත පදනම් වෙයි. ජ්‍යොතිර් විද්‍යාත්මකව කෝණ මාස නමින් සංකල්පයක්ද ඇති අතර, වසරකට කෝණ මාස හතරකි. එහි පළමු කෝණ මාසය අවසන් වන්නේ අවුරුදු උදාවෙන් දිනකට හෝ දෙකකට පසුය. එබැවින් අළුත් අවුරුද්දට බක් මහ කෝණම යනුවෙන් අපේ ගැමියෝ අතීතයේ ව්‍යවහාර කළහ. කෝණය යන සංකල්පය අපේ ගැමි ජන විශ්වාස සමග තදින් බැඳී තිබිණ. "කෝණේ කන දීගේ නැසේ" වැනි ව්‍යවහාර මෙන්ම "කෝණෙට ඉස්සෙල්ලා වහින එකක් නෑ", "කෝණෙන් පස්සේ ඔය ගමන යමු" වැනි සමාජ අදහස් මගින් ඒ තහවුරු වෙයි. ඒ අනුව කෝණ මඟුල සශ්‍රීකව සමරන්නට අපේ අතීත ගැමියෝ ලක ලෑස්ති වූයේ බක් මහ උදාවත් සමගිනි. අවුරුදු සැමරුම අද වන විට සංකීර්ණ සමාජ ක්‍රමය තුළ දින කිහිපයකට සීමා වී තිබුණත් එදා අවුරුදු සිරිය මසකට ආසන්න කාළයක් පුරා විහිදිණ. ඊට කදිම නිදසුන වන්නේ, අද අභාවයට යමින් පවතින අවුරුද්දට හඳ බැලීමේ චාරිත්‍රයයි. පරණ අවුරුද්දට හා අළුත් අවුරුද්දට හඳ බැලීම ලෙස දෙවරක් ඉටු කළ ඒ සිරිත් දෙක අතර පරතරය මසකට ආසන්න කාළයක් විය. එපමණක් නොව ජනමාධ්‍ය මගින් සූර්ය මංගල්‍ය වශයෙන් අවුරුදු කෝණම නම් කළද එහි හැඩරුව විමසීමේදී එය සූර්ය මංගල්‍යයක් පමණක් නොව චන්ද්‍ර සූර්ය මංගල්‍යයක් බව පැහැදිලිය.

සිංහල අවුරුද්දේ ඉතිහාසය පිළිබඳව මත කිහිපයක් ඇත. එහෙත් වත්මනේ ක්‍රියාවට නැංවෙන සිරිත් විරිත් පද්ධතියේ ඡායාවක් පළමුවෙන්ම ලිඛිත සාහිත්‍ය මූලාශ්‍ර වල දැකිය හැක්කේ මහනුවර හෙවත් සෙංකඩගල යුගයේදීය. එම ලිඛිත සාක්ෂිවල තවත් විශේෂත්වයක් වන්නේ ඒවා ලියා ඇත්තේ විජාතිකයන් වීමය. ඩේවි දුටු ලංකාව නම් කෘතියේ ජෝන් ඩේවි විසින් දක්වන, මහනුවර යුගයේ රජුගේ මූලිකත්වයෙන් ඉටු කළ නැකත් කිහිපයක් දැක්වේ. ඒවා නම්, අලුල් අවුරුද්ද පටන් ගන්නා දිනය හා නැකත, ඖෂධ යුෂ ගා නා ගන්නා මොහොත, ආහාර අනුභව නැකත, වැඩ ඇල්ලීමේ නැකත, නෑමට සුදුසු නැකත හා රජුට තෑගි භෝග පිරිනැමීමේ නැකතය. වර්තමානයේ අප අවුරුද්දට අදාළව ඉටු කරනු ලබන චාරිත්‍ර වාරිත්‍ර පද්ධතියේ ප්‍රධාන නැකත්වල මූලය ඒ තුළ ගැබ්ව ඇත. එමතු නොව ඒ නැකත් චාරිත්‍ර එදා මහනුවර නාථ දේවාලය කේන්ද්‍ර කොටගෙන ඉටුව තිබේ. රොබට් නොක්ස්ද රජුගේ මූලිකත්වයෙන් අවුරුදු සැමරූ ආකාරය වාර්තා කොට තබා ඇති අතර, එකළ විසූ ජනතාව අළුත් අවුරුදු බද්දක්ද රජුට දිය යුතු බව ඔහු ලියූ එදා හෙළ දිව කෘතියේ දැක්වෙයි. එනයින් ගත්කළ අවුරුදු උළෙලට එකළ තිබූ සමාජ වැදගත්කම සනාථ වෙයි.

තවද නොක්ස්ට අනුව අවුරුදු දිනය මාර්තු 26, 28 හෝ 29 දිනවල යෙදී ඇත. වර්තමානයේ සිංහල අවුරුද්ද යෙදෙන්නේ අප්‍රේල් 13 හෝ 14 දිනවලය. අධික වර්ෂවලදී නම් අප්‍රේල් 13 වෙනිදාට අවුරුද්ද



යෙදෙයි. උඩරට යුගයේ එය මාර්තු මස යෙදුණු බව දැක්වෙන්නේ එකළ භාවිත කළ ජූලියානු දින දර්ශනය අනුව විය හැකිය. වර්තමානයේ අප භාවිත කරන ඉංග්‍රීසි කැලැන්ඩරය ග්‍රෙගරියානු දින දර්ශනයයි. එම දින දර්ශන අතර වෙනසක් ඇත. එසේම සිංහල අවුරුද්ද එළඹෙන දිනය, කාළයෙන් කාළය වෙනස් වීමද සිදු වෙයි. අදින් වසර 50කට 60කට එපිට අවුරුදු උදාව සිදුව ඇත්තේ අප්‍රේල් 12 හෝ 13 වැනි දිනකය. ඒ අනුව ඉදිරි අනාගතයේදී අවුරුද්ද අප්‍රේල් 15 වනදා උදා වනු ඇත. මෙසේ අවුරුද්ද යෙදෙන දිනය වෙනස්වීමට අදාළ මනා ගණිතානුකූල පැහැදිලි කිරීම සිදු කර ඇත්තේ ආචාර්ය නලින් ද සිල්වා මහතාය. ඒ පිළිබඳව ඔහු තම සිංහල අවුරුද්ද කෘතියේ මෙසේ දක්වයි.

“මේ කාළයේ සූර්ය සංක්‍රාන්තිය ලෙස සැළකෙන්නේ සූර්යයා මීන රාශියේ සිට මේෂ රාශියට පැමිණීමයි. මෙකී සංක්‍රාන්තිය සිදු වන්නේ එමෙන්ම සිදුව ඇත්තේ එකම දවසකද? නැත. අප කුඩා කාළයේදී අප්‍රේල් 12 වැනිදා මෙය සිදු වූ බැව් අපි දනිමු. තව වසර විස්සකින් විසි පහකින් පමණ මේ සංක්‍රාන්තිය අප්‍රේල් 15 බඳු දිනක සිදු විය හැකිය. හොඳයි මේ ක්‍රමයම දිගටම සිදු වුවහොත් සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට ගමන් ගන්නා සූර්ය සංක්‍රාන්තිය ටිකෙන් ටික බක් මාසයේ අගට පැමිණිය හැකිය. එය ඉන් නොනවතිනු ඇත. වෙසක් මාසයටද ගමන් කරනු ඇත. මේ අනුව අළුත් අවුරුද්ද බක් මාසය තුළම රඳවා ගැනීමට මෙකී සූර්ය සංක්‍රාන්තිය පරහක් විය හැකිය. මින් අපට හැඟෙන්නේ කුමක්ද ? බක් මාසය අවුරුදු මාසය ලෙසටම තබා ගැනීමට නම් සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට මාරු වනදා අවුරුදු දාය යන මතයෙන් අප මිදිය යුතු බවය. ඒ වෙනුවට බක් මාසය තුළ සිදු වන සූර්ය සංක්‍රාන්තිය අළුත් අවුරුදු සූර්ය සංක්‍රාන්තිය ලෙස තෝරාගත යුතු බවය. (සිල්වා 2014 37).”

මේ අනුව පැහැදිලි වන්නේ අළුත් අවුරුද්ද යනු ස්වභාදහම ඇසුරෙන් සිංහළ බෞද්ධයා නිර්මාණය කරගත් මාහැඟි සංකල්පයක් බවය. ඉහත කරුණු සලකා බැලීමේදී එහි ඇති දාර්ශනික ගැඹුර තහවුරු වෙයි. එහෙත් මෑතකාලීනව සිංහල අවුරුද්ද සැමරීම බෞද්ධයාට නුසුදුසුය හා අකැපය යන මතයක් සමාජගත විය. එය කොතෙක් දුරට යුක්තියුක්තද යන්න පිළිබඳවද අප සළකා බැලිය යුතුය.

සිංහළ අවුරුද්ද බුදු සමයට පටහැණි බවට ගැනෙන එක් තර්කයක් වන්නේ සිංහළ අවුරුද්දට පාදක වන ජ්‍යොතිෂ්‍යය බුදු දහමෙන් ප්‍රතික්ෂේප කරන බවයි. බුදු දහමට අනුව ජ්‍යොතිර්වේදය ගර්හිත විද්‍යාවක්, තිරශ්චීන විද්‍යාවක් ලෙස සැලකෙන බැවින් හා

තාරකා කුමක් කරන්නදැයි බුදු හිමි දේශනා කොට ඇති බැවින් එනයින් නක්ෂත්‍රය පදනම් වූ අවුරුද්ද බොදුනුවාට නුසුදුසුය යන්න එම තර්කයයි. එහෙත් එම පිරිස අමතක කරනුයේ පොහොය ලැබීම ගෙවීමටද පදනම් වන්නේ ජ්‍යොතිර්විද්‍යාත්මක දැනුම් පද්ධතියේ එන ගණිතමය මූලධර්ම බවයි. සැබැවින්ම බුදුදහම ලෞකික ශිල්ප ශාස්ත්‍ර ප්‍රතික්ෂේප නොකරයි. ජීවත් වීම පිණිස ලෞකික දැනුම අත්‍යවශ්‍යය. නමුත් බුදු හිමි ජ්‍යොතිර්වේදය හා ගුප්ත විද්‍යා ආදී ශාස්ත්‍ර ප්‍රතික්ෂේප කොට ඇත්තේ ඒවා ආධ්‍යාත්මික විමුක්තිය හෙවත් නිර්වාණය විෂයයක අවලංගු වන බැවිනි. නැතහොත් ශූන්‍ය වන බැවිනි. එනම් ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනයේදී ජ්‍යොතිර්වේදය වැනි ලෞකික ශාස්ත්‍රවලින් ගත හැකි පලප්‍රයෝජනයක් නොමැත. වෙනත් ලෙස කියන්නේ නම් මාර්ගඵල අවබෝධයේදී කේන්ද්‍රරවල කියැවෙන ග්‍රහචාර බලරහිත වන බවයි.

අවුරුදු සැමරටැමට එදිරි තවත් තර්කයක් වන්නේ අවුරුද්දට සමරනු ලබන චාරිත්‍රාදිය හින්දුන්ගෙන් ලැබුණු ඒවා බවත් ඒවා සැමරුම බුදු දහමේ පැනෙන සීලබ්බත පරාමාස යටතට අයත් බවත්ය. නමුත් අළුත් අවුරුද්ට සමරනු ලබන චාරිත්‍ර වාරිත්‍රවලින් සිංහල බෞද්ධයෝ නිවන නොපතති. නිදසුනක් ලෙස ඔවුහු සුබ නැකතට ලිප ගිනි දල්වන්නේ නිවන පතා නොවෙති. එපමණක් නොව එය අග්නි (ගිනි) දෙවියන්ට කරනු ලබන පූජාවක්ද නොවෙයි. ලිප ගිනි මෙලවීම නම් නැකැත් චාරිත්‍රය මගින් සිංහල බෞද්ධයෝ අපේක්ෂා කරනුයේ ලැබූ අවුරුද්ද තුළ අළුතෙන් ලිපක පිසෙන බත නැවුම්ව තනා ගෙන නව වසරට නව ජීවයකින් පිවිසීමය. සියළු සත්ත්වයෝ ආහාරයෙන්ම යැපෙන බව බුදුදහමේ දැක්වෙයි. කෙසේ වෙතත් සීලව්‍රත පරාමාස යටතට අවුරුදු සිරිත් විරිත් ගත නොහැක්කේ. එම සිරිත් විරිත් අන්තවාදී හෝ විමුක්තිවාදී ඒවා නොවන බැවිනි. අනෙක් අතට වසරකට වරක් පමණක් පවුලේ සියළු දෙනා එක්ව ඉටු කරනු ලබන එම චාරිත්‍ර මගින් බුදු දහමේ දැක්වෙන සාමූහිකව එක්රැස්වීම සිදු වෙයි.

මේ අනුව සිංහළ බෞද්ධයාගේ අවුරුදු සැණකෙළිය බුදු දහමට විරුද්ධ වේය යන අදහස පදනම් විරහතය. අනෙක් අතට අවුරුද්ද හා බැඳුණු සිරිත් විරිත් මගින් බුදු දහමෙන් ඇගයෙන වැඩිහිටියන්ට ගරු බුහුමන් දැක්වීම, ණය නැති ගුණය, දානමය පුණ්‍ය කර්මය යනාදී බොහෝ සාරාර්ථ ඉටු වෙයි. එපමණක් නොව සිංහළ බුදු සමයේ දේව විශ්වාසයන්ට ඇති ස්ථානයද අවුරුදු සිරිත් තත්



දේවාලවල ඉටු කිරීම මගින් සනාථ වෙයි. උඩරට විහාර දේවාලවල සාම්ප්‍රදායික සතර මංගල්‍ය අතුරෙන් පළමු වැන්න වන්නේ අවුරුදු මංගල්‍යයයි. එහිදී කිරි ඉතිර වීම, කණ්ඩිකස්නාන චාරිත්‍රය මෙන්ම අළුත් අවුරුදු මුලුතැන් සම්බුද්ධ පූජා යනාදී සිරිත් විධි සුබ මුහුර්තයෙන් සිදු කෙරෙයි. පහතරට ගත් කළ රුහුණු මහා කතරගම දේවාලයේද අවුරුදු උදාවට පෙර දේවාලයට වළං සැපයීමේ චාරිත්‍රය ඉටු කොට, අවුරුදු උදාවත් සමග කිරි ඉතිරවීම ආදී සිරිත් ඉටු කරන අතරම අවුරුදු දා රාත්‍රියේ අවුරුදු පෙරහැරද විචිත්‍රවත්ව පවත්වනු ලැබේ. ඓතිහාසික ශ්‍රී දළදා මන්දිරයේදී එදා රජුට සිදු කළ දැකුම් මංගල්‍ය හෙවත් පෙනුම් ගමන් චාරිත්‍රය අදටත් සංකේතාත්මකව ඉටු කෙරෙයි. මෙකී සාක්ෂ්‍ය අනුවද පැහැදිලි වන්නේ සිංහළ අවුරුද්ද හා බැඳුණු බෞද්ධකම අවියෝජනීය බවයි.

එසේම සිංහළ අළුත් අවුරුද්දෙහි අවසන් මංගල්‍ය වන තෙල් ඇඹිල් කෝණ මංගල්‍ය හෙවත් හිස තෙල් ගෑමේදී මූලිකත්වය හිමිවන්නේ ගමේ පන්සලටය. මහනුවර නාථ දේවාලයේ පිළියෙළ කරන නානු කොටස් අතීතයේ පටන් අවට විහාරස්ථාන වෙත යවා ඇත. භික්ෂූන් වහන්සේ විසින් පිරිත් සජ්ජායනා කරමින් නව වසරට ආශීර්වාද කරමින් ගම්වැසියන්ගේ හිසෙහි තෙල් ගල්වනු ලැබීම කොතරම් සුන්දර අවස්ථාවක්ද? ජීවිතයට අවශ්‍යම සම්පතක් වන නිරෝගීත්වය හෙවත් ස්වස්ථතාව වෙනුවෙන් ඉටු කෙරෙන එම චාරිත්‍රය මගින් පැවිදි ගිහි සබඳතාව හෙවත් පන්සල හා ගම අතර ඇති බැඳියාව අළුත් අවුරුද්ද නිමිත්තෙන් අලුත් වෙයි. ආරෝග්‍යා පරමා ලාභා යනු බුද්ධ දේශනාවයි. සැබැවින්ම සිංහළ අවුරුද්ද යනු සොබාදහමේ මංගල්‍යයකි. බුදු දහම හා සොබා දහම අතර ඇත්තේ ගසට පොත්ත පොත්තට ගස මෙන් ඇති බන්ධනයකි. ඉදින් සිංහළ බෞද්ධයා සොබාදහමේ නැවුම් වීමත් සමග එය තම ජීවිතයට ආබද්ධ කරගෙන දහමට සමීප වී නව අවුරුද්දකට පිවිසීමේ සැණකෙළිය අප ආරක්ෂා කරගෙන අනාගත පරම්පරාව වෙනුවෙන් දායාද කළ යුතුව ඇත. මක්නිසාදයත් සිංහල බෞද්ධයාගේ අවුරුදු සිරිත අවසානයේ උදාවන ලෝකෝත්තර මංගල්‍ය වන වෙසක් පොහොයේදී අනුගමනය කරන දාන සීලාදී ගුණ ධර්ම පිරීම වෙසඟේ උදාවටත් පෙර අවුරුද්දෙන් පුරුදු පුහුණු කරන බැවිනි.


බෞද්ධාලෝකය - බෞද්ධ සඟරාව
ධර්ම දානයක් ලෙස පූජා කරන්න

සඟරා 100 ක්
රු. 5000 /-



සබ්බ දානං - ධම්ම දානං ජිනාති
සියලු දානයන්ගෙන් ධම්ම දානය උතුම් වේ

ඔබගේ, ඔබේ දරුවෙකුගේ විවාහ සංවත්සරය,
උපන් දිනය හෝ මියගිය ඥතීන්ට පිං පැමිණවීමට,
පොහොයදා සිල් සමාදන්වන උපාසක උපාසිකාවන්ට ධර්මදානයක්
ලෙස බෞද්ධාලෝකය සඟරාව පූජා කරන්න.



වෙනත් පිංකම් වලදීත් පූජා තිළිණයක් ලෙසින්,
මෙම සඟරාව පූජා කරන්න.

# බෝසත් උපත පුරාණය බෞද්ධ සාහිත්‍යයෙන්



බුද්ධ චරිතයේ ප්‍රධාන කරුණු රැසක් ඒකරාශී වු දේශනාවක් ලෙස දීඝනිකායේ මහාපදාන සූත්‍රය සඳහන් කළ හැකිය. ථෙරවාදීන්ගේ සම්මත ත්‍රිපිටකයෙහි බුද්ධ භාෂිතයක් සේ පිළිගෙන ඇති, මහාපදාන සූත්‍රයෙහි සඳහන් එම දේශනාව අනුව භාග්‍යවතුන් වහන්සේ පෙරවිසීම් සිහිපත් කරන නුවණින් (පුබ්බේ නිවාසානුස්සති ඥාණ) විපස්සි, සිඛී, වෙස්සභූ, කකුසඳ, කෝණාගම සහ කස්සප යන බුදුරජාණන් වහන්සේලා සය නම විස්තර කළහ.

ඊට සමාන්තරව බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ පිළිබඳවද තම පුවත් පැවසූහ.

"මහණෙනි, මේ භද්‍ර කල්පයෙහිම මෙකළ මම අර්හත් සම්බුද්ධ වෙමි. මම ජාතියෙන් ක්ෂත්‍රියව ක්ෂත්‍රිය කුලයෙහි උපන්නෙමි. ගෝත්‍රයෙන් ගෝතම නම් වෙමි. මෙකළ මාගේ ආයු ප්‍රමාණය අල්පය. ටිකය. යමෙක් බොහෝ කල් ජීවත් වෙයි නම් ඔහු අවුරුදු සියයක් හෝ ටිකක් වැඩියෙන් හෝ අඩුවෙන් ජීවත් වෙති. මෙකළ අරහත් සම්බුද්ධවූ මම ඇසතු රුක්මුල්හි බුදුවීමි. මෙකළ මට සාරිපුත්ත, මොග්ගල්ලාන නම් අග්‍ර භද්‍ර ශ්‍රාවක යුග්මයක් වෙති. මෙකළ මට රහතන් වහන්සේලා එක් දහස් දෙසිය පණහක් වූ එකම ශ්‍රාවක සන්නිපාතයක් විය. ආනන්ද භික්ෂු නම් අග්‍ර උපස්ථායක විය. සුද්ධෝදන රජු පියා විය. මායාදේවිය වැදූ මව වුවාය. කපිලවස්තුව රාජධානියයි. (දිඝනිකායේ මහාපදාන සූත්‍රයෙහි පි.10)

මහාපදාන සූත්‍රගත මෙම තොරතුරුවලින් ගෞතම බුදුරජාණන් වහන්සේගේ චරිතාපදානයට අදාළ ප්‍රධාන පුවත් රාශියක් පැවසේ. පශ්චාත්කාලීන බුද්ධ චරිත ග්‍රන්ථවල මේ පුවත් සංවර්ධනයට පත් කරමින් දීර්ඝ ලෙස විස්තර කර ඇත. බුදුරජාණන් වහන්සේගේ ජන්ම

භූමිය කපිලවස්තු රාජධානිය බව මෙහි සඳහන්ව ඇතත් එය කවර ස්ථානයකදී උපත සිදුවිණි දැයි සඳහන් කර නැත. එහෙත් ලුම්බිණියෙහිදී සිදුහත් උපත සිදුවූ බව ආදී (පැරණි) බෞද්ධ ග්‍රන්ථ අතර පැරණිම ග්‍රන්ථයක් සේ ගැනෙන සුත්ත නිපාතයෙන් හමුවෙයි. (බුදුන් වදාළ බුද්ධ චරිතය පූජ්‍ය මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත හිමි සහ කීර්ති නාරම්පනාව (පි.17 (1999).

අසමසම උතුම් රත්නයක් වැනි ඒ බෝසතාණෝ මිනිස් ලොව හිතසුව පිණිස ශාක්‍ය ජනපදයෙහි ලුම්බිණි ග්‍රාමයෙහි උපන්හ. (සුත්ත නිපාතය - මහාවග්ග - නාලක සූත්‍රය පි.214)

ඒ සඳහන් කරුණු අනුව සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේගේ උපත සිදුවූයේ ලුම්බිණියෙහිය. මෙකළ නේපාල රාජ්‍යයට අයත් වූ ලුම්බිණිය බුද්ධ කාළයට පෙර පටන්ම ප්‍රකටය. බුද්ධ කාළයේ සිටම ධර්ම යාත්‍රිකයන්ගේ අවධානයට ලක්වූ පුදබිමකි. ඒ බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වන "සතර සංවේජනීය" ස්ථානයන්ගෙන් එකක් වන නිසාය. ලුම්බිණිය වර්තමාන නේපාල රාජ්‍යයට අයත් වේ. මෙය ශාක්‍ය ජනපදයේ අගනුවර වන්නට ඇත.

"සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං මහාවනේ" යන මහාසමය සූත්‍ර පාඨයට අනුව එය තහවුරු වේ. මෙය සමහර විට කෝසල රාජ්‍යයේ සාමාජික රටක් වන්නට ඇතැයි ගෞතම බෝසතුන්ගේ ප්‍රකාශයක් අනුව සිතිය හැකිය.

අභිනිෂ්ක්‍රමණයෙන් පසු බෝධිසත්වයාණන් වහන්සේ එක් අවස්ථාවක රජගහ නුවරට පැමිණි සේක. එහිදී මගධයේ රජතුමාවූ බිම්බිසාර රජුත් බෝධිසත්වයන් වහන්සේත් අතර සාකච්ඡාවක් ඇතිවිය. බෝධිසත්වයාණන් වහන්සේ හඳුනා ගැනීමේ ආශාවෙන් සාකච්ඡාවේ යෙදුණු බිම්බිසාර රජතුමාට මෙසේ පැවසුවේය.

"කෙළින්ම ඇති මේ හිමාලය පර්වතය පාර්ශවයෙහි ධනයෙන් සහ වීර්යයෙන් යුක්ත කෝසල ජනපදයෙහි පරම්පරානුගත ජනපදයක් වේ. ඔව්හු ගෝත්‍රයෙන් ආදිත්‍ය නම් වෙති. ජාතියෙන් ශාක්‍ය නම් වෙති. මෙම කාමයන් නොපතමින් ඒ කුලයෙන් පැවිදි වීමි. (සුත්ත නිපාතය මහාවග්ග පබ්බජ්ජ සුත්ත පි.124)

මේ අනුව සිද්ධාර්ථ බෝධිසත්වයන් වහන්සේ කෝසල පරම්පරාවෙන් පැවත එන ශාක්‍ය ජනපදයෙහි සූර්ය වංශයට අයත් ශාක්‍ය කුලයෙහි බව පවසා ඇත. ගෝත්‍රයෙන් සිදුහත් කුමරු ගෝතම නම් වන බව මහාපදාන සූත්‍රයෙහි සඳහන් වේ. මෙම ගෝතම යන නාමයෙන් බෝසත්හු ප්‍රකට වූහ. එපමණක්ද නොවේ. බුද්ධත්වය ලැබීමෙන් පසුද ඒ නාමයෙන් ප්‍රසිද්ධ වූහ. "සමණෝ බල හෝ ගොතමා සක්‍යකුලා පබ්බජිතො."අභික්කන්තං හෝ ගොතමං සරණං ගච්ඡාමි" ආදී සූත්‍ර පාඨවලින් ද අපදාන පාළි සහ ථෙරී ගාථා ග්‍රන්ථවල දක්නට ලැබෙන "ගෝතමෝ නාම ගොත්තේන. ගෝතමෝ නාම නාමේන" වැනි යෙදුම්වලින්ද ඒ බව දක්නට ලැබේ. පසුකාලීන බුද්ධ චරිත ග්‍රන්ථවල දක්නට ලැබෙන බෝධිසත්වයන් වහන්සේගේ "සිද්ධාර්ථ" යන නාමය පුරාණ බෞද්ධ ග්‍රන්ථවල දන්නට නොලැබේ. එය අනුගාමික බැතිමතුන් විසින් යොදන ලද නාමයක්ද නැතහොත් ඇතැම් පුද්ගල නාම මෙන් ව්‍යවහාරයෙන් ප්‍රකට නොවූ එහෙත් සුරක්ෂිත කොට පවත්වා ගත් පෞද්ගලික නමක් දැයි අද අපට නිශ්චය කළ නොහැකිය. කෙසේ වෙතත් ථෙරවාද සහ මහායාන සම්ප්‍රදාය දෙකටම අයත් බුද්ධ චරිත ග්‍රන්ථයන්හි "සිද්ධත්ථ - සිද්ධාර්ථ" නාමයෙන් සඳහන්ව තිබේ. එසේ හෙයින් එය පරම්පරාගතව සුරක්ෂිත ජීවන තොරතුරුවලින් ලබාගන්නට ඇතැයි සිතිය හැකිය (බුදුන් වදාළ බුද්ධ චරිතය පි.20 (1999)

මහාපදාන සූත්‍රයෙහි සඳහන් වන පරිදි බෝධිසත්වයන් වහන්සේගේ පියා සුද්ධෝදන නම් වේ. එතුමා රජ කෙනෙකු බව "සුද්ධෝදනෝ රාජා" යන යෙදුමෙන් පැහැදිලි වේ. රාජධානිය කපිලවත්ථු නම් වූ අතර එය ශාක්‍ය ජනපද රාජ්‍යයට අයත් වූයේය. මේ පුවත් පදනම් කරන්න සම්ප්‍රදායික බුද්ධ චරිතය වර්ණනාවල දැක්වෙන ඒ තොරතුරු අමුතුවෙන් ගොතන ඒවා යැයි සැක කිරීමට හෝ බැහැර කිරීමට වෙහෙසීමේ තේරුමක් නැත.

බෝසත් උපත ගැන ඇසූ අසිත තාපසයා කුමරු දැකීම පිණිස සුදොවුන් රජුගේ භවනයට ගිය බව දැක්වේ. (සුත්තනිපාත නාලක සුත්ත පි 214) සිය පියාණන් ගැන සඳහන්කළ අවස්ථාවලදී "පිතුසක්ක" (ශාක්‍ය පියා) යන වදන් භාවිතා කළ අයුරු දක්නට ලැබේ. මේ අනුව ශාක්‍ය ජනපදයෙහි කපිලවත්ථුපුර සුද්ධෝදන ශාක්‍ය රජ ගෞතම බෝසතාණන්වහන්ගේ පියාණන්ය. වැදූ මව මායා දේවිය බව මහාපදාන විස්තරයෙහි සඳහන්ය. මෙය තහවුරු වන ප්‍රකාශයක් ථෙරී ගාථාවෙහි පෙනේ.

බොහෝ දෙනාට වැඩ පිණිස මායාදේවිය ගෞතම බෝසතුන් ප්‍රසූත කළාය. ව්‍යාධි මරණාදියෙන් පිඩාවට පත් වූවන්ගේ දුක් කඳ උන්වහන්සේ දුරු කළහ. වැදූ මව මහාමායා බව මහා අපදාන සූත්‍රයෙහි සඳහන් වේ. මේ කරුණු තහවුරු කෙරෙන ප්‍රකාශයක් ථෙරී ගාථාවෙහි සඳහන් වේ. ප්‍රජාපතී ගෝතමී තෙරණිය එහිලා මෙසේ සඳහන් කරන්නීය. "බොහෝ දෙනාට වැඩ පිණිස



මායා දේවිය ගෝතම බෝසතුන් පරම ප්‍රසූත කළාය. ව්‍යාධි මරණාධියෙන් පීඩාවට පත් වූවන්ගේ දුක් කඳ උන්වහන්සේ දුරු කළහ. (ථෙරිගාථා ප්‍රජාපතී ගෝතමී ථෙරිගාථා පි.162)

බුද්ධ මාතා


දෙව්දහ නගරයෙහි විසූ අන්ජන ශාක්‍යයාත් සුලක්ඛණාත් යන දෙදෙනා මහාමායා බිසවගේ දෙමව්පියන් බවත් ඔවුන්ට දාව උපන් ගෝතමියද සුද්ධෝදන රජුගේ ගෙට ගෙන ගිය බවත් තම අපදාන ප්‍රකාශනයෙහි සඳහන් කොට ඇති අයුරු අපදාන පාලියෙහි සඳහන් වේ. (අපදාන පාලිය-ප්‍රජාපති ගෝතමී අපදානය පි. 60)

ධර්මතාවයක් වශයෙන් බෝසත් මාතාව බෝසත් ප්‍රසූතියෙන් සත්දිනකට පසු මියයන බව මහාපදාන සූත්‍රයෙහි සඳහන් වේ. ඒ අනුව ගෝතම බෝසතුන්ගේ උපතින් සතියකට පසුව මහාමායා දේවිය කළුරිය කළාය. ඉන්පසු බෝසත් කුමරු හදාවඩා ගැනීමේ වගකීම ඇයගේම සොහොයුරිය වූ ප්‍රජාපති ගෝතමියගෙන් ඉටුවිය. මම මේ පශ්චිම භවයන් සුදොවුන් රජුගේ ගෙට ගියෙමි, යන ප්‍රජාපතී ගෝතමීයගේ ප්‍රකාශයෙන් හැඟවෙනුයේ විවාහ වූ බව විය හැකිය. නමුත් එම විවාහය සිදුවූයේ මායාදේවියගේ අභාවයෙන් පසුව ද පෙරද යන බව සඳහන් කළ නොහැකිය. දින වකවානු සඳහන් කිරීමේ වැදගත්කමක් ඇතත් නැතත් ගෝතමියගේ කාර්යභාරය ශ්‍රේෂ්ඨත්වය ඇයගෙන් සිදුවූ සේවය ප්‍රකාශවන තොරතුරු බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන්ව ඇත.

බෝසත් උපත සැලවීමෙන් රජගෙට පැමිණි ප්‍රාරම්භක ගාථාවලින් පැවසේ. (සුත්ත නිපාත - මහාවග්ග නාලක සූත්‍රය-පි.214) ඒ අනුව රජගෙට පැමිණි අසිත ඍෂිවරයා කුමරා කොහිද? මම දකිනු කැමැත්තෙමි කීය. ශාක්‍යවරු දිලිසෙන රන්කැටියක් වන් රූපශ්‍රීයෙන් යුත් කුමරු දැක්වූහ. විපුල ප්‍රීතියෙන් ඔද වැඩී ගිය අසිත ඍෂිවරයා සොම්නසින් පිළිගත්තේය. අසිත වේදයෙහි මෙන්ම ලක්ෂණ ශාස්ත්‍රයෙහි පරප්‍රාප්තිකයෙකි. මේ කුමාරයා අනුත්තරය. දීපදෝත්තම යැයි කඳුළු වැගිරිණ, කුහුලටත් ශාක්‍යයෝ කුමරුට ආන්තරාවක්දැයි කනස්සල්ලෙන් විමසූහ, අසිත පිළිතුරු දෙමින් මේ ළාමක පුද්ගලයෙක් නොවේ, අනුත්තර සම්බෝධියට පැමිණ දම්සක් පවත්වයි. එතුමාගේ ශාසනය පතළ වෙයි. මෙලොව මාගේ ආයුෂ දිගුකල් ඉතිරි නොවෙයි. මරණය සිදුවෙයි. මට මේ අසම වීරයාණන්ගෙන් දහම් අසන්නට නොලැබෙයි. එයින් ආතුර වෙමි. සැප නොලබමි. දුකට වැටෙමි කියා ඔවුහු සනසා රජගෙයින් පිටව ගියේ ය.

බුදුන් වදාළ බුද්ධ චරිතය -

පූජ්‍ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත ස්වාමීන් වහන්සේ සහ කීර්ති නාරම්පනාව පි-22-23(1999)



# රහතන් වහන්සේට දුන් දානය ගිනි ගොඩකට දැමූ ලෝසක තිස්ස තෙරුන්ට අකුසලය විපාක දෙයි....

රහතන් වහන්සේ නමකට දුන් දානය ගිනි ගොඩක දමා ගිය පාප කර්මය නිසා කල්ප ගණන් අපායේ දුක් විඳි ලෝසක තිස්ස මහරහත් වහන්සේ සසර තුළ වසර දහස් ගණනක් ආහාර නොලැබ දුක් විඳි අයුරු බෞද්ධ සාහිත්‍ය කතා වස්තුව පාප නොකිරීමට දෙන ආදර්ශවත් කතා පුවතකි.

බුදු රජුන් දවස ලෝසක නම් දරුවෙක් එක්තරා ධීවර ගමක කාන්තාවකගේ කුසෙහි පිළිසිඳ ගත්තේය. දරුවා මේ කාන්තාවගේ කුසට පැමිණි දා සිට ඒ නිවැසියන් පමණක් නොව ගමේ මිනිසුන්ද අන්ත දුගීභාවයට පත්විණි. මේ ධීවර ගම්මානය ද සත් වාරයක්ම ගින්නෙන් ඇවිලී විනාශ විය. මේ ගම්මානය ගිනි ගැනීමත් සමග ඒ රටේ රජතුමාද ඒ ගම්වැසි ජනතාවට දඩ ගැසීය. මෙවැනි තත්ත්වයකට පත්වීමට හේතු කුමක්දැයි ගම්වැසියන් සොයා බැලීමේදී මේ දුප්පත් කාන්තාවගේ නිවස ගැන ඇස ගැටිණි.

මේ කාන්තාවට උපන් දරුවා නිසා තමයි අපේ ගමට මේ තත්ත්වය උදාවුණේ. නිවෙස්වලට මෙන්ම ජනතාවට කරදර විපත්ති සියල්ල සිදුවුණේ මේ අය නිසා යැයි කියමින් ඒ ගම්වැසියෝ ලෝසක තිස්සගේ මෑණියන් හා ලෝසක තිස්සත් ඒ ගමෙන් එළවා දැමූහ. තොපි මේ ගමෙන් පලයව් - නැවත මෙහි එන්න එපා.... යැයි කියමින් එළවන්නට විය.

ලෝසක තිස්ස හා ඔහුගේ මෑණියන් අසරණ වූහ. ඇය වෙනත් ගමකට ගොස් ජීවත් වූයේ අන්ත අසරණ දුගීභාවයට පත් වෙමිණි. එදිනෙදා ජීවත් වීමට කෑම ස්වල්පයක්වත් සොයා ගැනීමට ඇය නොගත් උත්සාහයක් නැත. ඒ ලෝසක තිස්ස ජීවත් කරවීම පිණිසය. ලෝසක තිස්ස වයස හතරක් පහක් වන විට ඔහුගේ මව මේ පුතු අතට කබල් භාජනයක් දී පුතේ□ කොහේ හරි ගිහින් ජීවත් වන්නැයි පවසා ගමේ ගෙවල්වලට සිඟා කෑමට යොදවා මව වෙනත් දිසාවක් කරා ගියාය.

එදා සැරියුත් මහ රහතන් වහන්සේ ගෙපිළිවෙලින් පිඬුසිඟා වඩින විට ආහාර ඉල්ලමින් ගෙයක් ගෙයක් පාසා යන මේ දරුවා නෙත ගැටිණි. සැරියුත් හිමියෝ දරුවාට අනුකම්පා කළහ. පිඬුසිඟා යමින් මේ දරුවාද කැඳවා ගෙන විහාරයටම වැඩියහ. පසුව දරුවා මහණ කළහ. පසුව ඔහු ලෝසක තිස්ස නමින් ප්‍රසිද්ධ වූ අතර භාවනායෝගීව සිට විදසුන් වඩා රහත් භාවයට පත්විය.

ලෝසක තිස්ස තෙරුන්ට මහණ වූ දා සිට කුස පුරා වළඳන්නට ආහාර නොලැබුණි. බොහෝ අවස්ථාවලදී බඩ ගින්නේම පසු වන්නට සිදු විය. මේ තෙරුන් වහන්සේ ගැන සැරියුත් හිමියෝ දිවසින් බැලූ විට පෙනී ගියේ ඔහුට ආයුෂ අඩු බවයි. ලෝසක තිස්ස තෙරුන් අපවත් වීමට පෙර ඒ හිමියන්ගේ කුස ගිනි නිවීමට සුදුසු ආහාර ලබා දීමට කල්පනා කළ සැරියුත් හිමිපාණෝ ඒ භික්ෂුව සමඟ පිණ්ඩපාතය වැඩියහ. පුදුමයකි එදින සැරියුත් හිමියන්ටද පිණ්ඩපාතය නොලැබුණි. එයට හේතුව ලෝසක තිස්ස තෙරුන්ගේ බලවත් අකුසල කර්මයයි. සැරියුත් තෙරුන් ලෝසක තිස්ස තෙරුන්ගේ පාත්‍රයට බත් හැන්දක් දැමූ විට එය පෙනෙන්නේ පාත්‍රය පිරී ඉතිරී ගිය බවකි. එහෙත් දන් වැළඳීමට සැරසුණු විට ආහාර පාත්‍රයෙන් අතුරුදන් විය.

මේ සිද්ධිය ගැන එදා දෙව්රම් වෙහෙරේ දම්සභා මණ්ඩපයේ රැස්ව සිටි භික්ෂූන් වහන්සේලා අතර කතා බහට ලක්විය.

"දිනක් සැරියුත් හිමියන්ට දානය ලැබුණේ නැතිලු"

"ඒ මොකද? තවත් භික්ෂුවක් විමසීය"

"අර ලෝසක තිස්ස තෙරුන් වහන්සේ සමඟ දානයකට වැඩි නිසා සැරියුත් තෙරුන්ට දානය ලැබී නැහැනේ"

මේ සිද්ධිය දිවසින් දුටු බුදුරජාණන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩි සේක. රැස්වී සිටි භික්ෂූන් වහන්සේලා අමතා ඒ ලෝසක තිස්ස භික්ෂුවට කුස ගිනි නිවීමට ආහාර නොලැබෙන්නේ පෙර භවයක කරන ලද අකුසල කර්මයක් නිසා බව වදාළහ.

ඒ අතීත කතාව නම් ලෝසක තිස්ස තෙරුන් පෙර භවයක භික්ෂුවක් ලෙස පැවිදිව සිටියහ. එක් දායකයෙක් උන්වහන්සේට උපස්ථාන කළේය. දවසක් ඒ ප්‍රදේශයට රහතන් වහන්සේ වඩිනු දුටු මේ දායකයා උන්වහන්සේට ගෞරව කරමින් දන් පිළිගැන්වීය. රහතන් වහන්සේ ටික කලක් ඒ පන්සලේ වැඩ සිටියහ. ලෝසක තිස්ස තෙරුන්ද ඒ විහාරයේ වැඩ විසීය. දිනක් දායකයා විහාරයට ගොස් තම නිවසේ තිබෙන දානයට වඩින ලෙස දන්වා සිටියේය. ලෝසක තිස්ස තෙරුන් නියමිත දින වැඩම කිරීමට අමතක නොකළේය. පළමුව ලෝසක තිස්ස තෙරුන් ඒ දායකයාගේ දානයට වැඩීමට පෙර අනෙක් භික්ෂුවට (රහතන් වහන්සේට) දානයට වැඩීමට නියපොත්තෙන් සීනුව නාදකර රහතන් වහන්සේගේ කුටියට ද නිය අගින් දානයට ආරාධනය කළේය.

"හිමියෙනි රහතන් වහන්සේ මෙහි වැඩම නොකලේ මන්දැයි දායකයා විමසීය. මා උන් වහන්සේලා දෙනමට ආරාධනා කළා යැයි පැවසීය".

රහතන් වහන්සේ මෙයට කලින් දින ඔබේ දන් වළඳා ඒ ආහාර දිරවා ගත නොහී නිදා සිටිනවා යැයි ලෝසක තිස්ස තෙරුන් පැවසීය. දායකයා තෙරුන්ට දානය පිළිග න්වා අවසන්ව රහතන් වහන්සේට පූජා කිරීම පිණිස පාත්‍රයක් පුරා දානය ඒ හිමි නම අත විහාරයට යැවීය.

ලෝසක තිස්ස තෙරුන් එම දාන පාත්‍රය රැගෙන යමින් මෙසේ සිතීය. මේ දානය වෙනත් අයකුට දුන්නොත් මා කළ වරද හෙළිවේ. දියට දැමුවිට ගිතෙල් පෙනෙයි. බිම දැමුවොත් බලු කපුටන් වටකර ගෙන බුදී. මෙය කොහි දමන්නේ දැයි කල්පනාවක යෙදීය. අතර මඟ එනවිට ගිනි ගොඩක් දැක එහි අඟුරු විසුරුවා එහි දැමීය. පසුව හිස් අතින් විහාරයට වැඩියහ.

මේ බලවත් අකුසල කර්මය නිසා ලෝසක තිස්ස තෙරුන් වහන්සේ කල්ප ගණනාවක් අපායේ දුක්විඳ - එතැනින් චුතව යක්ෂයකු වශයෙන් ආත්ම 500 ඉපදීමෙන් පසු නැවත ආත්ම 500ක් සුනඛයෙකු ලෙස උපත ලබා බොහෝ දුක් වින්දේය.

ලෝසක තිස්ස තෙරුන් පිරිනිවන් පානා දිනයේදී සැරියුත් හිමියෝ උන් වහන්සේට අනුකම්පාවෙන් යුතුව පිණ්ඩපාතය වැඩ දන් පාත්‍රය අතෙහි තිබියදී වළඳන ලෙස කීය. ඒ පාත්‍රයේ තිබූ ප්‍රණීත චතුමධුර බොහෝ කලක් ආහාර නොලැබ දුක් විඳිමින් සිටි ලෝසක තිස්ස තෙරුන් වහන්සේ විසින් එදින සිත් සේ චතුමධුර දානය වළඳා පරිනිර්වාණයට පත් වූ සේක.

**ශාස්ත්‍රපති ලොකුබණ්ඩාර මුණසිංහ**
**(මුළු දිවයිනටම සාම විනිසුරු)**

# ජාතික තරුණ මණ්ඩලය මගින් සංවිධානය කරන ලද දහම් පාසල් ගුරුවරුන් සඳහා නායකත්ව පුහුණු වැඩමුළුව

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ජාතික තරුණ මණ්ඩලය ගරු සභාපති උපේෂ් පෙතියාගොඩ මහතා ඇතුළු එම මණ්ඩලය විසින් සංවිධානය කරනු ලැබූ කොළඹ දිස්ත්‍රික් ශාසනාරක්ෂක බල මණ්ඩල තුළ පිහිටි දහම් පාසල් වල ගුරුභවතුන් උදෙසා “බුදු දහම සිංහලය දේශීය චින්තනයේ අනන්‍යතාවයයි” යන මැයෙන් එක්දින නායකත්ව පුහුණු වැඩමුළුව 2022.03.27 ඉරුදින බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතාගේ ප්‍රධානත්වයෙන් සම්මේලන ශාලාවේදී පවත්වන්නට විය.

මෙහිදී පූජ්‍ය මාලේවන ධම්ම විජය ස්වාමීන් වහන්සේ ජනාධිපති නීතිඥ ප්‍රසාන්ත ලාල් ද අල්විස් මහතා ද හිටපු හමුදාපති ජෙනරාල් දයා රත්නායක මහතා ද නියෝජ්‍ය සභාපති රොෂාන් මද්දුමගේ මහතා විසින් ද දේශන පවත්වන ලදී.





# සමනොළ සිරිපා කඳු පරිසරය හා ඉර සේවය නැරඹූ විදේශිකයෝ...

ශ්‍රී පාදස්ථානය සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළයේ උතුරු උඩුපත්තුවේ පිහිටා ඇත. මුහුදු මට්ටමින් මීටර් 2230 (අඩි 7430) උසින් පිහිටා ඇති සමනොළ කන්ද ලංකාවේ සෙසු කඳු මුදුන් හා සසඳන විට පස්වෙනි ස්ථානය හිමිවේ. ශ්‍රී ලංකාවේ උසම කඳු ශිඛරය වන්නේ මීටර් 2509 ක් උසැති පිදුරුතලාගලය. ඊළඟට කිරිගල්පොත්ත, තොටපල, කුඩහගල ආදී කඳු ඉහළ තැන්හි පිහිටා ඇත.

පෙර රජ දවස රුහුණු, මායා, පිහිටි වශයෙන් බෙදී තිබු සමයක සමන්තකූටය රුහුණට අයත් විය. අරාබි ලේඛකයන් "අල්රහුන්" යන නමින් හැඳින්වූයේ මේ සමනළ කන්දයි. සත්වන සියවස අග භාගයේදී ලක්දිවට පැමිණි වජ්‍රබෝධි හිමියන් සමනළ කන්ද රුහුණට අයත් කඳු ගැටයක් බව චීන වාර්තාවලින් පෙන්වා දෙයි. ඒ සමයෙහි මෙය රෝහණ පබ්බත යැයි ව්‍යවහාර කර තිබුණි. සමනළ කන්ද මුදුන කොණ්ඩ කැවුමක හැඩයක් ගන්නා බැවින් වරක රොබට් නොක්ස් සඳහන් කර තිබුණේ කඳු මුදුන කෝණාකාර හැඩයක් දරන බවයි.

ජල පෝෂිත කඳු අතර සමනළ කඳු වැටියෙන් මහවැලි, කළු, කැළණි, වලවේ ගංගාවල උපත මේ ප්‍රදේශයෙන් ආරම්භ වෙයි. මැයි, ජුනි, ජූලි මාසවල සමනළ අඩවියට ලැබෙන වර්ෂාපතනය මිලි මීටර් 5000 ක් ඉක්මවයි. අඟල් 200 ක් ඉක්මවයි. මේ නිසා වන්දනා ගමන්වලට දැඩි සේ බලපෑම් ඇති කරන බැවින් ඒ කාළය තුළ සිරිපා වැඳීම නතර කෙරේ. දෙසැම්බර්, ජනවාරි, පෙබරවාරි, මාර්තු කාළවල පායන සමය බැවින් සිරිපා වන්දනාව උඳුවප් පොහොයෙන් ඇරඹේ.

සමනළ කන්ද සොබා සෞන්දර්යෙන් යුත් ප්‍රදේශයකි. ඒ සුන්දරත්වය - මනස්කාන්ත දර්ශනවලින් පිරී ඇත. පොත් පත් රැසක්ම මෙම වර්ණනා මහිමය විස්තර කළත් සමනොළ කන්දේ දකින්නට ලැබෙන සොබා සුන්දරත්වය අගය වනමින් ලියවුණ සිංහල සංදේශ කාව්‍ය අතර තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් සැලළිහිණි සංදේශයේ දී සමනොළ පිළිබඳ වර්ණනාව විශේෂ වෙයි.

සුර රද සමන් සමගින් සුරඟන එව ර
පැහැනද මදාරා පරසතු මල් පත ර
කර පුර වඳින රැඳි මුණි සිරිපා තඹ ර
සකිසඳ පෙනේ සමනොළ ගල නැගෙන හි ර

(සැල - 25 වන පද්‍ය)

එසේම ලංකාදීපය සුරූපි ලලනාවකට උපමා කරන සිරි රහල් හිමියෝ සමන්කුල ඇයගේ හිසෙහි බඳින ලද කොණ්ඩය ලෙස වර්ණා කරයි.

සමනොළ මුහුල මහ සමුදුර මෙවුල් බර
සුලකල පුවළ ලකඟන සිරි යොවුන වර

(සැල - 9 වන පද්‍ය)

සමනළ කඳු මුදුනේ සිට සූර්යෝදය නැරඹීම බොහෝ දෙනා තුළ චමත්කාරය ජනිත කරවන සිද්ධියකි. අරුණාලු

වැටෙන විට ඉර පායා ගෙන එන ඒ අපූරු දර්ශනය "ඉර සේවය" යන නමින් හැඳින්වේ. කඳු වැටි හා වලාකුළු අතරින් හිරු උදාවන මේ ස්වභාවික සිද්ධියට ආගමික මුහුණුවරක් දීමට බෞද්ධ බැතිමත්හු පෙළඹෙති. ඔවුන් පවසන්නේ හිරු දෙවියන් දිනපතාම සිරි පතුල වන්දනා කරන බවයි.

විදේශිකයින් බොහෝ දෙනෙක් සිරි පා කඳු මුදුනට නැග ඉර සේවය නරඹා එයින් තම සිත්තුළ ජනිත වූ රස වින්දනාත්මක හැඟීම් වාර්තා කර තැබූහ. සිවිල් සේවකයින් ලියූ දින සටහන්වල පවා එවැනි වාර්තා දක්නට ලැබේ. 1911.01.17 වැනි දින ජී.කුක්සන් මහතා ලියූ සටහනක සිංහල පරිවර්තනය මෙසේ දක්වමි.

"හිරු උදාව" - එයින් මැවෙන රශ්මි මාලාව හා සෙවනැල්ල පිළිබඳව විස්තර කිරීමට පිටු ගණනාවක් අවශ්‍ය වනු ඇත. මෙයට වඩා අලංකාර වූ වෙනත් දර්ශනයක් මම තවම නුදුටුවෙමි. මේ තරම් සුන්දර දර්ශනයක් වෙනත් රටවලදීවත් මා දැක නැත. එය ඒ තරම්ම අලංකාරය. හිරු රැස් නිසා අහස මැණික් දුන්නක සේයාව ගනී. ශිඛරයේ සෙවනැල්ල තියුණු කඳු මුදුනක විලාසය මේ යැයි දක්වමින් විහිදෙයි. මේ වෙලාව අහසේ පවත්නා අලංකාරය අපගේ නෙත් පැහැර ගනී. මේ සියල්ල හදිසියේ පෙනෙන චමත්කාර දර්ශනයකි. තද අඳුර නැමැති විල්ලුදය පොරවා ගෙන සිටින කඳු මුදුන් සුදු වළාකුළු අතරින් දර්ශනය වන්නේ රත් පැහැගත් කොදෙව් සමූහයක් රන් අබරණින් සැරසුණු අන්දම විදහා පාමිනි.

සිරිපා සංචාරයේ යෙදුණු බොහෝ විදෙස් සංචාරකයෝ එහි සොබා සුන්දරත්වය - ඉර සේවය වැනි ස්වාභාවික සිද්ධීන්වල ඇති චමත්කාරය මෙබඳුම විස්තර වාර්තා ලියා තැබූහ. එසේ ලියූ අය අතර දොස්තර ජෝන් ඩේවි, එච්. වේස්, හෙන්රි කේව්, දොස්තර ඒ. නෙල්, ජෝන් ස්ටීල් ආදි අය ප්‍රධාන තැනක් ගනී.

සමනළ සිරිපා වන්දනාවට ප්‍රධාන මාර්ග දෙකකි.

1. රත්නපුර පාර හා

2. හැටන් මාර්ගයයි.

එසේම විවිධ ස්ථානයන්ගෙන් ඇරඹී මේ ප්‍රධාන මාර්ග දෙකට සම්බන්ධවන පාරවල් කීපයක් ඇත. ඒවා අවශේෂ මාර්ග ලෙස සැලකෙයි.

ක්‍රි.ව. 1340 දී ශ්‍රී ලංකාවේ සංචාරය කළ ඉබන් බතූතා සමනළ සිරිපා වන්දනා කිරීමට මාර්ග දෙකක් තිබූ බව සඳහන් කරයි. ඒ මාර්ග දෙක "බබා පාර" හා "මමා පාර" යනුවෙන් සඳහන් කරයි. ඉබන් බතූතා, බබා පාර ලෙස දැක්වූයේ ආදම්ගේ මාවත-නූතන රත්නපුර පාරය. මමා පාර නම් හැටන් පාර ලෙස සැළකේ.

බුදු පියාණන් වහන්සේ තෙවරක් ලක්දිවට වැඩම කළ බව දීපවංශය, මහාවංශය හා සමන්ත පාසාදිකාව, විනය අට්ඨ කතාව වැනි මූලාශ්‍රවල සඳහන් වෙයි. බුදුපියාණන් වහන්සේ ප්‍රථම වරට ලංකාවට වැඩම කරන ලද්දේ මහියංගණයේ යක්ෂ දමනය පිණිසය. මහවැලි නදිය අසබඩ මහානාග වනෝද්‍යානයේ දී පැවැත්වුණු යක්ෂ සමාගමට පැමිණි බුදුරජාණන් වහන්සේ අහසේ සිට යක්ෂයින් දමනය කළ බවත්, ඒ අවස්ථාවේ ඒ අයට දෙසූ දහම් අසා සුමන කූට වාසී සුමන දෙව් රජු සෝවාන් ඵලයට පත් වූ බවත්, මහාවංශය සඳහන් කරයි.

ඒ අවස්ථාවේ සර්වඥයන් වහන්සේගෙන් පූජනීය කිසිවක් දෙන්නැයි ඉල්ලා සිටි සුමන දිව්‍යරාජයාට උන්වහන්සේ තම හිස පිරිමැද කේස ධාතූන් ස්වල්පයක් ප්‍රදානය කළ බවත් එය පිළිගත් සුමන දිව්‍ය රාජයා මහියංගණ ථූපය සත් රියණක් උසට තනවා එහි තැන්පත් කළ බවත් මහාවංශයේ සඳහන් කරයි. එසේම එහිදී සුමන දිව්‍ය රාජයා තම වාස භවනය වන සුමන කූඨයට වඩින ලෙස බුදු පියාණන් වහන්සේට ආරාධනා කළ බවද දැක්වේ.

බුදු පියාණන් වහන්සේ දෙවන වර නාගදීපයටත්, තෙවනවර කැළණියටත් වැඩියහ. කැළණිය වැඩියේ වෙසක් මස පුර පසළොස්වක පෝය දිනකදීය. ඒ අවස්ථාවේ දී රහතන් වහන්සේලා 500 ක් දෙනා සමග සුමන කූඨ පර්වතයට වැඩි බුදුරජාණන් වහන්සේ සිය (වාම) වම් පාද ලාංඡනය එහි පිහිටුවා වදාළ බවත් පසුව පර්වත පාදයේ පිහිටි දිග් වූ ලෙනක් දිවා විහාරණය කොට තවත් ස්ථාන කීපයකටද වැඩම කර දෙව්රම් වෙහෙර බලා පිටත්ව ගිය බවත් මහා වංශයේ සඳහන් වේ. සමනොළ සිරිපා පිහිටුවීමට අමතරව බුදු රජුන්ගේ ශ්‍රී පාද ලාංඡනය තවත් ස්ථාන තුනක පිහිටුවා ඇත. ඒ ස්ථාන නර්මදා නදී තීරය යෝනක පුරේ හා සච්ච භද්ධ පර්වතය ආදිය වෙයි.

බුදු රජුන්ගේ වම් සිරිපා සලකුණ සතු ලක්ෂණ රැසකි. එය මඟුල් ලකුණු 108 කින් සමන්විතය. දෙතිස් මහ පුරුෂ ලක්ෂණ ඒ පා සටහනේ දැක්වෙන බව ඇතැමුන්ගේ මතයයි. සමනොළ කඳු පංතිය ඉතාමත් අලංකාරව පිහිටා ඇති බව කඳු මුදුනේ සිට නරඹන්නන්ට පෙනී යයි. සමනොළ සිරිපා වට කර ගෙන ආරක්ෂක කඳු වළල්ලක් මෙන් අවට කඳු පිහිටා ඇත. ඒ කඳු අතර බෑන සමනොළ, ගවරවිල, කුණු දිය පර්වතය ප්‍රධාන තැනක් ගනු ලැබේ.


**රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, දිසානායක හේරත්**

**හතර ඇළ - හිදෝගම, අනුරාධපුර**

## අතිපූජ්‍ය මහානායක ස්වාමීන්වහන්සේ බැහැ දැකීම සහ මහනුවර බෞද්ධ නියෝජිත හමුව

බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපතිතුමා ඇතුළු කෘත්‍යාධිකාරී මණ්ඩලය 2022-02-26 දින අතිපූජ්‍ය මල්වතු සහ අස්ගිරි මහනායක ස්වාමීන් වහන්සේලා බැහැ දැකීම සහ මධ්‍යම පළාත් ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ. ගමගේ මහතා වෙත බෞද්ධ හිමිකම් කොමිෂන් සභා වාර්තාව පිරිනැමීම සිදු විය.



මහනුවර දිස්ත්‍රික්කයේ බෞද්ධ නියෝජිතයින්ට පුහුණු වැඩමුළුවක් බෞද්ධ කටයුතු පිළිබඳ ජාතික විමර්ශණ මණ්ඩලය විසින් 2022-02-27 වන දින මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්වූ අවස්ථාව.





# සෝතාපත්ති - 2

**පූජ්‍යපාද තලල්ලේ චන්දකිත්ති ස්වාමීන් වහන්සේගේ "සෝතාපත්ති" පොතෙන් උපුටා ගන්නා ලදි.**

ඕනෑම බලාපොරොත්තුවක් සඵල කර ගැනීමට නම් ඊට අදාළ කාරණා සම්පූර්ණ කළ යුතු වෙනවා. මේ ලෝකයෙහි කිසිදු දෙයක් ප්‍රාර්ථනා කළ පමණින් ලැබෙන්නේ නැහැ. එසේ ලැබෙනවා නම් ලෝකයේ මිනිසුනට කිසිදු අඩුවක් තිබෙන්නේ නැහැ. එසේ නම් කිසියම් දෙයකට යමෙක් කැමැති වන්නේ ද, ඒ දේ ලබා ගැනීමට අවශ්‍ය ප්‍රතිපදාව වැඩ පිළිවෙල සම්පූර්ණ කළ යුතු වෙනවා.

සෝතාපත්ති ඵලයට යමෙක් කැමැති වනවා නම් එයට අදාළ කාරණාවලින් යුක්ත වෙන්නේ ඕන. ඒවා සෝතාපත්ති අඞ්ග නමිනුයි හඳුන්වන්නේ, සෝතාපත්ති මාර්ගය ලැබීමට හේතු වන කාරණා සෝතාපත්ති අඞ්ග වශයෙන් හැඳින්වෙන බව දීඝ නිකායට්ඨකථාවේ සඳහන් වෙනවා. (සෝතාපත්ති මග්ගස්ස පටිලාභකාරණානී'ති අතෙථා් සෝතාපතතියඞ්ගානී)

සෝවන්වීමට කැමැති කෙනා විසින් දියුණු කළ යුතු පුරුදු පුහුණු කළ යුතු අංග හතරක් පිළිබඳව ධර්මයෙහි සඳහන් වෙනවා. සංයුක්ත නිකායේ දුතිය සාරිපුත්ත සූත්‍රයේ ඒ පිළිබඳව සඳහන් වී තිබෙනවා. එහිදී බුදුරජාණන් වහන්සේ සැරියුත් මහරහතන් වහන්සේගෙන් සෝතාපත්ති අංග කවරේ දැයි විමසනවා. සැරියුත් මහරහතන් වහන්සේ, "ස්වාමීනි සත්පුරුෂ සංසේවනය හෙවත් කළ්‍යාණ මිත්‍ර සේවනය, සද්ධර්මශ්‍රවණය, යෝනිසෝමනසිකාරය, ධර්මානුධම්මප්‍රතිපන්නවීම සෝතාපත්ති අංග වශයෙන් හඳුන්වනවා" යැයි පිළිතුරු දෙනවා. බුදුපියාණන් වහන්සේ සාධු නාද දී ඒ අදහස අනුමත කරනවා.

(කථමන්නු බෝ සාරිපුත්ත, සෝතාපතියඞ්ගන්ති?
සප්පුරිසසංසේවෝ හි භන්තේ සෝතාපත්තියඞ්ගං,
සද්ධම්මසවණං සෝතාපත්තියඞ්ගං, යෝනිසෝමනසිකාරං
සෝතාපත්තියඞ්ගං, ධම්මානුධම්මපටිපත්ති
සෝතාපත්තියඞ්ගං, සාධු සාධු, සාරිපුත්ත, සාරිපුත්ත
සංසේවෝ හි සාරිපුත්ත සෝතාපත්තියඞ්ගං,
සද්ධම්මසවණං සෝතාපත්තියඞ්ගං, යෝනිසෝමනසිකාරං
සෝතාපත්තියඞ්ගං, ධම්මානුධම්මපටිපත්ති
සෝතාපත්තියඞ්ගං)

මෙම සෝතාපත්ති අංගයන්ගෙන් සමන්විත වී ආර්ය මාර්ග යෙහි ගමන් කරන තැනැත්තාට සෝතාපත්ති ඵලය නම් වූ ලොව්තුරු සුවය විඳිය හැකියි. එසේ කටයුතු කරන තැනැත්තාට සෝතාපත්ති ඵලය නම් වූ ලොව්තුරු සුවය විඳිය හැකියි. එසේ කටයුතු කරන තැනැත්තා ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයෙකු ලෙසින්ද, ඒ ලොව්තුරු මගෙහි නොයන්නා, සෝතාපත්ති අංගයන්ගෙන් සමන්විත වන්නට උත්සාහ නොගන්නා පුද්ගලයා, අශ්‍රැතවත් පෘථග්ජනයා ලෙසින් ද ධර්මයෙහි විස්තර වී තිබෙනවා.

**ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා - සුතවා අරියසාවකෝ**

පළමුව අපි ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයාගේ ලක්ෂණ මොනවාදැයි විමසා බලමු. ත්‍රිපිටකාගත බොහෝ සූත්‍ර දේශනාවල මෙම පුද්ගලයා විස්තර කර ඇති බව දකින්නට ලැබෙනවා. ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයාගේ ප්‍රධාන ලක්ෂණය වන්නේ ඔහු ධර්මය පිළිබඳව බොහෝ ඇසූ පිරූ තැන් ඇතිව, දැනුවත්කමින් යුතුව වාසය කිරීමයි. ඒ දැනුවත්කම ම පදනම් කරගෙන ඔහු මේ කියන ලක්ෂණවලින් යුක්ත වෙනවා. ශ්‍රී සද්ධර්මය ඉතා හොඳින් අසා, කියවා දැනගත් බැවින් සුතවා යන විශේෂණ පදයෙන් හඳුන්වන ආර්ය මාර්ගයට ප්‍රවිශ්ටවීමට කැමැති ආර්ය ශ්‍රාවකයා,

1. අරියානං දස්සාවී - ආර්ය උතුමන් දකිනවා.
2. අරියධම්මස්ස කෝවිදෝ - ආර්ය ධර්මයෙහි දක්ෂයෙක් වෙනවා.
3. අරියධම්මේ සුවිනීතෝ - ආර්ය ධර්මයෙහි හික්මෙනවා.
4. සප්පුරිසානං දස්නාවී - බුද්ධාදී සත්පුරුෂයන් දකිනවා.
5. සප්පුරිස ධම්මස්ස කෝවිදෝ - බුද්ධාදී සත්පුරුෂයන්ගේ ධර්මයෙහි දක්ෂයෙන් වෙනවා.
6. සප්පුරිස ධම්මේ සුවිනීතෝ - බුද්ධාදී සත්පුරුෂයන්ගේ ධර්මයෙහි හික්මෙනවා.

මේ කියන ලක්ෂණයන්ගෙන් යුක්ත වෙන කෙනාටයි ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා කියන්නේ.

ආර්යයන් දකිනවා කියන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීමෙන් විමුක්තිය සලසා ගත් බුදු, පසේ බුදු, මහරහත් මහ උතුමන් සිටියා ය, සිටිනවාය මතුවටත් පහළ වේවිය යන විශ්වාසයෙන් කටයුතු කිරීමයි. එසේ ඒ විශ්වාසය ඇති වූ පසු ඒ උතුමන් අනුගමනය කළ ධර්ම මාර්ගයෙහි ගමන් කරන්න සිත් පහළ වෙනවා. ආර්ය ධර්මය පිළිබඳ දැනුවත් වූ පුද්ගලයා නිසැක ලෙස, ඉතා මැනැවින් ඒ ධර්ම මාර්ගය පිළිපදිනවා. අරියධම්මස්ස කෝවිදෝ, අරියධම්මේ විනීතෝ යනුවෙන් විස්තර කර ඇත්තේ ඒ ස්වභාවයයි. බුද්ධාදී සත්පුරුෂයන්, කල්‍යාණමිත්‍රයන් වැඩි මග ගමන් කිරීමට ඒ උතුමන් කෙරෙහි පැහැදුණු කෙනෙකුට අපහසු වන්නේ නැහැ. එසේ නම් මේ ආර්ය ධර්මයෙහි, මාර්ගයෙහි දක්ෂයෙකු වන්නට, හික්මෙන්නට බුදුපියාණන් වහන්සේ කෙරෙහි කරුණු අවබෝධයෙන් ඇති වන ප්‍රසාදය අත්‍යවශ්‍යයි. ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා කටයුතු කරන්නේ ඒ ප්‍රසාදය ද පදනම් කර ගෙනයි.

**අශ්‍රැතවත් පෘථග්ජනයා - අස්සුතවා පුථුජ්ජනෝ**

අශ්‍රැතවත් පෘථග්ජනයා ශ්‍රී සද්ධර්මය හොඳින් අසා දැන ගත්තෙක් නොවෙයි. ඔහුට ධර්මය පිළිබඳ දැනුමක් නැහැ. ඒ නිසාම බුද්ධාදී ආර්යයන් පිළිබඳව, සත්පුරුෂයන් පිළිබඳව, උන්වහන්සේලා වැඩි මග පිළිබඳ, පුරුදු කරන ප්‍රතිපදාව පිළිබඳව, ප්‍රසාදයක් ඔහුට ඇත්තේ නැහැ. ඒ නිසාම විමුක්තියට නැඹුරු වූ මේ උතුම් ප්‍රතිපදාව පිළිබඳව ඔහුට ඇත්තේ අකැමැත්තක්. ඔහු මේ උතුම් ධර්මය අසනවා තබා ඒ දහම දෙසන අය හෝ දකින්නට කැමැති වන්නේ නැහැ. ශ්‍රී සද්ධර්මය නොදන්නා, සත්‍ය කුමක් දැයි නොසොයන ඔහුට ඒ සද්ධර්මයෙහි පහස විඳින්නට හෝ බුදු, පසේ බුදු, මහරහත් යන උතුම් ආර්යයන්, සත්පුරුෂයන් දකින්නට හෝ අවකාශ සැළසෙන්නේ නැහැ. මෙහි දී දකින්නේ මසැසින් නොව මනසින් බව අප මතක තබා ගත යුතුයි. ධර්මයට අනුව නිසි ලෙස බුදුන් දකිනවා යනු ධර්මය දැකීම බව අවබෝධ කර ගත යුතුයි. (යෝ ධම්මං පස්සති සෝ මං පස්සති. - වක්කාලී සූත්‍රය)

අශ්‍රැතවත් පෘථග්ජනයාගේ ස්වභාවය මෙසේ යි. ඔහු,


1. අරියානං අදස්සාවී - ආර්ය උතුමන් දකින්නේ නැහැ.
2. අරියධම්මස්ස අකෝවිදෝ - ආර්ය ධර්මයෙහි දක්ෂයෙක් නොවෙයි.
3. අරියධම්මේ අවිනීතෝ - ආර්ය ධර්මයෙහි හික්මෙන්නේ නැහැ.
4. සප්පුරිසානං අදස්සාවී - බුද්ධාදී සත්පුරුෂයන් දකින්නේ නැහැ.
5. සප්පුරිසධම්මස්ස අකොවිදෝ - බුද්ධාදී සත්පුරුෂයන් ගේ ධර්මයෙහි දක්ෂයෙක් නොවෙයි.
6. සප්පුරිසධම්මේ අවිනීතෝ - බුද්ධාදී සත්පුරුෂයන්ගේ ධර්මයෙහි හික්මෙන්නේ නැහැ.

ඉතින් මේ ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකභාවයට පත්වන තැනැත්තා ආර්යයන් දැකීමෙන්, දහම් ඇසීමෙන්, ඒ ධර්ම මාර්ගයෙහි හික්මීමෙන් සෝතාපත්ති අංග සම්පූර්ණ කර ගැනීමට දක්ෂයෙක් වෙනවා. මේ සියල්ල සිදු කරන්නේ ශ්‍රද්ධාව පදනම කර ගෙනයි.

දැන් අපි විමසා බලමු ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා සෝතාපත්ති මාර්ගය පිණිස දියුණු කරන කාරණා පිළිබඳව.

**1. සප්පුරිස සංසේවෝ හි සෝතාපත්තියඞ්ගං**

සත්පුරුෂ සංසේවනය, නැතිනම් කළණ මිතුරන් ඇසුරු කිරීම, සෝතාපත්ති මාර්ගයට උපකාර වෙන කාරණයක්. සත්පුරුෂයෙකු සතු ලක්ෂණ පිළිබඳව තව්තිසා වැසියන් අතර පැවැති සංවාදයක් පිළිබඳව සඳහන් වෙනවා. මව්පියන්ට සලකන, කුල දෙටුවන් පුදන, ප්‍රියශීලී, මෘදු මොළොක් වචන කථා කරන, කේළාම් කීමෙන් වැළකුන, මසුරුකමින් තොර, සත්‍යවාදී, ක්‍රෝධය යටපත් කර කටයුතු කරන මනුෂ්‍යයා සත්පුරුෂයෙක් යැයි තව්තිසා දෙව්ලොව දෙවියෝ පවසනවා.



මාතා පෙත්ති භරං ජන්තුං
කුලේ ජෙට්ඨාපචායිනං
සණ්හං සඛිල සම්භාසං
පේසුණෙය්‍යප්පහායිනං
මච්ඡේර විනයේ යුත්තං
සච්චං කෝධාභිභුං නරං
තං වේ දේවා තාවතිංසා
ආහු සප්පුරිසෝ ඉති.

මේ ගාථාවෙහි සඳහන් කරුණු දෙස විමසුම් නුවණින් බලන විට පෙනී යන්නේ මේ ලක්ෂණ ඇති කර ගැනීමට තෙරුවන් කෙරෙහි පැහැදී සිටීම අවශ්‍ය නොවන බවයි. වෙනත් ආගමක් අදහන කෙනෙකුට වුව මේ ගුණාංග ඇති කර ගත හැකියි. වෙනත් ලෙසකින් පවසන්නේ නම් සත්පුරුෂයෝ වෙනත් ආගමික සමාජයක වුව සිටිය හැකියි.

එසේ නම් සෝතාපත්ති අඞ්ගයක් ලෙස සත්පුරුෂ සංසේවනය දක්වා ඇත්තේ කල්‍යාණ මිත්‍රතාවද අදහස් කර ගෙන බව අප තේරුම් ගත යුතුයි. එය වඩාත්ම තේරුම් ගැනීම සඳහා කල්‍යාණ මිත්‍රයා ධර්මයෙහි විස්තර කර ඇති ආකාරය තේරුම් ගත යුතුයි.

**කල්‍යාණ මිත්‍රයා**

1. තමන් ශ්‍රද්ධාවෙහි පිහිටා අනුන්ව ශ්‍රද්ධාවෙහි පිහිටුවයි.
2. තමන් සීලයෙහි පිහිටා අනුන්ව සීලයෙහි පිහිටුවයි.
3. තමන් ත්‍යාගී ගුණයෙහි පිහිටා අනුන් ව ත්‍යාගී ගුණයෙහි පිහිටුවයි.
4. තමන් සම්මාදිට්ඨියෙහි පිහිටා අනුන් ව සම්මා දිට්ඨියෙහි පිහිටුවයි.

යථා රූපානං සද්ධාසම්පන්නානං සද්ධාසම්පදං අනුසික්ඛති, යථා රූපානං සීලසම්පන්නානං සීලසම්පදං අනුසික්ඛති, යථා රූපානං චාගසම්පන්නානං චාගසම්පදං අනුසික්ඛති, යථා රූපානං පඤ්ඤාසම්පන්නානං පඤ්ඤාසම්පදං අනුසික්ඛති, අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ, කල්‍යාණමිත්තතා

(ව්‍යග්ඝපජ්ජ සූත්‍රය - අංගුත්තර නිකාය - අට්ඨක නිපාතය.)

මේ කියන කල්‍යාණ මිත්‍රතාව පිහිටන්නේ බෞද්ධයෙකුට ම

පමණයි. තෙරුවන් විශ්වාස කරන්නේ බෞද්ධයන් පමණයි. ශ්‍රද්ධාව පිහිටන්නේ හැබෑ බෞද්ධයන්ට පමණයි. එසේ නම් සෝතාපත්ති අංගයක්වන සත්පුරුෂ සංසේවනය යනුවෙන් අදහස් කරන්නේ කල්‍යාණ මිත්‍රත්වයෙන් යුතු සත්පුරුෂ ආශ්‍රය බව අප තේරුම් ගත යුතුයි. ලොව වසන සෑම මනුෂ්‍යයෙකුටම අවශ්‍ය නම් ගුණධර්ම පුරා සත්පුරුෂයෙක් විය හැකියි. එහෙත් කල්‍යාණ මිත්‍රයෙක් විය හැක්කේ තෙරුවන් සරණ ගිය, ශ්‍රද්ධාවෙහි පිහිටි බෞද්ධයෙකුටම පමණයි. ඒ අනුව සෑම සත්පුරුෂයෙකු තුළම කල්‍යාණ මිත්‍රයෙකු නැති බවත්, සෑම කල්‍යාණ මිත්‍රයෙකු තුළම සත්පුරුෂ බෞද්ධයෙකු සිටින බවත් තේරුම් ගැනීම වටී. මෙහිදී සත්පුරුෂ සංසේවනය යන වචනයෙන් අදහස් කරන්නේ කල්‍යාණ මිත්‍ර ගුණයන්ගෙන් යුතු සත්පුරුෂයෙකු බව අප අවබෝධ කර ගත යුතුයි.

එසේ නම් නිවන් මගෙහි ගමන් කිරීමට අපට උපදෙස් දෙන කල්‍යාණ මිත්‍ර සත්පුරුෂයන් වන්නේ කවුද? බුද්ධ, ධම්ම සංඝ යන තෙරුවන් හැරුන විට ඒ අමා නිවනට මග පෙන්වන, අපේ ඇසුරට සුදුසු වෙනත් කවරෙක් නම් වේ ද? මෙහි අදහස් කරන සත්පුරුෂ සංසේවනය කියන්නේ තෙරුවන් සරණ යාමයි. ශ්‍රද්ධාවෙහි පිහිටීමයි. බුදුරජාණන් වහන්සේට වඩා උතුම් කල්‍යාණ මිත්‍රයෙක් අපට වෙනත් නම් කොයින්ද? ධර්මය, ආර්ය මහා සංඝරත්නය හැර උතුම් වන වෙනත් සත්පුරුෂයෝ, කල්‍යාණ මිත්‍රයෝ බෞද්ධ වූ අපට සිටිත්ද? නොවේ මැයි. ඒ තෙරුවන් ඇසුරු කිරීම, තමන්ගේ ජීවිතයට මාර්ගෝපදේශකයන් සේ සලකා කටයුතු කිරීම සෝවන්වීමට උපකාර වන මූලික ම අඞ්ගයයි. තෙරුවන් සරණ නොගිය, බෞද්ධයෙකු නොවන, ශ්‍රද්ධාවෙහි නොපිහිටූ කිසිවෙකුට සෝතාපත්ති මාර්ගයට, ඵලයට පත්විය නොහැකිමයි.

**2. සද්ධම්මසවණං සෝතාපත්තිඞ්ගං**

බුදුරජාණන් වහන්සේ නමැති මහා කල්‍යාණ මිත්‍රයා, උතුම් සත්පුරුෂයාණන් වහන්සේ ලොව පහළ නොවූයේ නම් ඒ උතුම් ශ්‍රී සද්ධර්මයේ පහස කෙලෙස නම් ලබන්නද? සද්ධර්මය ලොව පහළ වන්නේත් කල්‍යාණ මිත්‍රයන් නිසායි. සද්ධර්මය ලොව පවතින්නේත් කල්‍යාණ මිත්‍රයන් නිසායි. සද්ධර්මය අසන්නට ලැබෙන්නේත් කල්‍යාණ මිත්‍රයන් නිසායි.

සද්ධර්මය ශ්‍රවණය දෙවන සොතාපත්ති අඞ්ගයයි. බණ ඇසීමෙන් සිදු වන්නේ ධර්ම ඥාණය දියුණු වීමයි. ධර්ම ශ්‍රවණය කිරීමේ අනුසස් පහක් ධර්මයෙහි විස්තර කර තිබෙනවා.

1. අස්සුතං සුණාති - නො ඇසූ දේ අසන්නට ලැබෙනවා.
2. සුතං පරියෝදපේති - ඇසූ දේ වඩ වඩාත් පිරිසිදුව වැටහෙනවා.
3. කඞ්ඛං විතරති - සැක දුරු වෙනවා.
4. දිට්ඨිං උජුං කරෝති - නිවැරදි දෘෂ්ටියක පිහිටනවා. දෘෂ්ටිය සෘජු වෙනවා.
5. චිත්තමස්ස පසීදති - සිත පැහැදෙනවා.

බණ පොත් කියවීම, ඇසීම, බැලීම ආදී මේ සියල්ලම සද්ධර්ම ශ්‍රවණය කියන සෝතාපත්ති අඞ්ගයට අයත් වෙනවා. මේ සියල්ලෙන්ම සිදු කරන්නේ ධර්මය පිළිබඳ දැනුම වැඩි දියුණු කරන එකයි. ඕනෑම කාරණයක් පිළිබඳව සැක සංකාවන්, විචිකිච්ඡාවන් සිත තුළ පහළ වන්නේ ඒ ඒ කාරණා පිළිබඳව හරි හැටි නොදන්නා නිසයි. ධර්මය පිළිබඳව, සත්ත්වයා පිළිබඳව, මෙලොව පරලොව පිළිබඳව, කර්ම විපාක පිළිබඳව වුණත් සැක සංකා පහළ වන්නේ ධර්මය පිළිබඳ මනාකොට නොදන්නා නිසයි. එසේ නම් විචිකිච්ඡාව නැති කර ගැනීමට සද්ධර්ම ශ්‍රවණය උපකාර වෙන බව අප තේරුම් ගත යුතුයි. විචිකිච්ඡාව සෝතාපත්ති ඵලයේදී නැති වන ක්ලේශ ධර්මයක්. ඒ ක්ලේශ ධර්මය නැති කර ගැනීමට ධර්ම ශ්‍රවණය යන සෝතාපත්ති අඞ්ගය උපකාර වෙන බව තේරුම් ගැනීමට දැන් අපට පහසුයි.

**3. යෝනිසෝමනසිකාරං සෝතාපත්තියඞ්ගං**

සෝවන් මග යන තැනැත්තා විසින් ඊළඟට දියුණු කළ යුතු කාරණය වන්නේ යෝනිසෝ මනසිකාරයයි. යෝනිසෝ මනසිකාරය කියන්නේ නුවණින් විමසා බැලීමයි. ශ්‍රුතවත් ආර්ය ශ්‍රාවකයා නිතරම කටයුතු කරන්නේ නුවණින් විමසා බැලීමෙන් පසුවයි. අශ්‍රුතවත් පෘථග්ජනයා එසේ නුවණින් විමසා බලා කටයුතු කරන්නේ නැහැ. එයට කියන්නේ අයෝනිසෝමනසිකාරයෙන් කටයුතු කරනවා කියායි. ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා යෝනිසෝමනසිකාරයෙන් කටයුතු කරන අයුරුත්, අශ්‍රුතවත් පෘථග්ජනයා අයෝනිසෝමනසිකාරයෙන් කටයුතු කරන අයුරුත් මජ්ඣිම නිකායේ සබ්බාසව සූත්‍රයෙහි දී බුදුරජාණන් වහන්සේ විසින් මනා ලෙස විස්තර කර තිබෙනවා.

යෝනිසෝ මනසිකාරයෙන් කටයුතු කරන නිසා ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයාට,

1. නුපන් ආශ්‍රවයන් උපදින්නේ නැහැ.
2. උපන් ආශ්‍රවයන්ද ප්‍රහීණවී යනවා.

මෙහිදී නුපන් ආශ්‍රව වශයෙන් දක්වන්නේ සිත තුළ කාලාන්තරයක් තිස්සේ තැන්පත් වීම නිසා පල් වී ගිය අනුසය නැත්නම් නිදාගෙන මෙන් සිටින්නා වූ ක්ලේශ ධර්මයන්ටයි. උපන් ආශ්‍රව වශයෙන් දක්වන්නේ සිත ඇතුළෙහි නැගෙමින්, කැකෑරෙමින් තිබෙන ක්ලේශ ධර්මයන්ටයි.

යෝනිසෝමනසිකාරයෙන් කටයුතු කරන ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා,

1. සිහි කළ යුතු ධර්ම දන්නවා - මනසිකරණීයේ ධම්මේ පජානාති.

2. සිහි නොකළ යුතු ධර්ම දන්නවා - අමනසිකරණීයේ ධම්මේ පජානාති.

එසේ දන්නා බැවින් ඔහු,

1. යම් ධර්මයක් සිහි කිරීමෙන් නූපන් කාමාශ්‍රවයන් නූපදී ද, උපන් කාමාශ්‍රව ප්‍රහීණ වේද, ඒ ධර්මය සිහිකරනවා.
2. යම් ධර්මයක් සිහි කිරීමෙන් නූපන් භව ආශ්‍රවයන් නූපදී ද, උපන් භව ආශ්‍රවයන් ප්‍රහීණ වේ ද, ඒ ධර්මය සිහිකරනවා.
3. යම් ධර්මයක් සිහි කිරීමෙන් නූපන් අවිජ්ජා ආශ්‍රවයන් නූපදී ද, උපන් අවිජ්ජා ආශ්‍රවයන් ප්‍රහීණ වේ ද, ඒ ධර්මය සිහිකරනවා. ඒ ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයාගේ යෝනිසෝමනසිකාරයේ ස්වභාවයයි.

එසේ ම, ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා.

1. යම් ධර්මයක් මෙනෙහි කිරීමෙන් නූපන් කාමාශ්‍රවයන් උපදී ද, උපන් කාමාශ්‍රවයන් වැඩි දියුණුවේ ද, එය සිහි නොකළ යුතු ධර්මයක් සේ දැන සිහි නොකර සිටිනවා.
2. යම් ධර්මයක් මෙනෙහි කිරීමෙන් නූපන් භව ආශ්‍රවයන් උපදී ද, උපන් භව ආශ්‍රවයන් වැඩි දියුණු වේ ද, එය සිහි නොකළ යුතු ධර්මයක් සේ දැන සිහි නොකර සිටිනවා.
3. යම් ධර්මයක් මෙනෙහි කිරීමෙන් නූපන් අවිජ්ජා ආශ්‍රවයන් උපදී ද, උපන් අවිජ්ජා ආශ්‍රවයන් වැඩි දියුණු වේ ද, එහි සිහි නොකළ යුතු ධර්මයක් සේ දැන සිහි නොකර සිටිනවා.

මෙය ද, ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයාගේ යෝනිසෝමනසිකාරයේ ස්වභාවයක්.

“සුතවා ච බෝ භික්ඛවේ අරියසාවකෝ ආරයානං දස්සාවී, අරියධම්මස්ස කෝවිදෝ, අරියධම්මේ සුවිනීතෝ, සප්පුරිසානං දස්සාවී, සප්පුරිසධම්මස්ස කෝවිදෝ, සප්පුරිස ධම්මේ සුවිනීතෝ, මනසිකරණීයේ ධම්මේ පජානාති, අමනසිකරණීයේ ධම්මේ පජානාති.”





සෝ මනසිකරණීයේ ධම්මේ පජානන්තෝ, අමනසිකරණීයේ ධම්මේ පජානන්තෝ, යේ ධම්මා න මනසිකරණීයා තේ ධම්මේ න මනසිකරෝති. යේ ධම්මා මනසිකරණීයා තේ ධම්මේ මනසිකරෝති."

මේ ආකාරයෙන්ම අශ්‍රැතවත් පෘථග්ජනයා අයෝනිසෝ මනසිකාරයෙන් කටයුතු කරන ආකාරය දක්වා තිබෙනවා. අයෝනිසෝ මනසිකාරයෙන් කටයුතු කරන අශ්‍රැතවත් පෘථග්ජනයා,

1. සිහිකළ යුතු ධර්ම දන්නේ නැහැ - මනසිකරණීයේ ධම්මේ නප්පජානාති.
2. සිහි නොකළ යුතු ධර්ම දන්නේ නැහැ - අමනසිකරණීයේ ධම්මේ නප්පජානාති.

එසේ නොදන්නා බැවින්, ඔහු


1. යම් ධර්මයක් මෙනෙහි කිරීමෙන් නූපන් කාමාශ්‍රවයන් උපදී ද, උපන් කාමාශ්‍රවයන් වැඩි දියුණු වේ ද, ඒ ධර්මය සිහි කරනවා.
2. යම් ධර්මයක් මෙනෙහි කිරීමෙන් නූපන් භවාශ්‍රවයන් උපදී ද, උපන් භවාශ්‍රවයන් වැඩි දියුණු වේ ද, ඒ ධර්මය සිහි කරනවා.
3. යම් ධර්මයක් මෙනෙහි කිරීමෙන් නූපන් අවිජ්ජාශ්‍රවයන් උපදී ද, උපන් අවිජ්ජාශ්‍රවයන් වැඩි දියුණු වේ ද, ඒ ධර්මය සිහි කරනවා.

එසේම අශ්‍රැතවත් පෘථග්ජනයා,

1. යම් ධර්මයක් මෙනෙහි කිරීමෙන් නූපන් කාමාශ්‍රවයන් නූපදී ද, උපන් කාමාශ්‍රවයන් ප්‍රහීණ වේ ද, ඒ ධර්මය සිහි කරන්නේ නැහැ.
2. යම් ධර්මයක් මෙනෙහි කිරීමෙන් නූපන් භවාශ්‍රවයන් නූපදී ද, උපන් භවාශ්‍රවයන් ප්‍රහීණ වේ ද, ඒ ධර්මය සිහි කරන්නේ නැහැ.
3. යම් ධර්මයක් මෙනෙහි කිරීමෙන් නූපන් අවිජ්ජා ආශ්‍රවයන් නූපදී ද, උපන් අවිජ්ජා ආශ්‍රවයන් ප්‍රහීණ වේ ද, ඒ ධර්මය සිහි කරන්නේ නැහැ.

මෙසේ සිහි කළයුතු දේ සිහි නොකරන නිසා, සිහි නොකළ යුතු දේම සිහි කරන නිසා අශ්‍රැතවත් පෘථග්ජනයාට ඇත්ත ඇති සැටියෙන් වැටහෙන්නේ නැහැ. ඔහුට සත්‍යාවබෝධය කර ගැනීම ඉතා අපහසු කාර්යයක් වෙනවා.

ඒ නිසා යෝනිසෝමනසිකාරයෙන් කටයුතු කිරීම ධර්මය අවබෝධ කර ගැනීමේ දී අත්‍යවශ්‍ය අංගයක් බව අප වටහා ගත යුතුයි. පඤ්චුපාදානස්කන්ධය පිළිබඳව ඇත්ත ඇති සැටියෙන් වටහා ගත හැක්කේ සිහි නුවණින්, යෝනිසෝමනසිකාරයෙන් ඒ දෙස බැලීමෙන් පමණයි. යෝනිසෝමනසිකාරය සෝතාපත්ති අංග අතර ප්‍රබලම අංගය වන්නේ සත්‍යය දැකීමට එය අත්‍යාවශ්‍යම අංගයක් වන නිසයි.



**4. ධම්මානුධම්මපටිපත්ති සෝතාපත්තියඞ්ගං.**

ධර්මානුධර්ම ප්‍රතිපන්න වීම ඊළඟ සෝතාපත්ති අංගයයි. බුදුරජාණන් වහන්සේ විසින් පෙන්වා වදාළ ශික්ෂණ ක්‍රමයෙහි හික්මීම ධර්මානුධර්ම ප්‍රතිපන්නවීම වශයෙන් හඳුන්වන්න පුළුවන්. නිවන් සුව අත් විඳින්නට නම් සිත, කය, වචනය යන තුන්දොර සංවර කර ගත යුතුමැයි. ඒ සඳහා තමයි බුදුරජාණන් වහන්සේ ත්‍රිශික්ෂාවක් දේශනා කර තිබෙන්නේ. සීල, සමාධි, ප්‍රඥා කියන්නේ ඒ ත්‍රිශික්ෂාවටයි.

සීලයෙන් සිදු කරන්නේ කයත් වචනයත් සංවර කිරීමයි. කයත් වචනයත් සංවර කර ගැනීමට බුදුපියාණන් වහන්සේ විසින් පෙන්වා වදාළ සීලය කොටස් හතරකට බෙදා දක්වන්න පුළුවන්.

1. ප්‍රාතිමෝක්ෂ සංවර සීලය
2. ඉන්ද්‍රිය සංවර සීලය
3. ප්‍රත්‍ය සන්නිශ්‍රිත සීලය
4. ආජීව පාරිශුද්ධි සීලය - කියන්නේ ඒ හතරටයි.

ප්‍රාතිමෝක්ෂ සංවර සීලය කියන්නේ සංඝයා වහන්සේගේම, ශ්‍රාවකයාගේම පහසුව පිණිස, යහපත පිණිස, ආරක්ෂාව පිණිස මේ මේ දේ නොකළ යුතුයි ආදී වශයෙන් පණවන ලද ශික්ෂාපද සමූහයයි. එය හොඳින් ආරක්ෂා කිරීම කෙනෙකුගේ කය, වචනය රැක ගැනීමට උපකාර වන්නා සේ ම මානසික සහනය සහ සිතෙහි එකඟතාවටත් උපකාර වෙනවා. ඒ එකගතාවම තමයි ඇත්ත ඇති සැටියෙන් දැකීමට උපකාර වන්නේ.

ඉන්ද්‍රිය සංවර සීලය කියන්නේ ඇස, කන, නාසය, දිව, ශරීරය යන ඉන්ද්‍රියයන් සංවර කර ගැනීමයි. ඉන්ද්‍රියයන් සංවර කරනවා කියන්නේ ඒවාට ගොදුරු වන අරමුණු පසු පස්සේ ගමන් කරන්නට හිතට අවකාශ සළසා නොදීමයි. සාමාන්‍යයෙන් පෘථග්ජන පුද්ගලයා ඇසට රූප ගොදුරු වුණාම, කනට ශබ්ද ගොදුරු වුණාම, නාසයට ගඳ සුවඳ ගොදුරු වුණාම, දිවට රස ගොදුරු වුණාම, කයට ස්පර්ශ ගොදුරු වුණාම, ඒ ගොදුරු වුණු අරමුණු පසු පස්සේ සිත මෙහෙයවනවා. එයින් වන්නේ සිත අවුල් වී යාමයි. එසේම එබඳු අරමුණුවලට තව තවත් ආශා කරන්නට යාම තුළ ඒවා ලබා ගන්නට උත්සාහවත් වෙනවා. ඒ උත්සාහය තුළ විවිධ කායික හා වාචසික වැරදි කරන්නටත් පෙළඹෙනවා. එය කායික හා වාචසික සංවරය හෙවත් සීලයට බාධාවක්. ඒ නිසා ඉන්ද්‍රිය ගෝචර වන අරමුණුවල අනවශ්‍ය ලෙස ඇලෙන්නේ ද නැතිව, ගැටෙන්නේ ද නැතිව ඒවා පරිහරණය කරන ලෙසයි බුදුපියාණන් වහන්සේ අපට උපදෙස් දී තිබෙන්නේ. (චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හෝහි) මේ ලෙසින් ඉන්ද්‍රිය ගෝචර අරමුණු නුවණින් දැක පරිහරණය කිරීම, ඒවාට නොඇලී, නොගැටී සිටීම කායික හා වාචසික සංවරයට උපකාරයක්.

ප්‍රත්‍යසන්නිශ්‍රිත සීලය කියන්නේ සිවුපස පරිභෝගයේදී සිහි නුවණ මෙහෙයවා කටයුතු කිරීමයි. සිවුපසය කියන්නේ මනුෂ්‍යයෙකුට ජීවත්වීමට අත්‍යාවශ්‍යම කාරණා හතරකටයි. ස්වාමීන් වහන්සේ නමකට නම් 1. චීවර 2. පිණ්ඩපාත 3. සේනාසන 4. ගිලන්පස, බෙහෙත්, ගිහි කෙනෙකුට නම් 1. ඇඳුම් - පැළඳුම් 2. ආහාර 3. නිවාස 4. බෙහෙත් වශයෙන් ඒ හතර දක්වන්න පුළුවන්.

ජීවත්වීමට අත්‍යවශ්‍ය වන මේ කාරණා පරිහරණයේ දී පවා ඒවාට අනවශ්‍ය ලෙස ඇළී ගැළී කටයුතු කරන්නට එපා යන්නයි බුදු පියාණන් වහන්සේගේ උපදේශය. මේවාට අනවශ්‍ය ලෙස ඇලෙන්නට, බැඳෙන්නට ගියහොත් වන්නේ ඒවා ලබා ගැනීමේදී විවිධ කායික හා මානසික නො මනා ක්‍රියාකාරකම්වලට හුරු වන්නට වීමයි. එය සංවරයට බාධාවක්. එසේ නොමැති ව යමෙක් සිහි නුවණින් විමසා මෙම සිවුපසය පරිභෝග කරයිද, එය ඒ තැනත්තාගේ කායික හා වාචසික සංවරයටද, මානසික සංවරයටද උපකාරී වෙනවා.

ඊළඟට ආජීව පාරිශුද්ධි සීලය, ආජීව පාරිශුද්ධි ශීලය කියන්නේ තමන්ගේ ජීවිකාව පිරිසිදු, පව් නොපිරෙන එකක් කර ගැනීමයි. ඇතැමෙක් ජීවත් වෙනු පිණිස විවිධ නොපනත්කම් කරනවා, දුරාචාරයෙහි යෙදෙනවා. බොහෝ දෙනා සැපය සොයා ගොස් සතුට නැති කරනවා. ඉන්ද්‍රියයන් පිනවීමට අවශ්‍ය අරමුණු හෙවත් සැපය මුදළට ගන්න පුළුවන්. නමුත් සතුට එහෙම මිළ දී ගැනීමට හැකි දෙයක් නොවේ. බොහෝ දෙනා සැපය වෙනුවෙන් ආධ්‍යාත්මිකව ලැබෙන සතුට නැති කර ගන්නවා. වැරදි ජීවන උපාය මාර්ගයන්ගෙන් මුදල් හම්බ කරන්නට යනවා. එය කායික සංවරයට බාධාවක්. මානසිකවත් වේදනාවක්. මිථ්‍යා ආජීවයෙන් මුදල් හම්බ කරන්නේ නැතිව ධර්මානුකූලව මුදල් හම්බ කිරීමේ ක්‍රමයක්ද තිබෙනවා. තමන් ගන්නා වැටුපට සරිලන සේ කායිකව හෝ මානසික ව වෙහෙසී, තම බාහු බලයෙන් ධර්මානුකූලව ධනය උපයන්න පුළුවන්. (සේදාවක්ඛිත්තෙහි, බාහාබල පරිච්තේහි, ධම්මිකේහි ධම්ම ලද්ධේහි භෝගේහි) එසේ කටයුතු කිරීම ආජීව පාරිශුද්ධි සීලයයි.

මේ කියන චතුපාරිශුද්ධි සීලයෙන් සිල්වත්වෙන කෙනාගේ කය වචනය සංවරයි. සීල කියන්නේ ඒ සංවරකමටයි. විවිධ අරමුණු පසු පස්සේ දුවන හිත එක අරමුණක සංවර කර ගැනීම සමාධියයි. විදසුන් නුවණින් කෙලෙසුන් නැති කර දැමීම ප්‍රඥාවයි. මේ ලෙසින් සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂාවෙහි හික්මීමෙන් බුදුරජාණන් වහන්සේ විසින් පෙන්වා වදාළ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කිරීම තමයි ධම්මානුධම්ම ප්‍රතිපන්න වෙනවා කියන්නේ.

මේ අප දැනගත්තේ සෝවාන්වීමට උපකාර වන අඞ්ගයි. මේ කාරණාවන්ගෙන් යුක්ත වෙන කොට, කෙනෙකුට ලෝකය පිළිබඳ යථාර්ථය දැකීමේ අවකාශ සැලසෙනවා. මේ කාරණාවන්ගෙන් යුක්ත වන කෙනා එහි ප්‍රතිඵලයක් වශයෙන් සත්‍යාවබෝධයේ ප්‍රථම පියවර ලෙසින් දර්ශනයෙන් ප්‍රහාණය කළ යුතු කෙලෙස් ප්‍රහාණය කරනවා.

---

පුණ්‍යානුමෝදනාත්මක ස්තූතිය.


බෞද්ධාලෝක සඟරාව ධර්මදානයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට, ලාභාපේක්ෂාවෙන් තොරව, අවස්ථාව සලසා දුන් රජයේ මුද්‍රණාලයාධිපතිනි

**ගංගානි ලියනගේ මහත්මියට**

හා එයට සහයෝගය දැක්වූ මුද්‍රණාලයීය

**කාර්ය මණ්ඩලයට**

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ගෞරවය හා පුණ්‍යානුමෝදනාත්මක ස්තූතිය පුද කරමු.



## මිහිඳු හිමියන් දෙවියන් උදෙසා දේශනා කළ

# සමචිත්ත පරියාය සූත්‍රය....

ශාස්ත්‍රපති පූජ්‍ය නාගදීපේ
විමලබුද්ධි ස්වාමීන් වහන්සේ
කොළඹ 05,
ඉසිපතන මහා විද්‍යාලයේ ධර්මාචාර්ය

මිහින්තලා කඳු මුදුනේදී මිහිඳු මහ රහතන් වහන්සේ ඇතුළු ධර්මදූත පිරිසට මෙරට රාජ්‍ය පාලකයා වූ දේවානම් පියතිස්ස නිරිඳු මුණ ගැසීමෙන් පසු ඒ පිරිස තෙරුවන් සරණ ගිය පසු පංච ශීලයෙහි පිහිටුවීම මිහිඳු මාහිමිපාණන් වහන්සේ අතින් සිදු කෙරිණි. ඉන් අනතුරුව රජු ඇතුළු පිරිසට චුල්ල හත්ථි පදෝපම සූත්‍රය දේශනා කළහ.

මෙහි දී මිහිඳු මහ රහතන් වහන්සේ අතින් පැවිද්ද ලැබූ භණ්ඩුක රාජ උපාසකතුමා රහත් බව ලැබීය. එහිදී එම ධර්මදූත පිරිසේ සුමණ සාමණේරයන් ඇමතූ මිහිඳු මහ රහතන් වහන්සේ ධර්ම දේශනාවක් පැවැත්වීම සඳහා කාළ ඝෝෂා කරන ලෙස නියම කළේය.

එය ඇසූ සුමණ සාමණේර හිමියන් "ස්වාමිනී", කාළ ඝෝෂාව සහශ්‍රී ලෝක ධාතුවට ඇසෙන තරම් කරම්ද? නැතහොත් මේ මුළු සක්වළට ඇසෙන තරම් කරම්දැයි විමසීය.

එවිට මිහිඳු මහ රහතන් වහන්සේ වදාරන්නේ සුමණ සාමණේරයෙනි,ධර්ම ශ්‍රවණය සඳහා කාළඝෝෂාව මේ මුළු ලංකාවට ඇසෙන සේ කරවයි කීය. ඒ බස් ඇසූ සුමණ හිමියෝ අභිඥා පාදක චතුර්ථ ධ්‍යානයට සමවැදී ඉන් නැගී සිටියහ.........

"ධම්මසවන කාලෝ අයං භදන්තා"..... යනුවෙන් පින්වත්නි, මේ ධර්මය ඇසීමට කාළයයි...... කියා තෙවරක් කාලඝෝෂා කළහ. ඒ කාළඝෝෂාව ඇසූ භූමාටු දෙවියන්ද එසේ කළහ. ඒ කාළඝෝෂාව දෙවියන්ගෙන් බ්‍රහ්මයන්ට ද ඇසිණි. ඒ නිසා ධර්මය ශ්‍රවණය කිරීමට අසංඛ්‍ය - සංඛ්‍යාත දෙවිවරු එහි රැස් වූහ. මෙසේ රැස්වූ දෙව් පිරිසට මිහිඳු හිමියෝ සමචිත්ත පරියාය සූත්‍රය දේශනා කළහ.

එය සූත්‍ර පිටකයේ අංගුත්තර නිකායේ දුක නිපාකයේ පඨම පණ්ණාසකයේ සිව්වැනි සමචිත්ත වර්ගයෙහි පස්වන සූත්‍රයයි. සමචිත්තා ධ්‍යාශයන් ඇති දෙවිවරුන්ට දේශනා කළ නිසා "සමචිත්ත පරියාය" සූත්‍රය වශයෙන් මේ සූත්‍රය නම් කෙරිණි. මෙම සූත්‍රය මුල් කොටස සැරියුත් තෙරුන් වහන්සේ විසින් දේශනා කළ අතර අග කොටස බුදු රජාණන් වහන්සේ විසින් දේශනා කළ හෙයින් එය බුද්ධ භාෂිතයකි.

එදා අසූ මහ ශ්‍රාවකයන් වහන්සේලා ශ්‍රාවක පිරිස් සමග මෙම සූත්‍රය ශ්‍රවණය කළ බවත් කොසොල් රජුද තම පිරිවර සමග ධර්මය ශ්‍රවණය කිරීම සඳහා පූර්වාරාම විහාරස්ථානයට ගිය අයුරුත් සැවැත් නුවර සිටි කෝටි සංඛ්‍යාත පිරිසක් මෙය ශ්‍රවණය කළ බවත් සඳහන් වෙයි.

එහි වර්තමාන කතාව නම් දහම් ඇසීමට කැමැති දෙවියකු බුදුහිමි වැඩ විසූ පූර්වාරාමයට අරක්ගෙන සිටියේය. එම දෙවියන් සැරියුත් හිමියන් සමචිත්ත පරියාය සූත්‍රය දේශනා කිරීමට ආරම්භ කළ කල්හි,මෙම සූත්‍ර දේශනාව විදර්ශනාව පිළිබඳ දහමක් බවත්,ලක්‍ෂ සංඛ්‍යාත දෙව් පිරිසක් මාර්ග ඵල ලබන බවද,එමෙන්ම මිනිසුන්ට වන යහපත අපමණ යැයි සිතා,මහත් හඬින් සාදුකාර දුන්නේය. ඒ හඬ අකනිටා බඹලොව දක්වා පැතිර ගියේය. ඒ සාදු නාද හඬ අසා සියළු දෙව්-බඹහු සාදුකාර දෙමින් පූර්වාරාමයේ සිට සක්වල කෙළවර දක්වා දස දහස් සක්වළ දෙව් බඹ පිරිසෙන් පිරී ඉතිරී ගියේය.

එක් දවසක් බුදු පියාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාම විහාරස්ථානයේ වැඩ වෙසෙන සමයක ඒ ආසන්නයේ පිහිටි පූර්වාරාමයේ වැඩ විසූ සැරියුත් හිමියන් භික්‍ෂූන් වහන්සේලා අමතා අධ්‍යාත්ම සංයෝජන ඇති පුද්ගලයා හා බාහිර සංයෝජන ඇති පුද්ගලයා දෙසටයි කියා දේශනාව කර ඇත. ඇවැත්නි අධ්‍යාත්ම සංයෝජන ඇති පුද්ගලයා කවරේද? ඇවැත්නි, මේ ශාසනයේ මහණ තෙමේ සිල්වත් වෙයි. ප්‍රාතිමෝක්‍ෂ සංවර සීලයෙන් යුක්ත වූයේ ආචාර ගෝචර සම්පන්න වූයේ වෙසෙයි. කුඩා වරදක් වුවද බිය දන්නා සුළු වූයේ ශික්‍ෂා පදයන් සමාදන්ව නික්මෙයි. හෙතෙමේ එක්තරා ශාන්ත චිත්ත විමුක්තියට පැමිණ වාසය කරයි. හෙතෙම කය බැඳීමෙන් මරණින් මතු එක්තරා දේව නිකායකට එළඹෙයි. හෙතෙම එයින් චුත වූයේ මේ මිනිස් බවට නොඑන්නේ බාහිර සංයෝජන ඇති අනාගාමී පුද්ගලයා යයි කියනු ලැබේ.

ඇවැත්නි තවත් අයෙක් ගැන කියමි. මහණ තෙමේ සිල්වත් වෙයි. ශික්‍ෂාපදයන් සමාදන්ව නික්මෙයි. හෙතෙම කාමයන්ගේ කළකිරීම පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි. හොතම ත්‍රිවිධ භවයන්ගේම කළකිරීම පිණිස විරාගය පිණිස, නිරෝධය පිණිස පළිපන්නේ වෙයි. හෙතෙම භව ලෝභය ක්‍ෂය කිරීම පිණිස පිළිපන්නෝ වෙයි. හෙතම කය බැඳීමෙන් මරණින් මත්තෙහි එක්තරා දේව නිකායක උපදී. හේ එයින් චුත වූයේ මේ මිනිස් බවට නොඑන්නේ අනාගාමී වෙයි. ඇවැත්නි,මේ මිනිස් බවට නොපැමිණ අනාගාමීන් බාහිර සංයෝජන ඇති පුද්ගලයායි කියනු ලැබේ.

මේ දේශනාව අසා සිටි සමසිත් ඇති දෙවිවරු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹී භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසක හිඳ ඒ දෙවිවරු භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළහ.

''ස්වාමීනී,මේ ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ පූර්වාරාම විහාරස්ථානයෙහි භික්‍ෂූන්ට අධ්‍යාත්ම සංයෝජන ඇති පුද්ගලයා ද,බාහිර සංයෝජන ඇති පුද්ගලයා ද දේශනා කරති. ස්වාමීනි පිරිස සතුටු වූහ. ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා කොට සාරිපුත්‍රයන් වහන්සේ වෙත එළඹෙන සේක නම් මැනව;''

එවිට තුෂ්ණිම්භාවයෙන් ඉවසූ සේක. දෙවිවරුන්ගේ මේ කියමන නිසා දිවසින් දැක පූර්වාරාමයට වැඩියහ. එවිට එතැන භාග්‍යවතුන් වහන්සේට පැනවූ ආසනයෙහි වැඩ හුන්හ. ආයුෂ්මත් සැරියුත් හිමියෝ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්හ. එසේ එකත් පසක හුන් සැරියුත් හිමියන්ට භාග්‍යවතුන් වහන්සේ සමසිත් ඇති දෙවියන්ගේ අයැදීම සැල කළහ.

ශාරිපුත්‍රය, ඒ දෙවියෝ දස දෙනෙක්වද, විසි දෙනෙක්වද, තිස් දෙනෙක්වද, හතළිස් දෙනෙක්වද, පනස් දෙනෙක්වද, හැට දෙනෙක්වද, හිඳිකටු තුඩක් වැද වටිනා පමණ තැන්හි සිටිති. එහෙත් ඔවුනොවුන් නොපෙළති. ශාරිපුත්තය, තොපට මෙබඳු සිත් විය හැකිය. යම් හෙයකින්, ඒ දෙවිවරු දස දෙනෙක්වද,විසි දෙනෙක්වද, තිස් දෙනෙක්වද, හතළිස් දෙනෙක්වද, පනස් දෙනෙක්වද, හැට දෙනෙක්වද, හිඳිකටු තුඩක් වැද සිටිනා තැන්හි සිටිත්ද එහෙයින් ඔවුනොවුන් නොපෙළත් ද ඒ දෙවියන් ඒකාන්තයෙන් ඒ රූප භාවයෙහිදී එසේ සිත වඩනා ලද්දේය.

ශාරිපුත්‍රයෙනි,මෙය මෙසේ නොදත යුතුය. ශාරිපුත්‍රය,යම් හෙයකින් ඒ දෙවියෝ දස දෙනෙක්වද, විසි දෙනෙක්වද, තිස් දෙනෙක්වද, හතළිස් දෙනෙක්වද, පනස් දෙනෙක්වද, හිඳිකටු තුඩක් වැඳ සිටිනා පමණ තැන්හිදු සිටිත් ද එහෙත් උනුන් නොපෙළත් ද මේ සස්නෙහිදීම ඒ දෙවියන් විසින් එසේ සිත වඩනා ලදී. ශාරිපුත්‍රය තොප විසින් මෙසේම හික්ම විය යුතුය. ශාරිපුත්‍රය සන්සුන් ඉඳුරන් ඇත්තාවූම සන්සුන් සිත් ඇත්තා වූ තොපගේ කාය කර්මය සාන්ත වන්නේය. බ්‍රහ්මචාරීන් කෙරෙහි සාන්ත වූව උපකාරයක් කරන්නෙමුයි කියා ශාරිපුත්‍රය මෙසේ හික්මිය යුතුය.

ශාරිපුත්‍රය යම් කෙනෙක් මේ ධර්ම පරියාය නොඇසුහුද ඒ අහස තීර්ථකයෝ නැසුණාහුයයි භාග්‍යවතුන් වහන්සේ මෙම සූත්‍ර දේශනාව නිමකොට වදාළ සේක.

# සිංහල භාෂා දිනය සැමරීම

2022-03-02 වන දිනට යෙදුනු සිංහල භාෂා දිනය නිමිති කොට ගෙන සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය විසින් “සිංහල භාෂාවට ඇති වර්තමාන අභියෝග” යන මැයෙන් මහාචාර්ය පූජ්‍ය පාතේගම ඥාණිස්සර ස්වාමීන් වහන්සේ සහ පූජ්‍ය මාලේවන ධම්ම විජය ස්වාමීන් වහන්සේලාගේ වැඩමවීමෙන් දේශන ද්විත්වයක් සහිත සංවාදශීලී වැඩ සටහනක් පැවැත්වූ අතර මෙම කටයුත්ත බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.



# අස්ථික සංඥාව



මේ දීර්ඝ සංසාර ගමනේ සියළුම සත්ත්වයා තමාගේ හා අන්‍යයන්ගේ ශරීර දකින කොට ඇතිවන සංඥා තමයි මේ රූප සුවයි ශුභයි සුන්දරයි කියලා නිගමනය කරන්නේ වැරදි ආකාරයට සංඥා ඇතිවුනොත් දිගින් දිගටම ඇති වන්නේ වැරදි සංඥා. සත්ත්වයා ජීවත් වන්නේ අයෝනිසෝමනසිකාරයෙන් නිසා ඒ සංඥා හේතු කරගෙන තණ්හාවෙන් රූපවලට බැඳී යනවා. ඉගෙනගත් ශ්‍රී සද්ධර්මය අනුව නුවණ මෙහෙයවමින් එනම් යෝනිසෝමනසිකාරයෙන් දකින විට මේ ශරීරයේ යථාර්ථය එනම් අශුභ සංඥාව, පිළිකුල් සංඥාව, අනිත්‍ය සංඥාව, දුක්ඛ සංඥාව, අනාත්ම සංඥාව ඇතිවෙන්න පටන් ගන්නවා. මෙයට තමයි නිවන්මග කියලා කියන්නේ. දැනට තමාගේ සිතේ තිබෙන අකුසල් නැතිකර ගැනීමටත්, අනාගතයේ නිරන්තරයෙන්ම එන අකුසල් ඇතිවෙන්න නොදී නවත්වා ගන්නත් මේ අස්ථික සංඥාව වැඩීම, නිතර නිතර වැඩීම තම ජීවිතයට බද්ධකර ගැනීම ඉතාමත්ම අනගි භාවනා කමටහනක් වෙනවා සත්‍යයක්මයි. තවද නිවන් මාර්ග වඩනවා ඒකාන්තයි.

පළමුව ඇටසැකිල්ල තමා තුළ පිහිටා ඇති ආකාරය දැනගන්න. චිත්‍රයක් තමා ඉදිරියෙන් මවාගැනීම සුදුසු නැත. ඇටසැකිල්ල නොදන්නා අය වෙනුවෙන් මේ ඇටසැකිල්ලේ රූපය උපයෝගි කරගන්න.

ඊට පසු එක එක් කොටස අරමුණ කරගෙන සිහිය ඇතිකර ගෙන යෝනිසෝමනසිකාර කරගන්න. නිතර නිතර යෝනිසෝමනසිකාරයේ යෙදෙන්න. ඇටසැකිල්ලම එකවර සංඥාවක් වශයෙන් ගැනීමට උපකාර වේ. මෙසේ නිතර නිතර ඇටසැකිල්ල පිළිබඳ සංඥාව පුරුදු පුහුණු කරනවිට, එදිනෙදා ජීවිතයේත් ඇටසැකිල්ල පිළිබඳ සංඥා ඇතිවෙන්න පටන් ගන්නවා. තවද සෑම ඉරියව්වකදීම අස්ථික සංඥාව ඇතිවීමට හේතුවෙනවා. කමටහනට ගෝචර නුවණක් ඇති වෙනවා.

දැන් අපි උදාහරණ කිහිපයක් අරගෙන බලමු. කූඩයක දමා තිබෙන බෑගයකින් දොරකට තට්ටු කරනවා. අපිට හැඟීමක් ඇතිවෙනවා. බෑගයේ තිබෙන කූඩයේ මිට කියලා. අපි දබර ඇඟිල්ල නවා දොරට තට්ටු කරනවා. නමුත් අපිට අස්ථික සංඥාව ඇති වෙනවද? ඇතිවෙන්නේ නැත්තේ අස්ථික සංඥාව ආශ්‍රය කරලා නෑ. තවත් උදාහරණයක් ගනිමු. කෑම පෙට්ටියක් ලැබෙනවා. තමා පළමුව දකින්නේ කෑම පෙට්ටිය නමුත් සංග්‍රහ ගන්නේ මේ පෙට්ටියේ මොන කෑමක්ද තිබෙන්නේ කියලා. පෙට්ටියට වඩා අපි ආසා කරන්නේ ආහාරයට අවධානය යොමුවන්නේ තමා වැඩිය ආස තමා කැමතිදේට. එසේ නම් අස්ථික සංඥාවේ ආනිසංස අපි දන්නේ නෑ. අස්ථික සංඥාව වැඩීම නිසා නානාප්‍රකාර අශූචිවලින් යුක්ත මේ ශරීරයට තිබෙන ආසාව, ඡන්ද රාගය අඩුවෙනවා. අන්‍යයන්ගේ ශරීරවලට තිබෙන ඡන්ද රාගය අඩුවෙනවා. ඊළඟ බුදුරජාණන් වහන්සේ වදාළා ඉති අජ්ජිත්වා බහිද්දවා කියා තමාගේත් අන්‍යයන්ගේත් ඇති අශුභ ශරීර මෙනෙහි වෙනවා. චන්ද රාගය ඇති වීමෙන් අකුසල් රැස් වෙනවා. දුක්ඛිත සසර නිර්මාණය වෙනවා. අස්ථික සංඥාව වඩනවිට පළමුව පංච නීවරණ තදංග වශයෙන් ප්‍රහාණය වෙනවා. ඊට පසුව විෂ්කම්භ වශයෙනුත් පසුව සමුච්ඡේද වශයෙනුත් ප්‍රහාණය වී නිවන් සාක්ෂාත් කරනවා.

තවත් උදාහරණ කීපයක් අරගෙන බලමු. කොස්ස හෝ ඉදල අරගෙන අතුගාන කොට, හයියෙන් මිට

අල්ලනකොට අස්ථික සංඥාව වඩන්න. පහසුවෙන් අත්වල ඇති ඇටසැකිල්ල අරමුණු කරන්න. කැත්තෙන් උදැල්ලෙන් වැඩ කරන විටත්, පොල් ගානකොටත් එසේම මෙනෙහි කරන්න. පෑන අල්ලගෙන ලියනකොට විටින් විට හෝ අස්ථික සංඥාව අරමුණු කරන්න. ඇවිදින විට මේ අස්ථිවල ක්‍රියාකාරීත්වය හේතු කරගෙන ඇවිදින ආකාරය මෙනෙහි කරන්න. විශේෂයෙන්ම උපෝසථ සීලය වඩන විට නොවරදවාම අස්ථික සංඥා භාවනාව විටින් විට වඩන්න.

මෙසේ අස්ථික සංඥාව නිතර නිතර වඩන විට පංච නීවරණ යටපත් වෙනකොට සිතේ විවේකයක් ඇතිවෙනවා. සිත ප්‍රභාෂ්වර වෙනවා. නිරාමිස ප්‍රීතිය ඇති වෙනවා. කයේ හා සිතේ පස්සද්ධිය (සැහැල්ලුවට) ඇති වෙනවා. සිත සමාධිමත් වෙනවා. සමාධිමත් සිතේ විදර්ශනාව හාරා උපදිනවා.

මම අසා ඇති ආකාරයට සිද්ධවුණ සත්‍යය කථාවක් ඉදිරිපත් කරමි. අතීතයේ අභිකුණ්ඨකයන් සමග සිටි ගිරවෙක් අතරමං වුණා. ඒ ගිරවාට අසල තිබූ මෑණිවරුන්ගේ ආරාමයකට යන්න ලැබුණා. මෑණිවරු නොයෙක් පළතුරු ගිරවාට දී ඇති දැඩි කළා. ගිරවාට නිතර අසන්න ලැබුණා මෑණිවරු සජ්ඣායනා කරපු අස්ථික භාවනාව, ගිරවා නිතර නිතර අස්ථි, අස්ථි කියන්න පුරුදු වුණා. දවසක් උකුස්සෙක් ගිරවාව අල්ලගන්න හදනවිට ගිරවා අස්ථි අස්ථි කියා කෑගැහුවා. ගිරවා බේරාගත් මෑණිවරු මෙසේ ගිරවාට කිව්වා. මේ භවයේ ඔබට ධර්මය අවබෝධ කරගන්න බෑ. තිරිසන් භවයක්නේ. නමුත් කවදා හෝ මේ අස්ථික සංඥාව වඩන නිවන් සාක්ෂාත් කරනවා කියලා.

පසුකළෙක අනුරාධපුරයේ මිනිස් භවයක් ලබාගෙන මේ ගිරවා උපත ලැබුවා. තරුණ වයසේදීම පැවිදි වෙලා අස්ථික සංඥාව නිතර පුරුදු කළා. දවසක් කාන්තාවක් තම ස්වාමියා සමග දබර වී ගෙදරින් පළා යනවිට ඉදිරියට වඩින ස්වාමීන් වහන්සේ දැක සිනාවක් පහළ කළා. අස්ථික සංඥාව වඩන ස්වාමීන් වහන්සේ දැක්කේ ඇටසැකිල්ලක් පමණයි. ආපසු සිනාවක් ඇතිවුණේ නෑ. කාන්තාව පළා ගියා. කාන්තාව ලුහුබැඳන් ස්වාමියා දිවුවා. ස්වාමීන් වහන්ස, මෙතනින් කාන්තාවක් ගියාද? කියා ඇසූ විට ඊට පිළිතුරු දුන් ස්වාමීන් වහන්සේ වදාළා කාන්තාවක්ද කියලා දන්නේ නෑ. ඇටසැකිල්ලක් ගියා කියලා. අස්ථික සංඥාව වඩලා ස්වාමීන් වහන්සේ අරහත්වයට පත්වුණා. ඒ කාන්තාවට පෘතග්ජන පුද්ගලයකු හමුවුණා නම් ඒ සිනාවට සිනාවක් ලැබෙනවා. ඊට පසු කථා කරන්න පටන් ගන්නවා. රාගය ඇතිවෙන්න පුළුවන්. ස්වාමියා මේ දැක කොතරම් දේවල් සිතන්න පුළුවන්ද?

**කායික රෝග විශේෂඥ**
**වෛද්‍ය චම්පා ජයසුන්දර**

---

### බොදු ලේඛක ලේඛිකාවන්ට ඇරයුමක් !

"බෞද්ධාලෝකය" ධර්ම ශාස්ත්‍රීය සඟරාවට ලිපි සම්පාදනය කරන මෙන් බොදු ලේඛක ලේඛිකාවන්ට සැදැහැ සිතින් ආරාධනය කරමු.
ඔබගේ නම, ලිපිනය, දුරකතන අංකය සඳහන් කොට සිය නිර්මාණාත්මක ලිපිය පහත ලිපිනයට එවන්න.

සංස්කරණ කළමණාකාරිනිය,
බෞද්ධාලෝක සඟරාව
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07
දුරකතන අංකයඃ 011 2691695, විද්‍යුත් ලිපිනයඃ acbc380@gmail.com

## ගංගොඩවිල ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ අවුරුදු උළෙල

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මගින් පාලනය වන ගංගොඩවිල ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ අවුරුදු උළෙල 2022 අප්‍රේල් මස 24 වන දින පැවැත්විණ.





## පූනානි පිපෙන පියුම් පෙර පාසලේ තෛවර්ෂ පූර්ණ ප්‍රසංගය

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ අනුග්‍රහය ඇතිව නැගෙනහිර පළාතේ පූනානි ගම්මානයේ 2019 දී ආරම්භ කරන ලද පිපෙන පියුම් පෙර පාසලේ තෛවර්ෂ පූර්ණ විවිධ ප්‍රසංගය 2022 මාර්තු 25 වන දින බෞද්ධ මහා සම්මේලනයේ ගරු උපසභාපතිනි වෛද්‍ය රාණි ප්‍රනාන්දු මහත්මිය සහ මඩකලපුව දිස්ත්‍රික් ශාඛාවේ ගරු ලේකම් වෛද්‍ය චන්ද්‍රික එපිටකඩුව මහතාගේ සහභාගිත්වයෙන් පැවැත්විණ.



# තුන්දොර සංවර කර ගැනීම



බුදුරජාණන් වහන්සේ මංගල ධර්ම දේශනාවේදී කය, වචනය සංවර කරගැනීමට සිල්පද හතක් දේශනා කර ඇත. මුළු ත්‍රිපිටක ධර්මයම සිත පිරිසිදු කිරීම පිණිසය. ආර්ය ආෂ්ටාංගික මාර්ගයේ තුන්වන ප්‍රතිපදාවෙන් වචනය සංවර කරගන්නා සිල්පද හතරක් දේශනා කර ඇත. හතර වන ප්‍රතිපදාවෙන් කය සංවර කරගන්නා සිල්පද තුනක් දේශනා කර ඇත.

වචනය සංවර කරගන්නා සිල් පද හතර සම්මා වාචා, එනම් බොරු නොකීම, කේලාම් නොකීම, පරුෂ වචන නොකීම, හිස් වචන නොකීම යන වචනය සංවර වන පින් හතරයි. කය සංවර කරගන්නා සිල්පද තුනක් දේශනා කර ඇත. එම කය සංවර කරගන්නා සිල්පද තුන වන්නේ සතුන් නොමැරීම, සොරකම් නොකිරීම, කාමයෙහි වරදවා නොහැසිරීම, මෙම සිල්පද තුන කය සංවර වන පින් තුන වේ.

කය හා වචනය සංවර වන විට ඇතිවන්නේ පින් හතකි. කය හා වචනය අසංවර වන විට පව් හතක් ඇති වේ. වචනය අසංවරවන සිල්පද හතර වන්නේ මිථ්‍යා වාචා එනම් බොරු කීම, කේලාම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීම යන වචනින් සිදුවන පව් හතර වේ.

කය අසංවර වන සිල්පද තුනක් ඇත. එනම් මිථ්‍යා කම්මන්ත, සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම කය අසංවර වන පව් තුන වේ. වචනය අසංවර වන පව් හතරත් සමග කය හා වචනය අසංවර වෙන පව් හතකි.

දැනට අපි භාවිතා කරන බොහෝ පොත්වල වචනය සංවර වන පින් හතර හඳුන්වා ඇත්තේ නිවැරදි වචන කියා වේ. කය සංවර කරන පින් තුන හඳුන්වා ඇත්තේ යහපත් කර්මාන්ත කියා වේ.

සම්මා වාචා සිල්පද හතරට කියන්නේ නිවැරදි වචන කියා වේ. සම්මා කම්මන්ත සිල්පද තුනට කියන්නේ නිවැරදි කර්මාන්ත කියා වේ. මනුෂ්‍යයන්ට ඕනෑතරම් නිවැරදි යහපත් වචන කතා කරන්න පුළුවන්, යහපත් වචන ලියන්න, කියන්න හැකියාව ඇත. එසේ කතා කළාට ලිව්වාට, එවැනි වචනවලින් වචනය සංවර වීමක් වන්නේ නැත. ඕනෑතරම් නිවැරදි කර්මාන්ත කයෙන් කිරීමට හැකි වුවත් එම යහපත් කර්මාන්ත කිරීමෙන් කිසිවෙකුගේ කය සංවර වන්නේ නැත. තුන්දොර සංවර කර ගැනීමට නිවැරදි වචනවලින්වත්, නිවැරදි කර්මාන්ත වලින්වත්, කිරීමට හැකිවන්නේ නැත.

වචනය සංවර කර ගැනීමට නම් කය අසංවර වන පව් තුනෙන් මිදී කය සංවර වන පින්තුන සමාදන් වූ අවස්ථාවේ සිට නොකඩා, නොබිඳ, නොකඩවා රැකගත යුතුය. යම්කිසි විදිහකින් සිල්පද කැඩුනොත් නැවත තුනුරුවන් ඉදිරියේ සිල්පද සමාදන් විය යුතුය. කය හා වචනය සංවර කර ගත් අය ශීලයෙහි පිහිටි අය වේ. එවැනි අයට දහම අවබෝධ වේ.

සිත, කය, වචනය සංවර කර ගැනීමට ත්‍රිපිටකයේ අංගුත්තර නිකායේ පළමුවන කොටසේ තික නිපාතයේ තුන්වන පණ්ණාසකයේ 12 ආපායික වර්ගය 432 වන පිටුව 20 මොනෙය්‍ය සූත්‍රයේ 2,3 ජේදවල කය වචනය සංවර වන සිල්පද හත ඇත. 4 වන ජේදය සිත සංවර කර ගැනීමට අභිද්‍යාවෙන්, ව්‍යාපාදයෙන්, මිථ්‍යා දෘෂ්ටියෙන් මිදිය යුතුය.

ගිහියෙකු සිල්වතෙකු වීමට නම් කය, වචනය සංවර කරගත් විට සිල්වතෙකු වුවත් ගිහියන්ට වඩා ස්වාමීන් වහන්සේලා පිරිසිදු සිතක් ඇති කර ගත යුතුය. ස්වාමීන් වහන්සේට ඒ සඳහා 6 වන ජේදය කය සංවර කර ගැනීමට 7 වන ජේදය වචනය සංවර කර ගැනීමට 8 වන ජේදය සිතේ පිරිසිදුකම සඳහා දුරුකළ යුතු නීවරණ පහ නම් කාමච්ඡන්ද, ව්‍යාපාද, ථිනමිද්ධ. උද්දච්ච කුක්කුච්ච, විචිකිච්චාව යන මේ පහයි. "මහණ තෙම මෙම තමන් තුළ ඇත්තා වූ නීවරණ වන කාමච්ඡන්දය මා තුළ කාමච්ඡන්දය ඇතැයි දැනගනීද තමා තුළ නැත්තා වූ කාමච්ඡන්දය මා තුළ කාමච්ඡන්දය නැතැයි දැනගනීද යම් ආකාරයකින් නූපන්නා වූ කාමච්ඡන්දයාගේ ඉපදීම වේද, යම් ආකාරයකින් උපන්නා වූ කාමච්ඡන්ද ප්‍රහාණය වේද එයත් දැනගනීද යම් ආකාරයකින් පහ වූ කාමච්ඡන්දයාගේ නැවත ඉපදීමක් වේද" එයත් දැන ගනීද එසේ අනෙක් නීවරණ ගැන ද නීවරණ පහ ගැනම මෙසේ මෙලෙස වන බැවින් එලෙසම සිතා ඒවායින් මිදී සිත පිරිසිදු කරගත යුතුය.

"කය යහපත් බව, වචනයේ යහපත් බව, සිතේ යහපත් බව යනු මොහු යහපත් බැව් තුනය, ආශ්‍රව රහිත වූ යහපත් භාවයෙන් යුත් භික්ෂුව සියළු කෙලෙසුන් පහකළ රහත් පුද්ගලයා යයි කීහු." (ආපායික වර්ගය)

සිත පිරිසිදු කිරීම, සියළු බාධා ජය ගැනීමේ මහා ප්‍රයත්නය වේ. එබැවින් සිත පිරිසිදු කිරීම සඳහා ධෛර්යවත් වීමම ශ්‍රේෂ්ඨ පුරුෂ ලක්ෂණයකි. ඒ සඳහා සිත හැඳිනගත යුතුය. ඒ සඳහා දැනුම ලබාගත යුතුය. මෙහි ඇත්තේ සිත පිරිසිදු කිරීමට කෙටි හැඳින්වීමකි. මේවා ගැන විස්තර ඇතුළත් ත්‍රිපිටකයේ ඇති පොත්පත් බලා සිත පිරිසිදු කරගන්න.

පින්-පව්, කුසල්-අකුසල් ගැන දැනගැනීමට පහත සඳහන් පොත් කියවන්න.

ඒ.පී.ද. සොයිසා මහතා සරල බසට නැගූ ත්‍රිපිටකය කියවන්න.

- කය වචන දෙකින් පින් - පව් සිතින් කුසල් - අකුසල් 250/-
- බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය - 350/-
- පින සහ කුසලය දෙකක්ද? එකක්ද? - 200/-
- ලොව සැමට සිත නිවාගන්න දහම් දැනුම - 125/-
- සිතෙහි සතුට ඇතිකර ගැනීමට කුසල් කරන්න අකුසලෙන් මිදෙන්න - 125/-
- සිත සහ මනසින් කුසල් අකුසල් - කය සහ වචනින් පින් පව් - 100/-
- පින් සහ පව් කුසල් සහ අකුසල් - 120/-
- පංච උපාදානස්කන්ධය - 250/-
- සිත ගැන දැනගන්න - 125/-
- සිත මනස සහ ආගම් - 80/-
- සිතිවිලි සහ සිතින් සිතීම - 150/-
- චිත්ත නියාම ධර්ම - 125/-

**සී/ස ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම**

661, 665, 675 පී.ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

දුරකතන: (011) 2685369, 2686925 ෆැක්ස්: 2674187

# බෞද්ධාලෝක වෙසක් දාන පාරමිතා පිංකම

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපතිතුමාගේ සංකල්පයකට අනුව ජාතික තරුණ මණ්ඩලය මගින් බෞද්ධාලෝක වෙසක් උත්සවයට සමගාමීව “දාන පාරමිතා පිංකම” ප්‍රථම වරට සංවිධානය කරනු ලැබේ.

මේ අනුව වෙසක් මස ආරම්භයේ සිට සෑම සෙනසුරාදා සහ ඉරිදා දිනකම, එක් දිනක් සඳහා දිවා ආහාර පාර්සල් 500 බැගින් සෑම සති අන්තයකම දිවා ආහාර පාර්සල් 1000 ක් ආර්ථික අපහසුතා වලින් පෙලෙන ජනතාව වෙනුවෙන් බෙදා දීමට කටයුතු කරනු ලබයි.

මෙහි පළමු අදියර 2022 මැයි මස 7 වැනි සෙනසුරාදා බෞද්ධ සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතා සහ නියෝජ්‍ය සභාපති රොෂාන් මද්දුමගේ මහතා ඇතුළු කෘත්‍යාධිකාරී මණ්ඩල නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන් කොළඹ 10 මාලිගාවත්ත අබේසිංහාරාම විහාරස්ථානයේ දී සහ කොළඹ 15 මට්ටක්කුලිය කල්‍යාණ නදී ගංගා විහාරස්ථානයේ දී සිදු කරන ලදි.

“දාන පාරමිතා පිංකම” දිවයිනේ තෝරාගත් ප්‍රදේශවල ආගමික ස්ථාන මූලික කරගෙන සිදුකරනු ලබන අතර ප්‍රථම අදියරයේ දී සමස්ත වශයෙන් දිවා ආහාර පාර්සල් 25,000 බෙදා දීමට සැලසුම් කර කර ඇත.

මෙම උතුම් පින්කම පොසොන් මාසයේ දී ද සිදුකිරීමට කටයුතු යොදා ඇති අතර මේ සඳහා ඔබටත් සහයෝගය ලබා දිය හැක.






සාධු! සාධු! සාධු!

ජාතික තරුණ මණ්ඩලය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
සම්බන්ධීකරණ - උපේෂ පෙතියාගොඩ - 0777732905

# කලාසූරි සොයිලියස් මැන්දිස් ජන්ම සංවත්සර රචනා තරගය සඳහා නිර්මාණ භාර ගැනීම

සිංහලයේ, බිතු සිතුවම් කලාවට අමිල සේවාවක් කළ කලාසූරි වලිමුනි සොයිලියස් මැන්දිස්ගේ 125 වැනි ජන්ම සංවත්සරය මේ වසරේ ජුනි 17 වැනි දිනට යෙදී ඇත.

ශ්‍රී ලාංකේය බිතු සිතුවම් කලාව ප්‍රකටව පැවතියේ අනුරාධපුර, පොළොන්නරු අවධිවලදීය. ඉන් අනතුරුව දක්නට ලැබුණු බිතු සිතුවම් කලා නිර්මාණ අතුරෙන් වඩාත් ජීව ගුණය පිළිබිඹු කෙරෙන බිතු සිතුවම් දක්නට ලැබෙන්නේ සොයිලියස් මැන්දිස්ගේ තෙලි තුඩින් නිමාවුණු කැළණි අලුත් විහාරයේ සිතුවම් නිර්මාණවලිනි. මෙසේ සිංහලයේ බිතු සිතුවම් කලාවේ අනන්‍යතාව හා ජීව ගුණය රැක ගැනීමට දිවි හිමියෙන් කටයුතු කළ මෙම උදාර චිත්‍ර ශිල්පියාගේ 125 වැනි ජන්ම සංවත්සරය නිමිති කරගෙන සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මගින් දීප ව්‍යාප්ත රචනා තරඟයක් පැවැත්වීමට තීරණය කර ඇත.

රචනා මාතෘකා දෙකකි.

1. විසි වැනි සියවසේ ශ්‍රී ලාංකේය විහාර සිතුවම් කලාව
2. චිත්‍ර ශිල්පියකු වශයෙන් සොයිලියස් මැන්දිස්ගේ අනන්‍යතාව

කැමති මාතෘකාවක් තෝරා රචනාව ඉදිරිපත් කළ හැකියි.

මේ තරඟය පාසල් හා විවෘත වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ. පාසල් තරඟයේ වාක්‍ය රචනා වචන 750 කට නොඅඩු විය යුතු අතර ඒවා විදුහල්පති/නියෝජ්‍ය විදුහල්පතිතුමාගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතුවේ. විවෘත රචනා තරඟය සඳහා වයස් භේදයක් නැත. එම රචනා වචන 1000 කට නොඅඩු විය යුතුවේ. ජයග්‍රාහකයන් සඳහා ත්‍යාග හා සහතික පත් පිරිනැමේ. රචනා සමග පහත තොරතුරු ඇතුළත් කළ යුතුය. නම, ලිපිනය, උපන් දිනය හා වයස, දුරකථනය, තරඟ අංශය (පාසල්/විවෘත)

සියළුම රචනා 2022 මැයි 30 වැනි දින හෝ ඊට පෙර පහත ලිපිනයට යොමු කළ යුතුවේ.

ගරු සභාපති, සොයිලියස් මැන්දිස් 125 වැනි ජන්ම සංවත්සර කමිටුව, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය, අංක 380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

වැඩි විස්තර සඳහා 071-4894925 දුරකථනය හෝ www.acbc.lk වෙබ් අඩවිය හෝ acbc380@gmail.com විද්‍යුත් තැපෑල සම්බන්ධ කර ගත හැකි බව ජාතික අධ්‍යාපන මණ්ඩල ගරු සභාපති මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ මහතා පවසයි.

# ත්‍රෛනිකායික මහා නාහිමියන්ගේ යෝජනාවලියට අනුව සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය, ජාතික සංවිධාන ඒකාබද්ධ ක්‍රියාන්විතය විසින් යෝජනා කරන ලද අන්තර් කාලීන පාලක මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුතු යයි ඉදිරිපත් කරන ලද යෝජනා මාලාව

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය විසින් කෘත්‍යාධිකාරී මණ්ඩල නිර්දේශ මත රටතුළ උද්ගතව ඇති වර්තමාන ආර්ථික දේශපාලන හා සමාජයීය අර්බුදය හමුවේ අප බෞද්ධ මහා සම්මේලනයේ වගකීම ඉටුකරනු වස් කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමැතියෙන් 2022.04.04 හා 2022.04.22 වන දින අතිගරු මහා නායක මාහිමිපාණන් වහන්සේලා විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද යෝජනාවලිය තවදුරටත් බලගැන්වීම සඳහා ගිහි බෞද්ධයන්ගේ ප්‍රමුඛතම ආයතනය වශයෙන් ජාතික සංවිධාන ඒකාබද්ධ කරගනිමින් 2022.04.06 සහ 8, 9 යන දිනයන්හිදී ක්‍රියාන්විතයක් ආරම්භ කරන ලදී. එහිදී ත්‍රෛනිකායික මහනායක මාහිමිපාණන් වහන්සේලාගේ යෝජනා හය ක්‍රියාත්මක කරලීම සඳහා අප සම්මේලනයේ යෝජනා අදහස් රැගෙන සම්මේලනයේ ක්‍රියාකාරී උපදේශක ජනාධිපති නීතිඥ ප්‍රසන්න ලාල් ද අල්විස් මැතිතුමා මහනායක මාහිමිපාණන් වහන්සේ බැහැදැක තවදුරටත් සාකච්ඡා කරන ලදී. ඉන් අනතුරුව අප සම්මේලනය ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මැතිතුමා ප්‍රමුඛ සමිති සංවිධාන සහ විද්වත් මඩුල්ල 2022.04.22 වන දින මහනුවර මල්වතු අස්ගිරි අනුනායක මාහිමිපාණන් වහන්සේලා බැහැ දකින ලද අතර 2022.04.23 වන දින අමරපුර මහනිකායේ මාහිමිපාණන් වහන්සේ සහ රාමඤ්ඤ නිකායේ මාහිමිපාණන් වහන්සේ බැහැ දැක සාකච්ඡා කර ලදී. ඒ පිළිබඳව 2022.04.26 වන දින සම්මේලන මූලස්ථානයේ දී ප්‍රවෘත්ති සාකච්ඡාවක් පවත්වා රට හමුවේ තබන ලදි. මහනායක මා හිමිපාණන් වහන්සේලාගේ ආශිර්වාදය මත උන් වහන්සේලාගේ ඒකාබද්ධ නිර්දේශ යෝජනාවලිය මුල් කොට ගනිමින් අපගේ යෝජනාවන්ද සකස් කර කඩිනමින් ක්‍රියාත්ම කිරීමට ගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජයටත්, සියළුම දේශපාලන පක්ෂ නායකයින්ටත් දැනුවත් කරන ලදි.

01 ත්‍රෛනිකායක අතිපූජ්‍ය මහානායක ස්වාමින්වහන්සේලාගේ අනුශාසනා මත රට පත්ව ඇති සමාජ ආර්ථික පසුබිම සුවපත් කිරීම සඳහා අධිෂ්ඨාන පූජාවක් සෑම වෙහෙර විහාරස්ථානයක් මුල් කර ගනිමින් පැවැත්වීමට සංවිධානය කිරීම.

02. සියළුම පක්ෂ විපක්ෂ දේශපාලන නායකයින් මුණ ගැසී ත්‍රෛනිකායක අතිපූජ්‍ය මහානායක ස්වාමින්වහන්සේලා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව බලගැන්වීමට සාකච්ඡා කිරීම හා ඒ සඳහා ක්‍රියාකාරී ජාතික ප්‍රතිපත්තියක් සැකසීම.

03. අතිපූජ්‍ය මහානායක ස්වාමින්වහන්සේලා නිකුත් කරන ලද යෝජනාවලියේ දෙවන යෝජනාවට අනුව අන්තර්කාලීන පාලනයක් සැකසීම සඳහා ප්‍රායෝගික වැඩ පිළිවෙලක් සාකච්ඡා කිරීම.

04. අතිපූජ්‍ය මහානායක ස්වාමින්වහන්සේලාගේ යෝජනාවලිය මහජනතාව දැනුවත් කිරීම සඳහා විවිධ වැඩසටහන් සංවිධාන කිරීම.

05. අතිපූජ්‍ය මහානායක ස්වාමින්වහන්සේලාගේ යෝජනාවලියට අනුව සමාජ ආර්ථික හා අනෙකුත් කර්තව්‍යයන් සඳහා උපදෙස් ලබා දීමට වියත් මණ්ඩලයක් යෝජනා කිරීම.

06. දේශපාලනඥයින්ගේ වත්කම් බැරකම් වසර 20 ක් වෝහාරික විගණනය කළයුතුය. (මේ සඳහා ලෝක බැංකුවෙන් හා වෘත්තිකයන්ගෙන් මූල්‍ය අනුග්‍රහය ලබා ගතහැකිය.)

07. සියළුම රාජ්‍ය සේවයේ මාණ්ඩලික ශ්‍රේණියේ සිට ඉහලට ජ්‍යෙෂ්ඨ තනතුරු දරණ නිලධාරින්ගේ වසර 10 ක වත්කම් බැරකම් වෝහාරික විගණනයකට ලක් කළයුතු වේ.

08. 19 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ බලාත්මක ස්වාධීන ආයතන නැවත ශක්තිමත් කිරීම.

09. ජනාධිපති, කැබිනට් මණ්ඩලය සහ රාජ්‍ය සේවය, රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයුම් මූලධර්මවලට අනුව කටයුතු කිරීම.

10. සියළුම දේශපාලනඥයින් වාර්ෂිකව තම වත්කම් බැරකම් ප්‍රකාශ හෙළිකළයුතු අතර, ඒවා ‌වෝහාරික විගණනයට ලක් කළයුතුය.

11. සියළුම දේශපාලන පක්ෂ, අරමුදල් රජයේ විගණනයට යටත් විය යුතුය.

12. ජාත්‍යන්තර ආධාර ලබමින් ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන, අරමුදල් විගණනය කළ යුතුවේ.

13. අඩුපාඩු සහිතව දූෂණ චෝදනා සඳහා චූදිතයන් ඉදිරිපත් කොට එම අධිකරණ කටයුත්ත අසාර්ථක වීමට හේතු වන නිලධාරින්ට දඬුවම් කළහැකි නීති සකස් කිරීම. චේතනාත්විතව එවැනි නඩු ඉදිරිපත් කරන නිලධාරින්ට විරුද්ධව නීති සම්පාදනය කළයුතු වේ.

14. මේ ආකාරයට නඩු කටයුතු කිහිපයක් එක නිලධාරියෙකු විසින් සිදුකර ඇති බව ඔහුට හෝ ඇයට අපරාධ නීතිය යටතේ දඬුවම් කිරීමට නීති සම්පාදනය කළයුතු වේ.

15. භාණ්ඩ/යන්ත්‍ර සූත්‍ර/විශාල කොන්ත්‍රාත් පිරිනැමීම සඳහා ප්‍රසම්පාදන කොමිසම බලාත්මක කළයුතුය. අල්ලස් හා දූෂණය පිටු දැකීමට නීතිය බලාත්මක කිරීම.

16. ස්වාධීන අධිකරණ/පොලිස් කොමිසමක් ක්‍රියාත්මක කිරීම.

17. අසීමිත වරප්‍රසාදයන්ගෙන් තොර වූ දේශපාලනඥවරුන් සරළ දිවි පෙවෙතෙන් හා අල්පේච්ඡතාවයෙන් යුතු ජනතා විශ්වාසනීයත්වයට හා ගෞරවාන්විත තත්ත්වයට පත් කිරීම.

ඒ අනුව පළමු යෝජනාව පරිදි,

ත්‍රෛනිකායට අයත් විහාරස්ථාන මූලික කරගනිමින් ජාතියට ආශිර්වාද පතා ආගමික වතාවන්හි යෙදී, තුන් සූත්‍රය සජ්ඣායනයෙන් පසු සැමට මෙත්වඩා සම්‍යක් දෘෂ්ඨික දේව මණ්ඩලයට පුණ්‍යානුමෝදනා කර පහන් වූ සිතින් අධිෂ්ඨානයේ යෙදීම ඉතා අගනේය. ස්ථිරසාරය බලවත්ය. එමගින් අප ඉදිරියේ ඇති සියළු අර්බුදයන් විසඳෙන බව ඒකාන්තය.

ඒ අනුව ශ්‍රී බු.ව.2565 ක් වූ බක් මස 30 වන ශනි දින සවස 6.00 සිට සෑම විහාරස්ථානයට රැස්ව බුද්ධ පූජා පවත්වා සවස 6.30 ට සැම එක්වර මෙම අධිෂ්ඨානය සිදු කිරීමට කටයුතු සංවිධානය කර ඇති අතර ආරම්භක පිංකම බෙල්ලන්විල රජ මහා විහාරස්ථානයේ දී ආරම්භ කරන ලදි.

**සම්‍යක් අධිෂ්ඨානය**

**අප රැස් කරගත් කුසල් බලයෙන් රටත් ජාතියත් සම්බුද්ධ ශාසනයත් සුරැකේවා ! රටේ සාමය සමගිය ආරක්ෂා වේවා ! මාගේ සහ අන් සැමගේ ජීවිත ආරක්ෂා වේවා ! සහනශීලී ජීවිතයක් අප සැමට උදා වේවා ! දිනෙන් දින, තව තවත් කුසල් රැස් කර ගැනීමට අප සැමට හැකි වේවා ! රටත්, ජාතියත්, ශාසනයත්, අපගේ ආරක්ෂාවත් සැළසේවා !**

එමෙන්ම, වත්මන් අර්බුද තත්වය සමනය පිණිස සෑම නිවසකම ද මෙම මහඟු සත්‍යක්‍රියාව දිනපතා උදේ 06 ට සවස 06 ට හෝ රාත්‍රී 09 ට සිදු කරන මෙන් ද එලෙසින් රට පුරා සාමූහිකව අධිෂ්ඨාන පූජාවේ යෙදෙන ලෙසද බෞද්ධ ඔබ සැමගෙන් ඉල්ලා සිටිමු.

රටේ ආරක්ෂාව, හා සමස්ත සමාජයේ සහ අප සැමගේ ජන ජිවිතයන්හි සාමකාමී බව ප්‍රාර්ථනා කර ආශිර්වාදය පතා ආගමික කටයුතු වල යෙදීමෙන් පසු පොදු අධිෂ්ඨානයේ නියැලීමට කටයුතු සංවිධානය කර දෙන මෙන් විහාරාධිපති ස්වාමීන් වහන්සේලා වෙතින් ගෞරවයෙන් ඉල්ලා සිටින අතර තම ප්‍රදේශයේ විහාරස්ථානයන්හි ආශිර්වාදයෙන් මේ සඳහා උනන්දුවෙන් ක්‍රියා කරන මෙන් දැහිතකාමී ඔබ සැමගෙන්ද කාරුණිකව ඉල්ලා සිටිමු.

මෙම වැඩපිළිවෙල ජනගත කිරීමේ මාධ්‍ය ක්‍රියාන්විතයේ දී 2022.05.04 වන දින දෙරණ නාලිකාවේ අළුත් පාර්ලිමේන්තුව වැඩසටහන හරහා තව දුරටත් සාකච්ඡාවට බඳුන් වූ බවද සඳහන් කරමු.

එම ජාතික ක්‍රියාන්විතයේ අදහස්, යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීමට ලේකම් කාර්යාලයක්, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ස්ථාපිත කරන්නට යෙදිණි. ඒ සඳහා සියළු විද්වතුන් හා ජනතාවට ජාතික ඒකාබද්ධ සමිති සංවිධානවලටද ආරාධන කර සිටිමු. විද්‍යුත් ලිපිනයඃ buddhistinfo380@gmail.com, දුරකතන අංකයඃ 0112 665 047, 0718 645 554

ගරු සමලේකම්වරු
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය




අතිපූජ්‍ය මහානායක ස්වාමීන් වහන්සේලා බැහැදැක බෞද්ධ මහා සම්මේලනය ජාතික සංවිධාන ඒකාබද්ධ ක්‍රියාන්විතය විසින් යෝජනා කරන ලද අන්තර් කාලීන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුතු යෝජනා මාලාව පිළිගැන්වීම





"සමාජ ආර්ථික අර්බුදය හමුවේ රට සුරකින ගමන් මග"
බෞද්ධ මහා සම්මේලනය බෞද්ධ සංවිධාන විසින් යෝජනා කරනලද අන්තර් කාලීන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුතු යෝජනා මාලාව පිළිගැන්වීම ජනගත කිරීමේ මාධ්‍ය සාකච්ඡාව 2022-04-26 දින සමුළු මූලස්ථානයේදී පැවැත්වුණි.



එකමුතුවෙන් ජාතික අර්බුදය හමුවේ අපගේ ගමන් මග පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමේ මාධ්‍ය වැඩසටහන 2022-04-08 දින සමුළු මූලස්ථානයේ පැවැත්වීය.



ශ්‍රීමත් ඩී.බී. ජයතිලක අනුස්මරණ

# අධ්‍යාපනික ශිෂ්‍යත්ව ප්‍රදාන වැඩසටහන

## සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

ශ්‍රී බු.ව.2565/2566

බොදු සමුළුව අනාගතයේ රට , ජාතිය ආගම පෝෂණය කිරීමට සිටින භික්ෂූන් වහන්සේලා, මෙහෙණින් වහන්සේලා , සහ දූ දරුවන්ගේ හෙට දවස අධ්‍යාපනය තුළින් මල්ඵල ගැන්වීම සඳහා අධ්‍යාපනික ශිෂ්‍යත්වයන් ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබන අතර ඔවුන් වෙනුවෙන් අත්වැලක් ලබා දීමට ඔබට අවස්ථාව ඇත.

### කවුරුන් සඳහාද

භික්ෂූන් වහන්සේලා, මෙහෙණින් වහන්සේලාගේ, පළමු වසරේ සිට
අ.පො.ස (සා/පෙළ), අ.පො.ස (උ.පෙළ), විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන දක්වා
ඉගෙනුම ලබන දූ දරුවන් සඳහා පහත සඳහන් ආකාරයට ශිෂ්‍යත්වයන් පිරිනමනු ලබයි !!!

### මාසික ශිෂ්‍යත්ව පිරිනැමීම....

| | |
|---|---|
| භික්ෂූන් වහන්සේලා - මෙහෙණින් වහන්සේලා | රු.2,000 |
| 5 වසර (පහළ) දරුවන් සඳහා | රු.750 |
| 5 වසර (ඉහළ) දරුවන් සඳහා | රු.1,000 |
| අ.පො.ස (සා/පෙ) දරුවන් සඳහා | රු.1,500 |
| අ.පො.ස (උ/පෙ) දරුවන් සඳහා | රු.2,500 |
| විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන | රු.3,500 |



ඔබේ ජීවිතයේ සුවිශේෂී අවස්ථා මතකයේ රැඳෙනු පිණිස

- ඔබේ උපන්දිනය නිමිත්තෙන්
- විවාහ සංවත්සරය නිමිත්තෙන්
- ආදරණීය දෙමාපියන් නමින්
- මියගිය ඥාතීන් වෙනුවෙන්

➤ ශිෂ්‍යත්ව සඳහා දායක විය හැකි අයුරු - මාසික / ත්‍රෛමාසික / අර්ධ වාර්ෂික / වාර්ෂික

මෙම උතුම් කර්තව්‍යයට තුළින් රටේ අනාගත යහපැවැත්ම වෙනුවෙන් අධ්‍යාපනයෙන් ඉහළ දරු පරපුරක් බිහි කිරීම සඳහා දායක වීමට ඔබට ගෞරවයෙන් ආරාධනා කර සිටින්නෙමු

**ශිෂ්‍යත්ව අරමුදල සඳහා සියළුම මුදල් බැරකිරීම**
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය - ශිෂ්‍යත්ව අරමුදල
ගිණුම් අංකය (078-2-005-4-0000064)
මහජන බැංකුව - බොරැල්ල ශාඛාව බැංකු ශාඛා අංකය : 7135-78
SWIFT CODE - PSBKLKLX

**සංවිධානය**
**ශිෂ්‍යත්ව කමිටුව**
**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07

දුරකථන : 011 2691695 ජංගම : 0777 732 905 ෆැක්ස් : 011 2688517
Facebook : AllCeylonBuddhistCongress web : www.acbc.lk
විද්‍යුත් තැපැල් : acbc380@gmail.com / buddhistinfo380@gmail.com

## ගෞරව ප්‍රණාම ප්‍රදානය කිරීමේ මහෝත්සවය

### සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
### ශත සංවත්සරය 1919 – 2019

අධිරාජ්‍යවාදීන්ගේ පාලනයෙන් හෙම්බත්වී සිටි අප දේශය ඉන් මුදවා ගැනීමේ නිදහස් අරගලයේ අරුනළු ලක්දිව දසත පැතිරෙමින් තිබූ සමයේ එයට පන්නරයක් දෙමින් 1919 වර්ෂයේ හෙළ බොදු නායකයන්ගේ මූලිකත්වයෙන් ස්ථාපිතවී දිවයිනේ ප්‍රමුඛතම බෞද්ධ සංවිධානය වශයෙන් සියවසක කාලයක් පුරාවට සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය පැමිණි ගමන් මග ආවර්ජනය කරමින් සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය හා සමාජයේ යහ පැවැත්ම උදෙසා සේවයක් සිදුකළ පුද්ගලයන් සහ ආයතන අගැයීමට ලක්කරමින් දීප ව්‍යාප්තව පහත සඳහන් අංශයන් යටතේ සිදුකරන ගෞරව ප්‍රණාම පිරිනැමීම සඳහා නාම යෝජනා කැඳවීම.

**1. බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ශාසනික සේවයේ නියැලෙන පුද්ගලයන් ඇගයීම.**
**2. ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් බෞද්ධ සංවිධාන ඇගයීම.**
**3. ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් ස්වේච්ඡා සංවිධාන ඇගයීම.**
**4. දිස්ත්‍රික් මට්ටමින් දීර්ඝ දහම් ගුරු සේවය ඇගයීම.**
**5. ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් බොදු පුවත් ප්‍රචාරණය සඳහා සිදුකරන ලද මාධ්‍යකරණය (මාධ්‍යවේදීන්) ඇගයීම.**

අයදුම්පත් සම්පූර්ණ කිරීමට අදාල සුදුසුකම් (කාල සීමාව) සපුරාලිය යුතු අවසාන දිනය 2021 මැයි මස 26 වන වෙසක් පොහෝ දින ලෙස සලකා සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මගින් නිකුත් කරනු ලබන අයදුම්පත්‍ර තමා / තම සංවිධානය හෝ බාහිර පාර්ශවයක් මගින් හෝ පහත සඳහන් ලිපිනයට ඉදිරිපත් කළ යුතුව ඇත.

**සභාපති, බෞද්ධාලෝක ශත සංවත්සර ප්‍රණාම කමිටුව, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය, අංක 380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.**

**අයදුම්පත්‍ර ලබාගත හැකි ආකාරය**
**මූලස්ථාන කාර්යාලයෙන්, www.acbc.lk වෙබ් අඩවියෙන්,**
විද්‍යුත් තැපෑල මගින් - samithiacbc@gmail.com
**මුහුණ පොතට පිවිසීම මගින් - https://www.facebook.com/AllCeylonBuddhistCongress/**
වැඩි විස්තර - 0112 691 695 / සිරිනි 076 561 1374
ක්‍ෂාන්ති 071 864 5554

# රට දැය සුරකින අධිෂ්ඨාන පූජාව
# ජනගත කිරීම

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය හා ජාතික සංවිධාන ඒකාබද්ධ ක්‍රියාන්විතය සමග සංවිධානය කරනු ලැබූ රට දැය සුරකින අධිෂ්ඨාන පූජාව ජනගත කිරීමේ ආරම්භක වැඩසටහන 2022 අප්‍රේල් 30 වැනි දින පස්වරු 6.00ට බෙල්ලන්විල රජ මහා විහාරස්ථානයේදී බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතාගේ ප්‍රධානත්වයෙන් සහ බෞද්ධ සංවිධානවල සහභාගිත්වයෙන් පැවැත්විය. එහිදී විශේෂ අනුශාසනාවක් සිදුකරන ලද්දේ බෙල්ලන්විල රජමහා විහාරාධිපති පූජ්‍ය බෙල්ලන්විල ධම්මරතන ස්වාමීන් වහන්සේ විසින් වන අතර ඊට පසු අධිෂ්ඨාන පූජාව සවස 6.30ට ලබුනෝරුව වනසේනාසනාධිපති පූජ්‍ය කොත්මලේ කුමාර කාශ්‍යප ස්වාමීන් වහන්සේ විසින් පවත්වන ලදී. මීට සමගාමීව දිවයිනේ විහාරස්ථාන වල මෙම අධිෂ්ඨාන පූජාව මෙදින සිදු කරන්නට විය.








# බෞද්ධාලෝක වෙසක්
# ශ්‍රී බු.ව. 2566/2022
# කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ දී
# මැයි 15, 16 සහ 17 දිනවලදී

"ආරෝග්‍යා පරමා ලාභා" යන තේමාව මුල්කොට ගනිමින් තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ උතුම් වූ තෙමඟුල සිහිපත් කොට ලෝවැසි සියළු බෞද්ධයන් වෙසක් පොහෝ දිනය සමරන මේ අවස්ථාවේදී සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය 21 වැනි වතාවටත් අභිමානවත් අයුරින් බෞද්ධාලෝක වෙසක් උළෙල මෙවර සංවිධානය කරයි.

**මෙම උතුම් පිංකමේදී පසුගිය වසරවලදී මෙන්ම විශේෂ ක්‍රියාකාරකම් කිහිපයක් සිදුකරනු ලැබේ.**

- සර්වඥ ධාතූන් වහන්සේලා වන්දනාව
- සීල සමාදාන වැඩ සටහන
- උදාන ගී (භක්ති ගී)
- රාත්‍රි බත් දන්සල්
- චිත්‍ර ප්‍රදර්ශණය
- ආලෝක පූජාව
- අක්ෂි සහ පටක දන්දීමේ වැඩසටහන
- හෙළ ඔසු දන්සල




සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

අංක 380, බෞද්ධාලෝක මාවත, කොළඹ 7. දුර : 011 2691695 ෆැක්ස් : 011 2688 517 වෙබ් අඩවිය - www.acbc.lk



බෞද්ධාලෝකය®

ප්‍රකාශනය
**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07
දුරකථන: 011-2 691695/ 2 688517

**ජාත්‍යන්තර ග්‍රන්ථ හඳුනාගැනීමේ සංකේතය**
ISSSN 2613-8743
**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ලියාපදිංචි අංකය**
P 1567
තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංකය
QD/NEWS/21/2022

9 772613 874002